# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/37 - 2013 ජූලි මස 12 වැනි සිකුරාදා - 2013.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී -3/2013.

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වන ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 වන සහ 321 වන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජූලි මස 1 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

*නාමය*

1. මේ නියෝග 2013 වෙළඳ නැව් (පුහුණු කිරීම සහතික කිරීම සහ මුරකාවලෙහි යෙදීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ නියෝග, 2010 සංශෝධිත පරිදි වූ, 1978, මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ පුහුණු කිරීම, සහතික කිරීම සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කරනු ලබන අතර 2013 ජූලි මස 1 වන දින සිට බලාත්මක විය යුතුය.

2. (අ) 1998 ජූලි මස 17 වන දිනැති අංක 1036/21 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1998 වෙළඳ නැව් (පුහුණු කිරීම්, සහතික කිරීම් සහ මුරකාවලෙහි යෙදීමේ) නියෝග, 2013 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිච්ඡින්න කරනු ලැබේ.

(ආ) ඉහත සඳහන් විධිවිධාන වල කුමක් සඳහන්ව ඇත ද, 1998 ජූලි මස 17 වන දින අංක 1036/21 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1998 වෙළඳ නැව් (පුහුණු කිරීම්, සහතික කිරීම් සහ මුරකාවලෙහි යෙදීමේ) නියෝග වලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දින වන තෙක් සහතික නිකුත් කිරීම, පිටසන් කිරීම සහ නැවත වලංගු කිරීම කළ හැකිය.

3. 1980 වෙළඳ නැව් (නැවියන් සේවයේ නියුක්ත කිරීමේ සහ සේවා කොන්දේසි) නියෝග වල කුමක් සඳහන්ව ඇත ද පනතේ 333(ඈ) සමඟ කියවිය යුතු 139 වැනි වගන්තියෙන් නියමිත ආරක්ෂිත නාවික මෙහෙයුම් සම්බන්ධයෙන් වගකීම දරන අයිතිකරුවකු, සමාගමක් සහ නියෝජිත ආයතනයක් සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ විය යුතුය.


1A - PG 1684— 810 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*අර්ථ නිරූපනය*

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නියෝගවල

**'සමත් නැව්තට්ටු මුහුදු යාත්‍රාකරු'** යන්නෙන්, සම්මුතියේ 11/5 නියෝගවල විධිවිධානවලට අනුකූලව සුදුසුකම් ලැබූ නිලනොලත් නාවිකයකු අදහස් වේ.

**'සමත් ඇංජින් කාමර මුහුදු යාත්‍රාකරු'** යන්නෙන්, සම්මුතියේ 111/5 නියෝගයේ විධිවිධානවලට අනුකූලව සුදුසුකම්ලත් නිලනොලත් නාවිකයකු අදහස් වේ.

**'පනත'** යන්නෙන් 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත අදහස් වේ.

**'පරිපාලනය'** යන්නෙන් මෙම නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු වෙළඳ නැව් අධ්‍යක්‍ෂ ජනරාල්වරයා අදහස් වේ.

**'අනුමත කරන ලද'** යන්නෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ප්‍රධාන පරීක්‍ෂකයකු හෝ විසින් අනුමත කරන ලද බව අදහස් වේ.

**'අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම්'** යන්නෙන්, සම්මුතිය යටතේ සහතික සහ/ හෝ පිටසන් නිකුත් කිරීමේ කාර්යය සඳහා පරීක්ෂණ සහ ඇගයීම් ඇතුළුව, පුහුණු කිරීම් සහ ප්‍රමිති අවශ්‍යතා නියම කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ, මුහුදු යාත්‍රාකරුවන්ගේ පුහුණුව සහ අධ්‍යාපනය පිළිබඳ වැඩසටහනක් අදහස් වේ.

**'අනුමත වෛද්‍ය වෘත්තිකයා'** යන්නෙන්, මුහුදු යාත්‍රාකරුවන්ගේ වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන වෛද්‍ය වෘත්තිකයකු අදහස් වේ.

**'ප්‍රවීනතා සහතිකය'** යන්නෙන්, සම්මුතියේ II, III, IV හෝ VII වන පරිච්ඡේදවල විධිවිධාන වලට අනුකූලව නෞකාධිපතිවරුන්, නිලධරයන්, සහ GMDSS ගුවන්විදුලි ක්‍රියාකරුවන්ට නිකුත් කරනු ලබන්නා වූ සහ පිටසන් කරනු ලබන්නා වූ ද එය නීත්‍යානුකූලව දරන තැනැත්තාට එහි නිශ්චිතව සඳහන් වගකීම් තලවලට අදාළ කර්තව්‍ය ඉටු කිරීමට හිමිකම ලබා දෙන්නාවූ ද සහතිකයක් අදහස් වේ.

**'නිපුනතා සහතිකය'** යන්නෙන්, මුහුදු යාත්‍රාකරුවන්ගේ පුහුණුව, ප්‍රවීණතාව හෝ මුහුදු ගමන් සේවය පිළිබඳව සම්මුතියේ ඇතුළත් අදාළ නියමයන් සපුරා ඇති බවට එකී මුහුදු යාත්‍රාකරුවන්ට නිකුත් කරනු ලබන්නාවූද, ප්‍රවීනතා සහතිකයක් නොවන්නාවූ ද, සහතිකයක් අදහස් වේ.

**'රසායන ද්‍රව්‍ය නෞකාව'** යන්නෙන් ජාත්‍යන්තර තොග රසායන ද්‍රව්‍ය ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වැනි පරිච්ඡේදයේ ලැයිස්තුගත කොට ඇති යම් ද්‍රව නිෂ්පාදන තොග වශයෙන් ගෙන යාම සඳහා ඉදි කරන ලද හෝ සුදුසු ලෙස සකස් කරන ලද සහ භාවිත කරනු ලබන නෞකාවක් අදහස් වේ.

**'ප්‍රධාන ඉංජිනේරු නිලධරයා'** යන්නෙන්, නෞකාවේ යාන්ත්‍රික ප්‍රචලනය සහ එහි යාන්ත්‍රික හා විදුලි සවි කිරීම් ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම පිළිබඳව වගකිව යුතු ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධරයා අදහස් වේ.

**'ප්‍රධාන පරීක්ෂක'** යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන නෞකාධිපතිවරුන්ගේ හා නැව් තට්ටු අංශයේ නිලධරයන්ගේ ප්‍රධාන පරීක්ෂක හෝ ඇංජින් අංශයේ සේවක පිරිසේ ප්‍රධාන පරීක්ෂක හෝ අදහස් වේ

**'ප්‍රධාන උප නැව්පති'** යන්නෙන්, නිලයෙන් නෞකාධිපතිවරයාට සමීපතම පහළ නිලය දරන්නා වූද නෞකාධිපතිවරයාගේ අශක්නුතාවයකදී නෞකාවේ අණ දීම, පාලනය සහ භාරය පැවරෙන්නා වූද නැව් තට්ටු නිලධරයා අදහස් වේ.

**'වෘත්තීමය ආචාර ධර්ම පද්ධතිය'** යන්නෙන් මුහුදු යාත්‍රාකරුවන්ගේ සමුද්‍රිය අධ්‍යාපන, වැඩසටහන් පුහුණුව ඇගයීම සහ සහතික නිකුත් කිරීමේ නියමයන් පිළිබඳ ඇතුලත් වූ ද අදාළ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද්දා වූ ද අවශ්‍ය වූ පරිදි සංශෝධනය කළ හැකි වූ ද, අනුමත මග පෙන්වීමේ ලේඛනයක් හෝ අත්පොතක් අදහස් වේ.

**'සමාගම'** යන්නෙන්, නෞකාවේ අයිතිකරු හෝ, අයිතිකරුගෙන් නෞකාව මෙහෙයවීමේ වගකීම පවරාගනු ලැබුවා වූ ද, එසේ වගකීම පවරාගැනීමෙන් පසුව මේ නියෝග මගින් සමාගම වෙත නියම කරනු ලැබ ඇති සියලු කාර්යය සහ වගකීම් භාරගැනීමට එකඟවී ඇත්තා වූ ද, කළමනාකරුවකු හෝ ආවරණ රහිත බෝට්ටු 'චාටර් ක්‍රමයට' කුලියට දෙන තැනැත්තකු හෝ එවැනි වෙනත් සංවිධානයක් නැතහොත් තැනැත්තෙක් අදහස් වේ.

**'සම්මුතිය'** යන්නෙන්, 1984 අප්‍රේල් 28 වන දින බලාත්මක භාවයට පත් වූ ද 1978 ජූලි මස 7 වන දින, මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීම සහ සහතික නිකුත් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී සම්මත කරගනු ලැබූවා වූ ද, 1978 මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ පුහුණු කිරීම, සහතික කිරීම හා මුරකාවලෙහි යෙදීමේ පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (STCW) සහ පසුකාලීනව එයට කරනු ලබන සියලු සංශෝධන ද අදහස් වේ.

**'අන්තරායදායක නැව් බඩු '** යන්නට

(අ) බොර පෙට්රෝලියම් හෝ ඒවායේ තොග ස්වරූපයේ වූ යම් අතුරු නිෂ්පාදනයක් ;

(ආ) ජාත්‍යන්තර, වායු ප්‍රවාහනය කිරීමේ ව්‍යවස්ථා සංග්‍රහයේ 19 වන පරිච්ඡේදයේ ලැයිස්තු ගතකොට ඇති යම් ද්‍රවීකරණය කළ වායු හෝ වෙනත් නිෂ්පාදනයක් ; සහ

(ඇ) ජාත්‍යන්තර තොග රසායනික ද්‍රව්‍ය ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන පරිච්ඡේදයේ ලැයිස්තුගත කොට ඇති කවර හෝ ද්‍රව නිෂ්පාදනයක්, ඇතුළත් වේ.

**'නැව් තට්ටු නිලධරයා'** යන්නෙන් 2010 සංශෝධනය කර ඇති පරිදි වූ, සම්මුතියේ II වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව සුදුසුකම් ලද යාත්‍රාකරණ නිලධරයකු අදහස් වේ.

**'නැව් තට්ටුභාර ආධුනික නිලධරයා'** යන්නෙන්, නැව් තට්ටු නිලධරයකු වීමට පුහුණුව ලබන තැනැත්තා අදහස් වේ.

**'අධ්‍යක්‍ෂ ජනරාල්වරයා'** යන්නෙන් වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

**'ලේඛනගත සාක්ෂි'** යන්නෙන් සම්මුතියේ අදාළ නියමයන් සපුරා ඇති බව ස්ථාපිත කිරීම සඳහා භාවිත කරනු ලබන්නා වූ ද ප්‍රවීණතා සහතික හෝ නිපුණතා සහතික නොවන්නා වූ ද යම් ප්‍රලේඛන අදහස් වේ.

**'ඩ්‍රෙජර් යාත්‍රාව'** යන්නෙන් ඇලවල් සහ වරායවල් ගැඹුරට කැණීම සඳහා ද, මාළු අයින් සහ වැටි ආදී ජලය යට ඇති බාධක ඉවත් කිරීම සඳහා යොදවා ගනු ලබන්නා වූ ද කැණීමේ උපකරණ සවි කර ඇත්තා වූ ද යාන්ත්‍රිකව ප්‍රචලනය කරනු ලබන යාත්‍රාවක් අදහස් වේ.

**'විද්‍යුත්-කාර්මික නිලධරයා'** යන්නෙන්, සම්මුතියේ III/6 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව සුදුසුකම් ලැබූ නිලධරයකු අදහස් වේ.

**'විද්‍යුත්-කාර්මික නිලනොලත් නැවියා'** යන්නෙන්, සම්මුතියේ III/7 වන නියෝගයේ විධිවිධාන වලට අනුකූලව සුදුසුකම් ලැබූ නිල නොලත් නාවිකයකු අදහස් වේ.

**'පිටසන'** යන්නෙන්, මෙම නියෝගවල නිශ්චිතව සඳහන් සීමා කිරීම්වලට යටත්ව, අවස්ථාවෝචිත පරිදි නෞකාධිපතිවරයාගේ හෝ යම්නිලධරයකුගේ හෝ කාර්යයන් කරගෙන යාම සඳහා එය දරන්නාට අවසර ප්‍රදානය කරමින්, යම් සහතිකයක් නිකුත් කිරීම සහතික කිරීම හෝ යම් සහතිකයක් පිළිගැනීම හෝ අදහස් වේ.

**'ඉංජිනේරු නිලධරයා'** යන්නෙන්, සම්මුතියේ III වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව සුදුසුකම් ලද නිලධරයකු අදහස් වේ.

**'ආධුනික ඉංජිනේරු නිලධරයා'** යන්නෙන් ඉංජිනේරු නිලධරයකු වීම සඳහා පුහුණුව ලබන තැනැත්තෙකු අදහස් වේ.

**'පරීක්ෂකවරයා'** යන්නෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන, නෞකාධිපතිවරුන්ගේ සහ නැව් තට්ටු අංශයේ සේවක පිරිසගේ හෝ ඇංජින් අංශයේ සේවක පිරිසගේ පරීක්ෂකවරයකු අදහස් වේ.

**'ධීවර නෞකාව'** යන්නෙන් මුහුදේ දී මසුන් හෝ වෙනත් ජීව සම්පත් අල්ලා ගැනීම සඳහා භාවිත කරනු ලබන නෞකාවක් අදහස් වේ.

**'කර්තව්‍ය'** යන්නෙන්, නෞකාවක් මෙහෙයවීම, මුහුදේ දී ජීවිත ආරක්ෂාව, සහ සාගර පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන බවට STCW ව්‍යවස්ථා සංග්‍රහයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති වැඩ, කාර්ය සහ වගකීම් සමූහය අදහස් වේ.

**'GMDSS '** යන්නෙන්, විශ්ව සමුද්‍රීය ආපදා සහ ආරක්ෂක ක්‍රම පද්ධතිය අදහස් වේ.

**'GT '** යන්නෙන්, දළ ටොන් ප්‍රමාණය අදහස් වේ.

**'ජාත්‍යන්තර නීත්‍යානුකූල ලේඛන'** යන්නෙන්, ජාත්‍යන්තර සම්මුතිවල පාර්ශවකරුවකු ලෙස, මුහුදේදී ජීවිත ආරක්‍ෂාව සහ සාගර දූෂණය වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව විසින් පනවා ඇති විධිවිධාන අදහස් වේ

**'ජාත්‍යන්තර යාත්‍රාකරණ'** යන්නෙන් වෙරළාසන්න යාත්‍රාකරණ නොවන්නා වූ නැව් මගින් කරනු ලබන වෙනත් යාත්‍රාකරණ අදහස් වේ.

**'ISPS සංග්‍රහය'** යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය මගින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වූද, 1974 මුහුදේදී ජීවිත ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ (SOLAS) ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ සමුළුවේ 2 වන යෝජනා සම්මතය මගින්, 2002 දෙසැම්බර් 12 වන දින සම්මත කරනු ලැබූ ජාත්‍යන්තර නෞකා සහ වරාය පහසුකම් ආරක්ෂක (ISPS) සංග්‍රහය අදහස් වේ.

**'ද්‍රවකෘත වායු නෞකාව'** යන්නෙන්, ජාත්‍යන්තර වායු ප්‍රවාහනය කිරීමේ ව්‍යවස්ථා සංග්‍රහයේ 19 වැනි පරිච්ඡේදයේ ලැයිස්තුගතකොට ඇති යම් ද්‍රවකෘත වායුවක් හෝ වෙනත් යම් නිෂ්පාදනයක් තොග වශයෙන් ගෙනයාම සඳහා ඉදි කරන ලද හෝ සුදුසු ලෙස සකස් කර ලද සහ භාවිත කරනු ලබන නෞකාවක් අදහස් වේ.

**'නෞකාධිපති '** යන්නෙන්, නෞකාවක අණ දීම සහ පාලනය භාරව සිටින තැනැත්තා අදහස් වේ.

**'මාසය'** යන්නෙන්, ලිත් මාසයක් හෝ එක් මාසයකට අඩු කාල පරිච්ඡේදවලින් සෑදුනු දින 30ක් අදහස් වේ.

**'වෙරළාසන්න මුහුදු ගමන් '** (NCV) යන්නෙන්, පරිපාලනය විසින් තීරණය කරනු ලබන පරිදි මුහුදු ගමන් වලදී ආරක්ෂිත නැව් තොටවල සමීපත්වය සම්බන්ධයෙන් විශේෂිතව සඳහන් කොට දැක්වීමට යටත්ව බංගලාදේශය, ඉන්දියාව, මාලදිවයින, මියන්මාර් සහ ශ්‍රී ලංකාව යන රටවල යම් වරායක හෝ ස්ථානයක සිට එකී රටවල වෙනත් යම් වරායකට හෝ ස්ථානයකට මුහුදුබඩ වෙළඳාමේ යෙදී සිටින නෞකාවල මුහුදු ගමන් අදහස් වේ.

**'නිලධරයා'** යන්නෙන්, ජාතික නීතිය හෝ නියෝග අනුව එවැන්නකු ලෙස නම් කරනු ලබන්නා වූ ද එසේ නම්කර නොමැති අවස්ථාවක දී සාමූහික එකඟත්වය හෝ සිරිත් අනුව නම් කරනු ලබන්නාවූද, නෞකාධිපති හැර, නාවික පිරිසේ සාමාජිකයෙකු අදහස් වේ.

**'තෙල් නෞකාව'** යන්නෙන්, පෙට්‍රෝලියම් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන තොග වශයෙන් ගෙනයාම සඳහා ඉදි කරන ලද හෝ භාවිත කරනු ලබන නෞකාවක් අදහස් වේ.

**'සංවිධානය'** යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ.

**'මඟී නෞකාව'** යන්නෙන්, සංශෝධිත පරිදි වූ 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව (SOLAS) සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ නිර්වචනය කොට ඇති පරිදි වූ මඟී නෞකාවක් අදහස් වේ.

**'ප්‍රචලන බලය'** යන්නෙන්, නෞකාවේ ලියාපදිංචි කිරීමේ නිල සහතිකයේ හෝ වෙනත් නිල ලේඛනයක හෝ දැක්වෙන, නෞකාවක සියලුම ප්‍රධාන ප්‍රචලන යන්ත්‍රවලට අයත්, කිලෝවොට් මගින් දැක්වෙන, මුළු උපරිම අඛණ්ඩ සීඝ්‍රතා ප්‍රතිදාන බලය අදහස් වේ.

**'ගුවන් විදුලි රාජකාරි '** යන්නට, අදාළවන පරිදි ගුවන් විදුලි නියෝග, සංශෝධිත පරිදි වූ මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වූ (1974 SOLAS) ජාත්‍යන්තර සම්මුතිය, සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ අදාළනිර්දේශ ද අනුව පවත්වා ගෙන යනු ලබන මුරකාවලෙහි යෙදීම, කාර්මික නඩත්තුව සහ අළුත්වැඩියා කිරීම ඇතුළත් වේ.

**'ගුවන් විදුලි ක්‍රියාකරු'** යන්නෙන්, ගුවන් විදුලි නියෝගවල විධිවිධාන යටතේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන හෝ පිළිගනු ලබන උචිත සහතිකයක් දරන තැනැත්තෙකු අදහස් වේ.

**'ගුවන් විදුලි නියෝග'** යන්නෙන්, ජාත්‍යන්තර විදුලි සංදේශ සම්මුතියට ඇමුණුමක් වශයෙන් ඇති ගුවන්විදුලි නියෝග අදහස් වේ.

**'නිල නොලත් නාවිකයකු'** යන්නෙන්, නෞකාධිපති හෝ නිලධරයකු හෝ නොවන, නෞකාවේ නාවික පිරිසේ හෝ යම් සාමාජිකයෙකු අදහස් වේ.

**'නියෝග'** යන්නෙන්, 2013 වෙළඳ නැව් (පුහුණු කිරීම, සහතික කිරීම සහ මුරකාවලෙහි යෙදීම) නියෝග අදහස් වේ.

**'රෝ-රෝ මගී නෞකාව'** යන්නෙන්, සංශෝධිත පරිදි වූ 1974 ජීවිත ආරක්‍ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ (SOLAS), අර්ථ නිරූපනය කර ඇති පරිදි රෝ-රෝ නැව් බඩු සඳහා අවකාශ සහිත වූ හෝ විශේෂ වර්ගයේ අවකාශ සහිත, මගී නෞකාවක් අදහස් වේ.

**'මුහුදු ගමන් සේවාව'** යන්නෙන්, සහතිකයක් නිකුත් කිරීම හෝ නැවත වලංගු කිරීම හෝ වෙනත් සුදුසුකමක් හෝ සම්බන්ධයෙන් අදාළ වන, මුහුදු ගමනේ යෙදෙන නෞකාවක නෞකාස්ථ සේවය අදහස් වේ.

**'මුහුදු ගමන් නෞකාව'** යන්නෙන්, රට අභ්‍යන්තර ජලාශයන්ට සීමාවී හෝ ආරක්ෂිත ජලාශ හෝ වරාය නියෝග අදාළවන ප්‍රදේශ ඇතුළත හෝ ඒවාට තදාසන්න වූ ජලාශවලට සීමාවී යාත්‍රාකරණයේ යෙදෙන නෞකා නොවන්නා වූ වෙනත් වාණිජ නෞකා අදහස් වේ.

**'දෙවන ඉංජිනේරු නිලධරයා'** යන්නෙන්, නිලයෙන් ප්‍රධාන ඉංජිනේරු නිලධරයාට සමීපතම පහළ නිලය දරන සහ ප්‍රධාන ඉංජිනේරු නිලධරයාගේ අශක්නුතාවයක දී නෞකාවේ යාන්ත්‍රික ප්‍රචලනය සහ යාන්ත්‍රික සහ විදුලි සවි කිරීම පිළිබඳ ක්‍රියාකාරිත්වය හා නඩත්තුව සම්බන්ධයෙන් වගකීම පැවරෙන ඉංජිනේරු නිලධරයා අදහස් වේ.

**'ආරක්ෂක කාර්ය'** යන්නෙන්, සංශෝධිත පරිදි වූ 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව (SOLAS) සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ XI-2 පරිච්ඡේදයේ සහ ජාත්‍යන්තර නෞකා සහ වරාය පහසුකම් ආරක්ෂණ (ISPS) ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්වචනය කොට ඇති පරිදි වූ නෞකාස්ථ සියලු ආරක්ෂක වැඩ සහ කාර්ය ඇතුළත් වේ.

**'නෞකා ආරක්ෂක නිලධරයා'** යන්නෙන්, නෞකාවේ ආරක්ෂක සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමට ද, සමාගම් ආරක්ෂක නිලධරයා සහ වරාය පහසුකම් ආරක්ෂක නිලධරයන් සමග සම්බන්ධීකරණය වී කටයුතු කිරීම ද ඇතුලුව නෞකාවේ ආරක්ෂාව පිළිබඳව වගකිව යුතු තැනැත්තා ලෙස සමාගම විසින් නම් කරන ලද්දාවූද නෞකාධිපතිවරයාට වගකිව යුතු වූ ද නෞකාස්ථ තැනැත්තා අදහස් වේ.

**' STCW ව්‍යවස්ථා සංග්‍රහය'** යන්නෙන්, 1978 පුහුණු කිරීම, සහතික කිරීම සහ මුරකාවලෙහි යෙදීම පිළිබඳ ප්‍රමිතිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර සම්මුතියේ පාර්ශවකරුවන් විසින් 2010 දී පැවැත්වූ සාකච්ඡාවේදී මුහුදු යාත්‍රාකරුවන්ගේ පුහුණු කිරීම්, සහතික කිරීම්, සහ මුරකාවලෙහි යෙදීම් (STCW) පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අදහස් වේ.

**'විදුලි සංදේශ නියාමන කොමිසම'** යන්නෙන්, ගුවන් විදුලි නියෝගවලට වගකිව යුතු වූද, 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවනු ලැබුවා වූ ද අධිකාරිය අදහස් වේ.

**'වාණිජ නෞකාව'** යන්නෙන්, නැව් බඩු, මගීන් හෝ ගොවිපොළ සතුන් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරනු ලබන මුහුදු ගමනේ යෙදුනු නෞකාවක් අදහස් වේ.

**'ටග් යාත්‍රාව'** යන්නෙන්, නැව් බඩු සඳහා සුළු ඉඩ ප්‍රමාණයක් ඇති හෝ එවැනි ඉඩ ප්‍රමාණයක්වත් නොමැති වූ ද වරායවලට, ගංගාවලට හෝ නැව් තටාකවලට හෝ ඒවායින් පිටතට මුහුදේ ඇති නෞකා ඇදගෙන ඒම හෝ එම නෞකාවලට සහායවීම සඳහා හෝ බත්තල්, පාරු හෝ වෙනත් කුඩා යාත්‍රා ඇදගෙන යාම හෝ තල්ලු කිරීම සඳහා උපයෝගි කරගනු ලබන්නා වූ ද යාන්ත්‍රිකව ප්‍රචලනය කරනු ලබන නෞකාවක් අදහස් වේ.

**'විශ්ව විද්‍යාල පනත'** යන්නෙන්, 1978 අංක 16 දරන ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පනත අදහස් වේ.

*අදාළවීම*

5. (1) මේ නියෝග -

(අ) ශ්‍රී ලංකාවේ ධජය යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද ධීවර නෞකා සහ විනෝද යාත්‍රා නොවන්නා වූද සියලු මුහුදු ගමන් නෞකාවලට ;

(ආ) අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ අඛණ්ඩ නිදහස් කිරීමේ සහතිකය හෝ ප්‍රවීණතා සහතිකය හෝ පිටසන් කිරීමක් හෝ වෙනත් යම් සහතිකයක් හෝ ලේඛනයක් සතුව ඇති සියලු මුහුදු යාත්‍රාකරුවන්ට ; සහ

(ඇ) අනෙකුත් ධජ ඇති නෞකා සහ මෙම නියෝග යටතේ විදේශීය අඛණ්ඩ නිදහස් කිරීමේ සහතික, ප්‍රවීණතා සහතික, පිටසන් කිරීම් හෝ වෙනත් යම් සහතික හෝ ලේඛන සතුව ඇති මුහුදු යාත්‍රාකරුවන්ට අදාළ විය යුතු ය.

(2) මේ නියෝග මගින්, අදාළවන පරිදි මේ නියෝගයේ 'අ' උපලේඛනයේ සහ 'ආ' උපලේඛනයේ දක්වා ඇති කර්තව්‍යයන්ට පදනම්ව සහ වගකීම් තල වලදී, ප්‍රවීණතා පිළිබඳ මට්ටම ස්ථාපිත කරනු ලැබේ.

## 'අ' උපලේඛනය

### *කර්තව්‍ය*

1. යාත්‍රා කරණය.
2. නැව් බඩු එහා මෙහා ගෙනයාමට අදාළ කටයුතු කිරීම සහ ගබඩා කිරීම.
3. නැවේ ක්‍රියාකාරීත්වය පාලනය කිරීම සහ නෞකාස්ථ තැනැත්තන්ට රැකවරණය සැපයීම.
4. සමුද්‍ර ඉංජිනේරු ශිල්පීය කටයුතු.
5. විදුලි, විද්‍යුත් හා පාලන ඉංජිනේරු ශිල්පීය කටයුතු.
6. නඩත්තුව සහ අළුත්වැඩියාව.
7. ගුවන් විදුලි සංනිවේදන.

## 'ආ' උපලේඛනය

### *වගකීම් තල*

(1) කළමනාකරණ තලය (නෞකාධිපති, ප්‍රධාන උප නැව්පති, ප්‍රධාන ඉංජිනේරු, දෙවැනි ඉංජිනේරු).

(2) මෙහෙයුම් තලය (යාත්‍රාකරණමුරකාවලෙහි යෙදෙන නිලධරයා සහ ඉංජිනේරු මුරකාවලෙහි යෙදෙන නිලධරයා, විද්‍යුත් කාර්මික නිලධරයා සහ ගුවන් විදුලි ක්‍රියාකරු).

(3) සහාය /ආධාරක තලය (සමත් නැව් තට්ටු මුහුදු යාත්‍රාකරු, සමත් ඇංජින් කාමර මුහුදු යාත්‍රාකරු, විද්‍යුත් - කාර්මික නිල නොලත් නැවියා, සහ මුරකාවලෙහි නියුතු නිල නොලත් නැවියා).

*අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය භාරය*

6. තත්කාලයේ බලපවත්වන ශ්‍රී ලංකාවේ නීති පද්ධති රාමුව තුළ මෙම නියෝග ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් වගකිව යුතු අතර සම්මුතිය යටතේ ප්‍රවීණතා සහ පිටසන් සහතික නිකුත් කළ හැකිවන්නේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාට පමණි.

*විවිධ පන්තිවලට අයත් සහතික සහ පිටසන් කිරීම්*

7. (1) මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ කොන්දේසිවලට යටත්ව අධ්‍යක්‍ෂජනරාල්වරයා විසින් නැව් තට්ටු අංශයේ පහත සඳහන් පන්තිවලට අයත් සහතික සහ පිටසන් කිරීම් නිකුත් කරනු ලැබිය යුතුය.

*ප්‍රවීණතා සහතික*

(අ) ප්‍රවීණතා සහතිකය-නෞකාධිපති ;

(ආ) ප්‍රවීණතා සහතිකය - ප්‍රධාන උප නැව්පති ;

(ඇ) ප්‍රවීණතා සහතිකය - මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධාරයා ;

(ඈ) ප්‍රවීණතා සහතිකය - වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන දළ ටොන් 3,000 අඩු නෞකාවල නෞකාධිපති ;

(ඉ) ප්‍රවීණතා සහතිකය- වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන දළ ටොන් 3,000 අඩු නෞකාවල ප්‍රධාන උප නැව්පති ;

(ඊ) ප්‍රවීණතා සහතිකය - වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන දළ ටොන් 3,000 අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවල කාර්යභාර නිලධරයා ;

(උ) ප්‍රවීණතා සහතිකය- වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන දළ ටොන් 5,00 අඩු නෞකාවල නෞකාධිපති ;

(ඌ) ප්‍රවීණතා සහතිකය - වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන (NCV) දළ ටොන් 500ට අඩු නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවලක කාර්ය භාර නිලධාරියා ;

(එ) නිලනොලත් නැවියන් සඳහා වූ සහතිකය- දළ ටොන් 500ක හෝ ඊට වැඩි, මුහුදු ගමන්වල යෙදෙන නෞකාවක් මත යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියකු ;

(ඒ) සමත් නැව් තට්ටු මුහුදු යාත්‍රාකරු - මුහුදු ගමන්වල යෙදෙන දළ ටොන් 500 ක් හෝ ඊට වැඩි නෞකාවක සේවයේ යෙදී සිටින සමත් නැව්තට්ටු මුහුදු යාත්‍රාකරු.

*පිටසන් කිරීම්*

(ඔ) වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV)යෙදෙන දළ ටොන් 3,000ට අඩු නෞකාවලට සීමා වූ නෞකාධිපතිවරුන් සඳහා පිටසන් කිරීම ;

(ඕ) වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV)යෙදෙන දළ ටොන් 3,000ට අඩු නෞකාවලට සීමා වූ ප්‍රධාන උප නැව්පති සඳහා පිටසන් කිරීම ;

(ක) වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන දළ ටොන් 500ට අඩු නෞකාවලට සීමා වූ නෞකාධිපතිවරුන් සඳහා පිටසන් කිරීම.

(2) නැව් තට්ටු නිලධරයන් සම්බන්ධයෙන් වනවිට මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති නියමයන්ට යටත්ව අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින්.

(අ) (ආ) ප්‍රවීණතා සහතික මත (ඔ) පිටසන් කළ යුතුය ;

(ආ) (ඇ) ප්‍රවීණතා සහතික මත (ඕ) සහ (ක) පිටසන් කිරීම ;

(ඇ) (ඉ) ප්‍රවීණතා සහතික මත (ක) පිටසන් කිරීම.

එසේවුවද, පිටසන් කිරීමක් දරන සෑම නැව් තට්ටු නිලධරයකුටම, වඩා උසස් සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබූ විට එම සහතිකයට එම පිටසන් කිරීම මාරු කරවා ගැනීමට හිමිකම් තිබිය යුතුය.

(3) ගුවන් විදුලි සංදේශ හා ගුවන් විදුලි කාර්ය මණ්ඩල පිටසන් කිරීම -

(1) පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් ගුවන් විදුලි කාර්ය සම්බන්ධයෙන් පහත දැක්වෙන පන්තිවල පිටසන් කිරීම්, නිකුත් කළ හැකිය :-

(අ) විදුලිසංදේශ නියාමන කොමිසම හෝ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාට පිළිගත හැකි වෙනත් යම් සුදුසු අධිකාරියක් හෝ විසින් නිකුත් කරනු ලබන GMDSS ගුවන් විදුලි ක්‍රියාකරු සහතික පිටසන් කිරීම.

(ආ) විදුලිසංදේශ නියාමන කොමිසම නිකුත් කරනු ලබන GMDSS සීමිත ගුවන්විදුලි ක්‍රියාකරු සහතික පිටසන් කිරීම.

(2) ඉහත දැක්වෙන පරිදි පිටසන් කිරීම නොකළහොත්, GMDSS සහතික ශ්‍රී ලංකා නැව්වල සේවය සඳහා වලංගු නොවේ.

(4) මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ කොන්දේසිවලට යටත්ව අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් ඉංජිනේරු අංශයේ පහත සඳහන් පන්තිවලට අයත් සහතික සහ පිටසන් කිරීම් නිකුත් කරනු ලැබිය යුතුය :-

*ප්‍රවීණතා සහතික*

(අ) ප්‍රවීණතා සහතිකය- ප්‍රධාන ඉංජිනේරු නිලධරයා ;

(ආ) ප්‍රවීණතා සහතිකය- දෙවැනි ඉංජිනේරු නිලධරයා ;

(ඇ) ප්‍රවීණතා සහතිකය- ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධාරයා ;

(ඈ) ප්‍රවීණතා සහතිකය- වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන කිලෝවොට් 750ත් 3,000ත් අතර ප්‍රචාලන බලය සහිත නෞකාවලට සීමා වූ ප්‍රධාන ඉංජිනේරු නිලධරයා ;

(ඉ) ප්‍රවීණතා සහතිකය- වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන කිලෝවොට් 750ත් 3,000ත් අතර ප්‍රචාලන බලය සහිත නෞකාවලට සීමා වූ දෙවැනි ඉංජිනේරු නිලධරයා ;

(ඊ) ප්‍රවීණතා සහතිකය වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන කිලෝවොට් 750ත් 3,000ත් අතර ප්‍රචාලන බලය සහිත නෞකාවලට සීමා වූ ඉංජිනේරු මුරකාවලක කාර්ය භාර නිලධාරයා ;

(උ) නිල නොලත් නැවියන් සඳහා වූ සහතිකය- ඇංජින් කාමර මුරකාවලෙහි කොටසක් වූ නිල නොලත් නැවියන් ;

(ඌ) විද්‍යුත් කාර්මික නිලධරයා ;

(එ) සමත් එංජින් කාමර මුහුදු යාත්‍රාකරු ;

(ඒ) විද්‍යුත් කාර්මික නිලනොලත් නැවියා.

*පිටසන් කිරීම*

(ඔ) වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV)යෙදෙන කිලෝවොට් 750ත් 3,000ත් අතර ප්‍රචාලන බලය ඇති නෞකාවලට සීමා වූ ඉංජිනේරු නිලධරයා වශයෙන් යාත්‍රාකරණය සඳහා පිටසන් කිරීම.

(ඕ) වෙරළාසන්න මුහුදු ගමන්වල (NCV) යෙදෙන කිලෝවොට් 750ත් 3,000ත් අතර ප්‍රචාලන බලය ඇති නෞකාවලට සීමාවූ දෙවැනි ඉංජිනේරු නිලධරයා වශයෙන් යාත්‍රාකරණය සඳහා පිටසන් කිරීම ඃ

ඉංජිනේරු නිලධරයන් සම්බන්ධයෙන් වනවිට මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති නියමයන්ට යටත්ව අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් -

(i) (ඔ) පිටසන් කිරීම (ආ) ප්‍රවීණතා සහතික මත සිදු කිරීම ;

(ii) (ඕ) පිටසන් කිරීම (ඇ) ප්‍රවීණතා සහතිකය මත සිදු කිරීම ;

එසේවුවද, පිටසන් කිරීමක් දරන සෑම ඉංජිනේරු නිලධරයෙකුටම, වඩා උසස් සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබූ විට එම සහතිකයට එම පිටසන් කිරීම මාරු කරවා ගැනීමට හිමිකම් තිබිය යුතුය.

කරනු ලැබිය යුතුය ඃ

*නිපුණතා සහතිකය*

(5) පරිපාලනය විසින්, මේ නියෝග යටතේ සඳහන් කොට ඇති අදාළ නියමයන්ට යටත්ව, මුහුදු යාත්‍රාකරුවන්ට, නියම කරනු ලබන පරිදි වූ නිපුනතා සහතික නිකුත් කරනු ලැබිය හැකිය. II, III, V/1-1 සහ V/1-2 යන පරිච්ඡේද යටතේ නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ නිල නොලත් නැවියන්ට නිපුනතා සහතික නිකුත් කළ යුත්තේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පමණි. වෙනත් නියෝග යටතේ නිපුනතා සහතික නිකුත් කිරීම අනුමත පුහුණු ආයතන වලට පවරනු ලැබිය හැකිය.

*ඇතුළත්වීමේ කොන්දේසි සහ අවශ්‍ය සුදුසුකම්*

*නිලධාරීහු සහ නිලනොලත් නැවියෝ*

8. (1) ප්‍රවීණතා සහතිකයක් හෝ පිටසනක් හෝ සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතු ය :-

(අ) උප්පැන්න සහතිකය

(ආ) ඔහු දරන තනතුරට අදාළ වූ සහ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා අනුමත කරන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් කරනු ලැබ නිකුත් කරන ලද, ඇස් දෘෂ්ටි ප්‍රමිති පිරික්සුම් සහතිකයක් ; එම පරීක්ෂණය, සම්මුතියේ A-1/9 වගුවේ නිශ්චිතව සඳහන් ප්‍රමිති විශේෂත්වයට අනුකූලව කරනු ලැබිය යුතු ය.

(ඇ) ඔහු දරන තනතුරට අදාළවූ සහ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් එවැනි පරික්ෂාවක් කිරීම සඳහා අනුමත කරන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් කරන ලද පරික්ෂාවකින් පසු නිකුත් කරනු ලැබූවාවූ, වෛද්‍යමය සහ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සහතිකයක්; එම පරීක්ෂණය සම්මුතියේ B-1/9 වගුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූලව කරනු ලැබිය යුතුය.

(ඈ) නිලධාරීන් සම්බන්ධයෙන් වූ විට, අයදුම් කිරීමේ දිනට ලබාගත්, පෙර නෞකාස්ථ කාර්ය තුළ චරිතය, මනා හැසිරීම, සංවරශීලී බව, පළපුරුද්ද හා හැකියාව පිළිබඳ සහතික ; ප්‍රධාන පරීක්ෂකවරයා වෙනත් අයුරකින් අවසර දෙන්නේ නම් හැර, එබඳු සහතික එකී සේවය ඉටුකරනු ලැබුවේ යම් නැවක නෞකාස්ථව සිටියදී ද, එකී නැවේ නෞකාධිපති හෝ ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ එම නැවෙහි බලය ලත් සමාගම් නියෝජිතයා හෝ විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) සුදුසුකම් ලබන සේවය හෝ පුහුණුව ඩ්‍රෙජර් යාත්‍රා, පර්යේෂණ යාත්‍රා, මුක්තාවශේෂ යාත්‍රා සහ ටග් යාත්‍රා වැනි වාණිජ නොවන නෞකා වල කර ඇති අවස්ථාවක, ඔවුන්ගේ සහතික එවැනි යාත්‍රාවල සේවයට පමණක් සීමා කිරීම කරනු ලැබිය හැකිය.

(3) සම්පූර්ණ නැව් බඩු ප්‍රමාණය හෝ කොටසක් අවදානම් සහිත නැව් බඩුයයි විශේෂ කොට දක්වා ඇති නෞකාවල හෝ රෝ-රෝ මගී යාත්‍රාවල හෝ මගී නෞකාවල හෝ සේවය කරන නැව්පතියන්, නැව් තට්ටු නිලධාරීන්, ඉංජිනේරු නිලධාරීන් සහ නිලනොලත් නැවියන්, අදාළ ප්‍රවීණතා සහතික සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය සුදුසුකම්වලට අමතරව මෙහි ඇතුළත් 12 හෝ 13 වන නියෝගවල විශේෂිත කොට දක්වා ඇති අතිරේක නියමයන් සපුරාලිය යුතුය.

*නැව් තට්ටු අංශයෙහි නෞකාධිපතිවරුන්ගේ, නිලධරයන්ගේ සහ නිලනොලත් නැවියන්ගේ පුහුණුව සහ සුදුසුකම් සඳහා අනිවාර්ය අවම අවශ්‍යතා.*

9. (1) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාරව සිටින නිලධරයකු වශයෙන් සහතිකයක් නිකුත් කරවා ගැනීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ කරන දිනට, වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය ;

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/I වගන්තියේ නියමයන් සපුරාලන්නා වූ යම් අනුමත පුහුණු වැඩ සටහනක කොටසක් ලෙස, මාස 12කට නොඅඩු කාලයක්, නෞකාස්ථ පුහුණුව අනුමත වාර්තා පොතක ලේඛනගත කරන්නාවූ දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල, නැව් තට්ටු අංශයේ, අනුමත මුහුදු සේවය තිබිය යුතුය. නැතහොත් මාස 36කට නොඅඩු අනුමත මුහුදු සේවයක් තිබිය යුතුය හෝ වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු දළ ටොන් 3000ට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධාරියකු ලෙස ප්‍රවීණතා සහතිකය ලැබීමෙන් පසු මාස 12ක අනුමත මුහුදු ගමන් සේවාව සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) නියමිත මුහුදු ගමන් සේවා තුළදී නෞකාධිපතිවරයකුගේ හෝ සුදුසුකම් ලත් නිලධරයකුගේ අධීක්ෂණය යටතේ, මාස 6කට නොඅඩු කාලයක් පාලම් මුරකාවල් කාර්යය ඉටුකර තිබිය යුතුය.

(ඇ) ප්‍රවීනතා සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා, පෞද්ගලික ආරක්ෂාව සහ සාමාජීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුනතා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), උසස් ගිනි නිවීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), සාමාන්‍ය ක්‍රියාකරු සහතිකය (GMDSS) සහ නැව් ආරක්ෂක නිලධරයා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව), පිළිබඳ අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය ; සහ

(ඉ) STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-ii/1 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරාලමින් සහ අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කර තිබිය යුතුය.

(2) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති වශයෙන් ප්‍රවීනතා සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවක යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු වශයෙන් ප්‍රවීනතා සහතිකයක් දැරිය යුතුය

(ආ) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු වශයෙන් මාස 12කට නොඅඩු කාලයක් අනුමත මුහුදු ගමන් සේවාවක් තිබීම. මෙකී කාලයෙන් මාස 06කට නොඅඩු කාලයක්, දළ ටොන් 3000ක් හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධාරියකු වශයෙන් ඉටුකළ අනුමත මුහුදු ගමන් සේවාවකින් සමන්විත විය යුතුය.

(ඇ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-2 වගුවේ නිශ්චිතව සඳහන් පරිදි වෛද්‍ය උවටැන් පිළිබඳ නිපුනතා සඳහා වූ අනුමත පුහුණුවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; සහ

(ඈ) දළ ටොන් 3000 හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උප නැව්පති සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-ii/2 වගන්තියේ දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතුය.

(3) නෞකාධිපතිවරයකු වශයෙන් ප්‍රවීනතා සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) ප්‍රධාන උප නැව්පතිවරයකු වශයෙන් නිසි ප්‍රවීනතා සහතිකයක් දැරිය යුතුය.

(ආ) ප්‍රධාන උප නැව්පතිවරයෙකු වශයෙන් ප්‍රවීනතා සහතිකයක් දරමින් සිටියදී, යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු වශයෙන් මාස 24කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවාවක් තිබීම, එසේ වුවද එකී මුහුදු ගමන් සේවාව ප්‍රධාන උපනැව්පතිවරයකු වශයෙන් දළ ටොන් 500ක් හෝ ඊට වැඩි නෞකාවල ඉටු කරනු ලැබ එකී කාලයෙන් මාස 6කට නොඅඩු කාලයක් දළ ටොන් 3000 හෝ ඊට වැඩි නෞකාවල අනුමත මුහුදු ගමන් සේවාවකින් සමන්විත වන්නේ නම් ඉහත කී කාලය මාස 12ට නොඅඩු කාලයකට හෝ සමානුපාතකිව හෝ අඩු කළ හැකිය.

(ඇ) දළ ටොන් 3000ක් හෝ ඊට වැඩි නෞකාවල නෞකාධිපතිවරුන් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-ii/2 වගන්තියේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් උචිත පරිදි අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

(4) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු දළ ටොන් 3000ට අඩු නෞකාවල යාත්‍රා කරණ මුරකාවල භාර නිලධරයකු වශයෙන් ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) ප්‍රවීනතා සහතික නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණය ආරම්භවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

(ආ) පහත සඳහන් දේ සම්පූර්ණ කොට තිබිය යුතුය-

(i) වෙරළාසන්න මුහුදු ගමන්වලට උචිත බවට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-ii/1 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරාලන්නා වූද අනුමත වාර්තා පොතක නිශ්චිතව සඳහන් පරිදි වූ ද අනුමත නෞකාස්ථ

පුහුණුවක් ඇතුලුව පුහුණු වැඩසටහනක කොටසක් ලෙස, දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල නැව් තට්ටු අංශයේ මාස 18කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් හෝ එසේ නැතහොත් මාස 36කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කොට තිබිය යුතුය. දළ ටොන් 500කට අඩු නෞකාවල අනුමත මුහුදු ගමන් සේවයක් ඉටු කරනු ලැබූ අපේක්ෂකයකු ඔහු විසින් ඉටු කරන ලද බවට ප්‍රකාශ කරන සත්‍ය මුහුදු ගමන් සේවයේ තුනෙන් දෙකොටසක් සඳහා අගයනු ලැබේ ; සහ

(ii) නියම කරනු ලබන මුහුදු ගමන් සේවය තුළ මාස 06කට නොඅඩු කාලයක්, අනුමත පුහුණු වාර්තා පොතක නිශ්චිතව සඳහන් පරිදි නෞකාධිපතිවරයාගේ හෝ සුදුසුකම් ලත් නිලධරයකුගේ අධීක්ෂණය යටතේ පාලම් මුරකාවල් කාර්යය ඉටු කරනු ලැබීම ;

(ඇ) පහත දක්වා ඇති දේ පිළිබඳ අනුමත පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. එනම් ඃ පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), වේගවත් ගැලවීමේ යාත්‍රා නොවන ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), උසස් ගිනි නිවාරන (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), සාමාන්‍ය ක්‍රියාකරු සහතිකය (GMDSS) සහ නෞකා ආරක්ෂක නිලධරයන් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව) ; සහ

(ඈ) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු දළ ටොන් 3000 ට අඩු නෞකාවල යාත්‍රා කරණ මුරකාවල භාර නිලධරයකු සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/1 වගන්තියේ, නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරාලමින්, අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කළ යුතුය, එසේවුවද, දළ ටොන් 500ට අඩු, මුහුදු ගමන් වල යෙදෙන නෞකාවල නැව් තට්ටු කාර්යය පිළිබඳ සේවා කාලයෙන් තුනෙන් දෙකක්, මේ නියෝගයේ කාර්යය සඳහා මුහුදු ගමන් සේවය ලෙස සළකනු ලැබිය හැකි අතර, සෑම අපේක්ෂකයකු විසින්ම එයට අමතරව, දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල යටත් පිරිසෙයින් මාස 12ක් නැව් තට්ටු කාර්යය ඉටු කරනු ලැබ තිබිය යුතුය.

(5) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු දළ ටොන් 3000 ට අඩු නෞකාවල ප්‍රධාන උප නැව්පති වශයෙන් ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) වෙරළාසන්න මුහුදු ගමන් වල යෙදුනු දළ ටොන් 3000 ට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු ලෙස ප්‍රවීනතා සහතිකයක් දැරිය යුතුය.

(ආ) අනුමත අධ්‍යාපනය සහ පුහුණුවට පෙරාතුවම වූ මාස 12 ඇතුළත යටත් පිරිසෙයින් මාස 3ක මුහුදු ගමන් සේවය ඇතුලුව දළ ටොන් 500ක් හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රා කරණ මුරකාවල භාරව නිලධරයකු ලෙස මාස 12කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් තිබිය යුතුය.

(ඇ) ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබීම සඳහා, නෞකාස්ථ වෛද්‍ය උවටැන් පිළිබඳ ප්‍රවීණතා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-2 වගුව), සඳහා වූ අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කරනු ලැබ ඇති බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; සහ

(ඈ) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු දළ ටොන් 500ත් 3000ත් අතර නෞකාවල නෞකාධිපතිවරුන් සහ ප්‍රධාන උප නැව්පතිවරුන් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/ 2 වගුවේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණය සම්පූර්ණ කොට තිබිය යුතුය.

(6) වෙරළාසන්න මුහුදුගමන්වල නියුතු දළ ටොන් 3000ට අඩු නෞකාවල නෞකාධිපතිවරයකු වශයෙන් ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු දළ ටොන් 3000කට අඩු නෞකාවල ප්‍රධාන උපනැව්පති වශයෙන් ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතුය.

(ආ) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු ලෙස මාස 24කට නොඅඩු කාලයක අනුමත මුහුදු සේවය තිබිය යුතුය. කෙසේ වුවද, එකී මුහුදු ගමන් සේවයෙන් මාස 12කට නොඅඩු කාලයක් දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන උපනැව්පති වශයෙන් සේවය කොට ඇත්නම් ඉහතකී කාලය මාස 18කට නොඅඩු කාලයක් ලෙස හෝ සමානුපාතිකව හෝ අඩු කළ හැකිය.

(ඇ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු දළ ටොන් 500 සිට 3000 අතර වූ නෞකාවල නෞකාධිපතිවරුන් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/2 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගැයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතුය.

(7) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු දළ ටොන් 500ට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු වශයෙන් ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) ප්‍රවීණතා සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය

(ආ) පහත දක්වා ඇති දේ සම්පූර්ණ කොට තිබිය යුතුය :-

(i) මාස 12කට නොඅඩු මුහුදු ගමන් සේවා කාලයක් ඇතුළත් වූ මාස 24කට නොඅඩු පෙර මුහුදු හෝ නෞකාස්ථ, අනුමත පුහුණුවක් සහ එකී මාස 12ක මුහුදු ගමන් කාලයෙන් යටත් පිරිසෙයින් මාස 6ක් දළ ටොන් 80ක් හෝ ඊට වැඩි නෞකාවල පාලම් මුරකාවල හා ආශ්‍රිත කාර්ය ඉටුකරමින් සේවය කිරීම ; හෝ

(ii) දළ ටොන් 80ක් හෝ ඊට වැඩි නෞකාවල නැව් තට්ටු අංශයේ, මාස 36කට නොඅඩු කාලයක අනුමත මුහුදු සේවය ;

(ඇ) පහත දක්වා ඇති අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; එනම්: පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් පිළිබඳ අනුමත පුහුණුව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), වේගවත් ගැලවීමේ යාත්‍රා නොවන ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ ප්‍රවීනතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), උසස් ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), සාමාන්‍ය ක්‍රියාකරු සහතිකය (GMDSS), සහ නැව් ආරක්ෂක නිලධරයන් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව) ; සහ

(ඈ) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු, දළ ටොන් 500ට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයන් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A/11-3 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම් සපුරාලමින්, අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතුය.

(8) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු, දළ ටොන් 500ට අඩු නෞකාවලට සීමා වූ නෞකාධිපතිවරුන් වශයෙන් ප්‍රවීනතා සහතික නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) වයස අවුරුදු 20ට නොඅඩු විය යුතුය.

(ආ) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු දළ ටොන් 80ට වැඩි නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු ලෙස මාස දොළහකට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් තිබිය යුතුය ; සහ

(ඇ) වෛද්‍ය උවටැන් ප්‍රවීනතාව පිළිබඳ අනුමත පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-2 වගුව) ; සහ

(ඈ) වෙරළාසන්න මුහුදු ගමන් වල නියුතු, දළ ටොන් 500ට අඩු නෞකාවල නෞකාධිපතිවරුන් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/3 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම් සපුරාලමින්, අදාළ අනුකාරක පුහුණුව සහ ඇගයීම ඇතුළුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතුය :

"ටග් යාත්‍රාවලට පමණකි" යනුවෙන් සීමා වූ ලෙස පිටසන් කරනු ලබන සහතිකයක් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම අපේක්ෂකයෙකු විසින් සුදුසුකම් ලත් මුහුදු ගමන් කාලයේ යටත් පිරිසෙයින් භාගයක්, මුහුදු ගමනේ නියුතු ටග් යාත්‍රාවකත්, ඉතිරි කාලය ටග් යාත්‍රා නොවන මුහුදු ගමන් වල යෙදෙන නෞකාවකත් සේවය කොට තිබිය යුතුය.

(9) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවක යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියෙකු ලෙස සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භ වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

(ආ) පහත දක්වා ඇති දේ සම්පූර්ණ කොට තිබිය යුතුය ; එනම්-

(i) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල ප්‍රධාන පරීක්ෂකවරයා විසින් අනුමත කරනු ලබන පරිදි පාලම් මුරකාවල් සේවයට අදාළව යටත් පිරිසෙයින් මාස 9ක පුහුණුව සහ පළපුරුද්ද ; හෝ

(ii) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල නැව් තට්ටු අංශයේ, මාස 3කට නොඅඩු කාලයක අනුමත පුහුණු කාලයක් සහ මාස 6කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ; හෝ

(iii) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල නැව් තට්ටු අංශයේ අදාළ තත්ත්වයෙන්, මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් ෴

එසේ වුවද, පරීක්ෂණයේ දින සිට පෙරාතුව වූ අවුරුදු පහ ඇතුලත මාස 12ක මුහුදු සේවය නොමැති නිල නොලත් නැවියන් විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන විශේෂ සංස්කරණ පාඨමාලාවක් හැදෑරිය යුතුය. නැව් තට්ටු අංශයට අදාළ නොවූ මූලික පුහුණුවක් සම්පූර්ණ කොට ඇති නිල නොලත් නැවියන්ට, පරීක්ෂණයේ දිනට පෙරාතුව වූ අවුරුදු පහ තුළ නැව් තට්ටු අංශයෙහි අදාල තත්ත්වයෙන් යටත් පිරිසෙයින් මාස 18ක පුහුණු සේවයක් තිබිය යුතුය. තවද අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ විශේෂ යථාවත් කිරීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය.

(ඇ) පහත දක්වා ඇති දේ සම්බන්ධයෙන් අනුමත පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කොට ඇති බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; එනම් ෴ පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව) සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත් භාවය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුව) ; සහ

(ඈ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/4 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය.

(10) දළ ටොන් 500 හෝ ඊට වැඩි නෞකාවල සමත් නැව් තට්ටු මුහුදු යාත්‍රාකරුවෙකු ලෙස ප්‍රවීනතා සහතිකයක් නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයෙකුම විසින් -

(අ) සහතික නිකුත් කිරීම සඳහා වන පරීක්ෂණයේ දින දී වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

(ආ) යාත්‍රාකරණ මුරකාවලෙහි කොටසක් වන නිල නොලත් නැවියෙකු වශයෙන් සහතික ලැබීම සඳහා වන නියමයන් සපුරා තිබිය යුතුය

(ඇ) යාත්‍රාකරණ මුරකාවලක කොටසක් වන නිල නොලත් නැවියෙකු ලෙස සේවය කිරීම සඳහා සුදුසුකම් ලබා සිටිමින්, නැව් තට්ටු අංශයේ෴-

(i) මාස 18කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ; හෝ ෴

(ii) මාස 12කට නොඅඩු කාලයක් අනුමත මුහුදු ගමන් සේවයක් සමඟ අනුමත පුහුණුවක් සම්පූර්ණ කොට තිබීම

(ඈ) පහත දක්වා ඇති දේ පිළිබඳව අනුමත පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කොට ඇති බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; එනම් ෴ පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), ගැලවීමේ ශිල්පීය ක්‍රම සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව) සහ නම් කරන ලද ආරක්ෂක කාර්යය පවරනු ලැබූ මුහුදු යාත්‍රාකරුවන් (STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුව) ; සහ

(ඉ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II/5 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම් සපුරාලමින් අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

මුහුදු යාත්‍රාකරුවන් විසින්, මේ නියෝග බලාත්මක භාවයට පත්වීමට පූර්වයෙන් වූ අවසාන මාස 60 ඇතුලත මාස 12කට නොඅඩු කාලයක් සඳහා යාත්‍රා කරණ මුරකාවලෙහි කොටසක් වූ නිලනොලත් නාවිකයෙකු වශයෙන් නිපුණතා සහතිකයක් ලැබීමෙන් පසු අදාළ තත්ත්වයෙන් නැව් තට්ටු අංශයේ සේවය කරනු ලැබ ඇත්නම්, එකී මුහුදු යාත්‍රාකරුවන් මේ උප නියෝගවල නියමයන් සපුරා ඇති බව ප්‍රධාන පරීක්ෂකවරයා විසින් සළකනු ලැබිය හැකිය.

*ගුවන් විදුලි සන්නිවේදන සහ ගුවන් විදුලි සේවක පිරිස්*

10. (1) සම්මුතියේ IV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලවීම සඳහා GMDSS සාමාන්‍ය ක්‍රියාකරු සහතිකය සහතික කරමින් පිටසනක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) එම පිටසන නිකුත් කරන ලෙස ඉල්ලුම් කරන දිනට, වයස අවුරුදු 18ට අඩු නොවිය යුතුය, (ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-IV/2 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරාලිය යුතුය

(ඇ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් අධිකාරියක් විසින් නිකුත් කරන ලද GMDSS සාමාන්‍ය ක්‍රියාකරු සහතිකය (GROC) දැරිය යුතුය ;

(ඈ) පහත සඳහන් අනුමත පුහුණුවීම් සාර්ථකව සම්පූර්ණ කර තිබෙන බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. එනම්: පෞද්ගලික ආරක්ෂාව සහ සමාජ වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4වගුව), ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1වගුව), උසස් ගිනි නිවීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ AVI/3 වගුව) සහ වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව) සහ නැව් ආරක්ෂක නිලධරයා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6 වගුව).

(2) සම්මුතියේ IV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලවීම සඳහා GMDSS සීමිත ක්‍රියාකරු සහතිකය සහතික කරමින් පිටසනක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) එම පිටසන නිකුත් කරන ලෙස ඉල්ලුම් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-IV/2 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි, සීමිත ක්‍රියාකරු සහතිකය සඳහා වූ ප්‍රවීනතා මට්ටම සපුරාලිය යුතුය

(ඇ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් අධිකාරියක් විසින් හෝ නිකුත් කරන ලද GMDSS සීමිත ක්‍රියාකරු (ROC) සහතිකය දැරිය යුතුය ; සහ

(ඈ) පහත සඳහන් අනුමත පුහුණුවීම් සාර්ථකව සම්පූර්ණ කර තිබෙන බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; එනම්: පෞද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), උසස් ගිනි නිවීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව) සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුව).

*ඇංජින් අංශයේ සමුද්‍රීය ඉංජිනේරු නිලධරයන් සහ නිල නොලත් නැවියන්ගේ පුහුණුව සහ සුදුසුකම් සඳහා වූ අනිවාර්ය අවම නියමන්*

11. (1) ප්‍රචලන බලය කිලෝ වොට් 750ක් හෝ ඊට වැඩි නෞකාවල, මිනිසුන් යෙදූ ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවල භාරව සිටින නිලධරයකු වශයෙන් හෝ වරින් වර මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක නිල ලත් කාර්ය ඉංජිනේරුවරයකු ලෙස ප්‍රවීනතා සහතිකයක් නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයෙකුම :

(අ) ප්‍රවීනතා සහතිකය සඳහා වූ පරීක්ෂණය පවත්වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

(ආ) (i) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/1 වගන්තියේ අවශ්‍යතා සපුරාලමින් මාස 36ක අනුමත අධ්‍යාපනය, පුහුණුව හා ඇගැයුම් වැඩසටහනක කොටසක් වශයෙන් ප්‍රධාන ඉංජිනේරු හෝ වෙනත් සහතික ලත් ඉංජිනේරුවකුගේ අධීක්ෂණය යටතේ මාස හයක ඇංජින් කාමර මුරකාවල ඇතුළුව අනුමත වාර්තා පොතක නෞකාස්ථ පුහුණුව සටහන් කරනු ලබන ප්‍රචලන බලය කිලෝ වොට් 750 හෝ ඊට වැඩි නෞකාවල ඇංජින් අංශයෙහි, මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කොට තිබිය යුතුය ; හෝ

(ii) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු, කිලෝ වොට් 750 සහ 3000 අතර ප්‍රචලන බලයෙන් යුතු නෞකාවලට සීමා වූ ඉංජිනේරු මුරකාවල් භාර නිලධරයෙකු වශයෙන් ප්‍රවීනතා සහතික ලැබීමෙන් පසු ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ වෙනත් සහතික ලත් ඉංජිනේරුවරයෙකුගේ අධීක්ෂණය යටතේ මාස 06ක ඇංජින් කාමර මුරකාවල් සේවය ඇතුලත් වූ කිලෝ වොට් 3000ක හෝ ඊට වැඩි ප්‍රචලන බලයෙන් යුත් නෞකාවක ඇංජින් අංශයේ මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් ; සහ

(ඈ) පහත දක්වා ඇති අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය ; එනම්ඃ පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව) උසස් ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), නැව් ආරක්ෂක නිලධරයා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව) සහ

(ඈ) STCWව්‍යවස්ථා සංග්‍රහයේ A/III-1 වගන්තියේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අනුකාරක පුහුණුව සහ ඇගයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණය හා ඇගයීම් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

(2) වාෂ්ප බොයිලේරු ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A/III-1 වගන්තියේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා නොමැති අපේක්ෂකයන් හට (අදාළ ඉංජිනේරු නිලධරයා) නියමිත ප්‍රවීණතා මට්ටම සපුරාලන තුරු වාෂ්ප බොයිලේරු නෞකාවේ යාන්ත්‍රණයේ කොටසක් වන නෞකාවල සේවය සඳහා වලංගු නොවිය හැකි ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(3) අපේක්ෂකයා විසින් අදාළ පරිදි මෝටර් නෞකා හෝ වාෂ්ප නෞකා සම්බන්ධයෙන් ඉහත (1) (ආ) උපනියෝගයේ නිශ්චිතව සඳහන් අනුමත මුහුදු ගමන් සේවාව සම්පූර්ණ කර ඇත්ද යන්න මත පදනම්ව අදාළ වන පරිදි මෝටර් නෞකා හෝ වාෂ්ප නෞකා සම්බන්ධයෙන් ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබිය හැකිය.

(4) අපේක්ෂකයා විසින් ඉහත (1) (ආ) උපනියෝගයේ නිශ්චිතව සඳහන්, නියම කරනු ලැබූ මුහුදු ගමන් සේවය එක් එක් මෝටර් නෞකාවක සහ වාෂ්ප නෞකාවක සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් මෝටර් නෞකා සහ වාෂ්ප නෞකාවලට අදාළ වන පරිදි ඒකාබද්ධ ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබිය හැකිය.

(5) දෙවැනි ඉංජිනේරුවරයා වශයෙන් ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරනු ලබන සෑම අපේක්ෂකයකු විසින්ම -

(අ) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයක් ඇති නෞකාවක මිනිසුන් රහිත ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවල භාර නිලධරයකු වශයෙන් හෝ වරින් වර මිනිසුන් සහිත ඇංජින් කාමරයක නිල ලත් කාර්ය ඉංජිනේරුවරයෙකු වශයෙන් ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතුය

(ආ) කිලෝවොට් 3000ක හෝ ඊට වැඩි ප්‍රචලන බලයෙන් යුත් නෞකාවල, මාස 6කට නොඅඩු අනුමත මුහුදු සේවයක් ඇතුලත්වූ, කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයෙන් යුත් නෞකාවක මිනිසුන් යෙදූ ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවල භාර නිලධරයා වශයෙන් හෝ වරින්වර මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක නිලලත් කාර්ය ඉංජිනේරු වශයෙන් මාස 18කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් තිබිය යුතු ය ; සහ

(ඇ) දෙවැනි ඉංජිනේරුවරයෙකු වශයෙන් ප්‍රවීණතා සහතික සඳහා STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-III/2 වගන්තියේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගැයුම ඇතුළත්ව අනුමත අධ්‍යාපනය, පුහුණුව සහ පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතු ය ඃ

එසේ වුවද

(i) අදාළ වන පරිදි මෝටර් නෞකා හෝ වාෂ්ප නෞකා සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කළ හැකි වන්නේ අපේක්ෂකයා විසින් අදාළ පරිදි මෝටර් නෞකා හෝ වාෂ්ප නෞකා සඳහා ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කොට ඇත් ද යන්න මත පදනම්ව වේ ; සහ

(ii) අපේක්ෂකයා විසින් ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන්, නියම කරනු ලැබූ මුහුදු ගමන් සේවය එක් එක් මෝටර් නෞකා සහ වාෂ්ප නෞකා සම්බන්ධයෙන් සම්පූර්ණ කොට ඇත්නම්, මෝටර් නෞකා සහ වාෂ්ප නෞකාවලට අදාළ වන පරිදි, ඒකාබද්ධ ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබිය හැකිය.

(6) ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු වශයෙන් ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) කිලෝවොට් 750ක හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් නෞකාවක මිනිසුන් යෙදූ ඇංජින් කාමරයක දෙවැනි ඉංජිනේරු නිලධරයකු ලෙස හෝ වරින්වර මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක, නිලලත් කාර්ය ඉංජිනේරු ලෙස ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතුය.

(ආ) කිලෝවොට් 3000ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් නෞකාවල දෙවැනි ඉංජිනේරු නිලධරයකු වශයෙන් ප්‍රවීණතා සහතිකයක් දරන අතර කිලෝවොට් 3000ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් නෞකාවල ඉංජිනේරු මුරකාවල භාර නිලධරයකු වශයෙන් මාස 18කට නොඅඩු මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කොට තිබිය යුතුය. කෙසේ වුවද, එකී සේවය, කිලෝවොට් 3000ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් නෞකාවල දෙවැනි ඉංජිනේරුවරයා වශයෙන් ඉටුකොට ඇත්නම් මේ කාලය මාස 12කට නොඅඩු ලෙස හෝ සමානුපාතිකව හෝ අඩු කළ හැකිය ; සහ

(ඇ) උචිත පරිදි, ප්‍රධාන ඉංජිනේරු නිලධරයා වශයෙන් ප්‍රවීණතා සහතික ලැබීම සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/2 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගැයීම් ඇතුලුව, අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගැයීම් සම්පූර්ණ කොට තිබිය යුතුය

එසේ වුවද ප්‍රධාන ඉංජිනේරු නිලධරයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතිකයක් -

(i) ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් මුහුදු ගමන් සේවයෙන් මාස 9කට නොඅඩු කාලයක්, යම් මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර ගත කොට ඇත්නම් සහ ඉතිරි කාලය වාෂ්ප නෞකාවක හෝ මෝටර් නෞකාවක ප්‍රධාන යන්ත්‍ර සූත්‍ර අතර හෝ කවර හෝ නෞකාවක යෝග්‍ය අතුරු යන්ත්‍ර සූත්‍ර අතර ගතකොට තිබිය හැකි වූ විටෙක, මෝටර් නෞකාවකට අදාළව ; හෝ

(ii) ඉහත (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් මුහුදු ගමන් සේවයෙන් මාස 9කට නොඅඩු කාලයක් යම් වාෂ්ප නෞකාවක බොයිලේරු අතර සහ ප්‍රධාන ධාවන යන්ත්‍රසූත්‍ර අතර ගතකොට ඇත්නම්, සහ ඉතිරි කාලය වාෂ්ප නෞකාවක හෝ මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර හෝ කවර හෝ නෞකාවක යෝග්‍ය අතුරු යන්ත්‍ර සූත්‍ර අතර ගතකොට තිබිය හැකිවූ විටෙක, වාෂ්ප නෞකාවකට අදාළව ; හෝ

(iii) මුහුදු ගමන් සේවයෙන් මාස නමයකට නොඅඩු කාලයක් වාෂ්ප නෞකාවක බොයිලේරු අතර හෝ ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර ගතකොට, මුහුදු ගමන් සේවයෙන් මාස නමයකට නොඅඩු කාලයක් මෝටර් නෞකාවක ප්‍රධාන ධාවන යන්ත්‍ර සූත්‍ර අතර ගතකොට ඇති විටෙක, ඒකාබද්ධ මෝටර් සහ වාෂ්ප නෞකාවලට අදාළව,

(7) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝවොට් 750ත් 3000ත් අතර ප්‍රචලන බලයෙන් යුත් නෞකාවලට සීමාවූ ඉංජිනේරු මුරකාවල භාර නිලධරයකු ලෙස ප්‍රවීණතා සහතිකයක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු ය

(ආ) පහත දැක්වෙන දේ සම්පූර්ණ කොට තිබිය යුතුය එනම්

(i) අනුමත පුහුණු වාර්තා පොතක යථා පරිදි ලේඛනගත කොට ඇති නෞකාස්ථ පුහුණුව ඇතුළත් මාස 30ක අනුමත මුහුදු ගමන් සේවය.

(ii) පෙරාතුව වූ අවුරුදු 05ක කාලය තුළ මුහුදුගමන් සේවය ඉටුකරනු ලැබුවේ යම් නෞකාවක් තුළ ද, එකී නෞකාවේ නෞකාස්ථ, සහතිකලත් ඉංජිනේරු නිලධරයා විසින් සමීපව අධීක්ෂණය කරනු ලැබූ සහ නියාමනය කරන ලැබූවා වූද අනුමත පුහුණු වාර්තා පොතක යථා පරිදි ලේඛනගත කරනු ලැබූවා වූද, ඇංජින් අංශයේ මාස 12කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවය ; සහ

(iii) පහත දක්වා ඇති දේ පිළිබඳ අනුමත පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කොට ඇති බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. එනම් පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව) ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුනතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), සහ උසස් ගිනි නිවීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව) සහ වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), නෞකා ආරක්ෂක නිලධරයා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව) ; සහ

(ඇ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු නෞකා සඳහා අදාළවන, (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/1 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම් සපුරාලමින් අදාළ අනුකාරක පුහුණුව සහ ඇගැයීම් ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතුය ඃ

එසේ වුවද, වාෂ්ප බොයිලේරු ක්‍රියාත්මක කිරිම සහ නඩත්තු කිරීම සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/1 වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීණතා මට්ටම් සපුරා නොමැති අපේක්ෂකයින් හට, ඉංජිනේරු නිලධරයා

(අපේක්ෂකයා) නියම කරනු ලැබූ ප්‍රවීණතා මට්ටමට පත්වන තෙක්, වාෂ්ප බොයිලේරු නෞකාවේ යාන්ත්‍රණයේ කොටසක් වන්නා වූ නෞකාවක සේවය සඳහා වලංගු නොවන්නා වූ ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකිය.

(8) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයකින් යුත් නෞකාවල දෙවැනි ඉංජිනේරු වරයකු වශයෙන් ප්‍රවීණතා සහතික නිකුත් කරනු ලැබීම සඳහා අපේක්ෂා කරනු ලබන සෑම අපේක්ෂකයකුම

(අ) වෙරළාසන්න මුහුදුගමන්වල නියුතු කිලෝවොට් 750ත් සහ 3000ත් අතර ප්‍රචලන බලයකින් යුත් නෞකාවක ඉංජිනේරු මුරකාවල භාර නිලධරයා ලෙස ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතුය ;

(ආ) කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයෙන් යුත් නෞකාවක ඉංජිනේරු මුරකාවල භාර නිලධරයකු වශයෙන් මාස 12කට නොඅඩු කාලයක් සඳහා අනුමත මුහුදුගමන් සේවය සම්පූර්ණ කොට තිබිය යුතුය ; සහ

(ඇ) වෙරළාසන්න මුහුදුගමන්වල කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයකින් යුත් නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයා සහ දෙවැනි ඉංජිනේරු නිලධරයා සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/2 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අනුකාරක පුහුණුව සහ ඇගැයීම ඇතුලුව අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතු ය.

(9) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයෙන් යුත් නෞකාවල ප්‍රධාන ඉංජිනේරු නිලධරයා වශයෙන් ප්‍රවීණතා සහතිකයක් නිකුත් කරනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම.

(අ) වෙරළාසන්න මුහුදු ගමන් සේවයේ නියුතු කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයෙන් යුත් නෞකාවක දෙවැනි නිලධරයා වශයෙන් ප්‍රවීණතා සහතිකයක් හෝ පිටසනක් දැරිය යුතුය ;

(ආ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝවොට් 750ත් කිලෝවොට් 3000ත් අතර ප්‍රචලන බලයෙන් යුත් නෞකාවල ජාත්‍යන්තර මුහුදුගමන් පිළිබඳ ඉංජිනේරු මුරකාවල භාර නිලධරයකු ලෙස හෝ දෙවැනි ඉංජිනේරු නිලධරයකු වශයෙන්, මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කොට තිබිය යුතුය ;

(ඇ) වෙරළාසන්න මුහුදු ගමන්වල නියුතු කිලෝ වොට් 750 ත් 3000 ත් අතර ප්‍රචලන බලයෙන් යුතුවූ නෞකාවලට සීමා වූ ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්ගේ ප්‍රවීණතා සහතික සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයෙන් A - 111/2 වගන්තියේ නිශ්චිත ව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරාලමින් අනුකාරක පුහුණුව සහ ඇගැයීම් ඇතුලුව, අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණය, සම්පූර්ණකොට තිබිය යුතුය.

(10) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයෙන් යුත් නෞකාවල ඉංජිනේරු මුරකාවලෙහි කොටසක් වන්නාවූ නිලනොලත් නැවියකු වශයෙන් සහතික නිකුත් කොට ගනු ලැබීමට ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම–

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වූ පරීක්ෂණය ආරම්භවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය ; (ආ)පහත දක්වා ඇති දේ, එනම්

(i) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් නෞකා සම්බන්ධයෙන් ප්‍රධාන පරීක්ෂකවරයා විසින් අනුමත කරනු ලබන පරිදි ඉංජිනේරු මුරකාවලට අදාළ යටත් පිරිසෙයින් මාස හයක පුහුණුව සහ පළපුරුද්දක් ; හෝ

(ii) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයෙන් යුත් නෞකාවල මාස 06කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් සහ මාස 3කට නොඅඩු අනුමත විශේෂ පුහුණුවක් ; හෝ

(iii) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයෙන් යුත් නෞකාවල ඇංජින් අංශයේ අදාළ තත්ත්වයෙන් මාස 12කට නොඅඩු කාලයක මුහුදු ගමන් සේවයක්.

එසේ වුවද, පරීක්ෂණ දිනයට පෙරාතුව වූ අවුරුදු 5 තුළ මාස 12ක මුහුදු සේවය නොමැති නිල නොලත් නැවියන් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි වූ විශේෂ සංස්කරණ පාඨමාලාවක් හැදෑරිය යුතුය. ඇංජින් අංශයට අදාළ නොවූ මූලික පුහුණුවක් සම්පූර්ණ කරනු ලැබූ නිල නොලත් නැවියන් හට පරීක්ෂණයේ දිනයට පෙරාතුවම වූ අවුරුදු 5 තුළ අදාළ තත්ත්වයෙන්, ඇංජින් අංශයේ, යටත් පිරිසෙයින් මාස 18ක මුහුදු සේවයක් තිබිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි වූ යථාවත් කිරීමේ විශේෂ පාඨමාලාවක් හැදෑරිය යුතුය.

(ඇ) ඇංජින් කාමර මුරකාවලෙහි කොටසක් වූ නිල නොලත් නැවියන් ලෙස සහතික නිකුත් කරනු ලැබීම සඳහා පහත සඳහන් අනුමත පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය එනම් : පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත් භාවය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1වගුව) ; සහ

(ඈ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/4 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරාලිය යුතුය.

(11) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් ප්‍රධාන ප්‍රචලන යන්ත්‍රාණුසාරයෙන් බලය ලබා ගන්නා මුහුදු ගමන් නෞකාවක සේවය කරන සෑම සමත් මුහුදු යාත්‍රාකරු/ඇංජින්, විසින් විධිමත් පරිදි සහතික ලබා තිබිය යුතුයි සහතික ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) සහතිකය නිකුත් කිරීම සඳහා වන විභාගයේ දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

(ආ) මිනිසුන් යෙදූ ඇංජින් කාමරයක මුරකාවලක කොටසක් වන්නාවූ නිල නොලත් නැවියකු වශයෙන් හෝ වරින් වර මිනිසුන් නොයෙදූ ඇංජින් කාමරයක කාර්යය ඉටුකිරීම සඳහා නම්කළ, නැවියකු වශයෙන් සහතික ලැබීම සඳහා අවශ්‍ය නියමයන් සපුරාලිය යුතුය.

(ඇ) ඇංජින් කාමර මුරකාවලක කොටසක් වන්නාවූ නිල නොලත් නැවියකු වශයෙන් සේවය කිරීමට සුදුසුකම් ලැබ තිබියදී, මුහුදු ගමන් නෞකාවක අනුමත පුහුණුවීමක කොටසක් වශයෙන් මාස 12කට නොඅඩු අනුමත මුහුදු සේවා කාලයක් එහි ඇංජින් අංශයේ සම්පූර්ණ කළ යුතුය. නැතහොත් මාස 6කට නොඅඩු කාලයක් සහ අනුමත පුහුණුවක් සම්පූර්ණ කළ යුතුය ; සහ

(ඈ) පහත සඳහන් අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීම පිළිබඳව ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය එනම්: පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතාව (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුව), උසස් ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත් භාවය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුව) ; සහ

(ඉ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/5 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම් සපුරාලමින් අනුමත අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණය සහ ඇගැයීම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

මුහුදු යාත්‍රාකරු විසින් ඇංජින් කාමර මුරකාවලක කොටසක් වූ නිල නොලත් නැවියකු ලෙස නිපුණතා සහතිකයක් ලබාගැනීමෙන් පසු මේ නියෝග බලාත්මක වීමට පෙරාතුව වූ අවසාන මාස 60 ඇතුළත මාස 12කට නොඅඩු කාලයක් අදාළ තත්ත්වයෙන් ඇංජින් අංශයේ සේවය කොට ඇත්නම්, ප්‍රධාන පරීක්ෂකවරයා විසින් එකී මුහුදු යාත්‍රාකරු මේ නියෝගයේ නියමයන් සපුරා ඇති බවට සලකනු ලැබිය හැකිය.

(12) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් ප්‍රධාන ප්‍රචලන යන්ත්‍රාණුසාරයෙන් බලය ලබා ගන්නා මුහුදු ගමන් නෞකාවක සේවය කරන සෑම විද්‍යුත් කාර්මික නිලධරයකු විසින් ප්‍රවීණතා සහතිකයක් දැරිය යුතුයි එවැනි සහතිකයක් සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම-

(අ) වයස අවුරුදු 18ට අඩු නොවිය යුතුය

(ආ) මාස 30කට නොඅඩු ඒකාබද්ධ වැඩමුළු නිපුණතා පුහුණුව සහ අනුමත මුහුදු ගමන් සේවාවක් සම්පූර්ණ කළ යුතු අතර එයින් මාස 12කට නොඅඩු කාලයක් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III-6 වගන්තියේ නියමයන් සපුරාලන අනුමත පුහුණු වැඩසටහනක කොටසක් වශයෙන් විය යුතුය ; සහ එය අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කොට තිබිය යුතුය. නැතහොත් මාස 36කට නොඅඩු කාලයක ඒකාබද්ධ වැඩ මුළු නිපුනතා පුහුණුවක් සහ අනුමත මුහුදු ගමන් සේවාවක් තිබිය යුතු අතර එයින් මාස 30කට නොඅඩු කාලයක් විද්‍යුත් කාර්මික නිල නොලත් නැවියකු වශයෙන් වූ මුහුදු ගමන් සේවාවක් විය යුතු ය ;

(ඇ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III-6 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරාලමින් අනුකාරක පුහුණුව සහ ඇගැයීම් ඇතුළුව අනුමත අධ්‍යාපන පුහුණු සහ පරීක්ෂණ සම්පූර්ණ කොට තිබිය යුතුය ; සහ

(ඈ) පහත සඳහන් අනුමත පුහුණුව සාර්ථකව සම්පූර්ණ කළ බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය එනම් පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4වගුව), ගැලවීමේ යාත්‍රා සහ ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුනතාවය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1වගුව), උසස් ගිනි නිවීම් (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුව), වෛද්‍ය ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4-1 වගුව), සහ නෞකා ආරක්ෂක නිලධරයා (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගුව).

යම් මුහුදු යාත්‍රාකරුවෙකු මේ නියෝග බලාත්මක වීමට පෙරාතුවම වූ අවසාන මාස 60 ඇතුළත මාස 12කට නොඅඩු කාලයක් අදාළ තත්ත්වයෙන් නෞකාවක නෞකාස්ථව සේවය කොට ඇත්නම් සහ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/6 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා ඇත්නම්, එකී මුහුදු යාත්‍රාකරු අනිවාර්ය යථාවත් කිරීමේ වැඩසටහනක් සම්පූර්ණ කිරීමෙන් පසු, යම් ඇගැයීමකදී, තම ප්‍රවීනතාව ප්‍රදර්ශනය කිරීමට යටත්ව, ප්‍රධාන පරීක්ෂකවරයා විසින් එකී මුහුදු යාත්‍රාකරු මේ නියෝග වල නියමයන් සපුරා ඇති බවට සලකනු ලැබිය හැකිය.

(13) කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත් ප්‍රධාන ප්‍රචලන යාන්ත්‍රණයක් මගින් බලය සපයනු ලබන, මුහුදු ගමනේ යෙදෙන මුහුදු ගමන් නෞකාවක සේවය කරන සෑම විද්‍යුත් කාර්මික නිල නොලත් නැවියකුටම විධිමත් ලෙස සහතික දෙනු ලැබිය යුතුය. එවැනි සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂයකුම-

(අ) වයස අවුරුදු 18ට නොඅඩු විය යුතුය

(ආ) මාස 15කට නොඅඩු ඒකාබද්ධ වැඩමුළු නිපුණතා පුහුණුව සහ අනුමත මුහුදු සේවාවක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර එයින් මාස 9කට නොඅඩු කාලයක්, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III-7 වගන්තියේ නියමන් සපුරාලන අනුමත පුහුණු වැඩසටහනක කොටසක් විය යුතුය ; හෝ

(ඇ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/7 වගුවේ සඳහන් කාර්මික ප්‍රවීණතා සපුරාලන සුදුසුකම්ද මාස 9කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ද තිබිය යුතුය ; සහ

(ඈ) පහත සඳහන් දෑ පිළිබඳ අනුමත පුහුණුවක් සාර්ථකව සම්පූර්ණ කල බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. එනම්: පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය සහ ගිනි නිවීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), සහ පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව), සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6 වගුව) ; සහ

(ඉ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/7 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම් සපුරාලිය යුතුය.

යම් මුහුදු යාත්‍රාකරුවන් මේ නියෝග බලාත්මක භාවයට පැමිණීමට පෙරාතුව වූ අවසාන මාස 60 ඇතුළත මාස 12කට නොඅඩු කාලයක් සඳහා අදාළ තත්වයෙන් නෞකාස්ථව සේවය කරනු ලැබ ඇත්නම් සහ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III/7 වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා ඇතිනම් එකී එක් එක් මුහුදු යාත්‍රාකරු විසින් අනිවාර්ය යථාවත් කිරීමේ වැඩසටහනක් හැදෑරීමෙන් පසු, ඇගැයුම් කිරීමකදී තම ප්‍රවීණතාව ප්‍රදර්ශනය කිරීමට යටත්ව ප්‍රධාන පරීක්ෂකවරයා විසින් එකී මුහුදු යාත්‍රාකරුවන් මේ උපනියෝගයේ නියමයන් සපුරා ඇති බවට සලකනු ලැබිය හැකිය.

*ඇතැම් වර්ගවලට අයත් නෞකාවල සේවක පිරිස් සඳහා වන විශේෂ පුහුණුව සහ නියමයන්*

*තෙල් නෞකා සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර් නෞකාවල නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ නිල නොලත් නැවියන්ගේ පුහුණුව සහ සුදුසුකම් සඳහා වන අනිවාර්ය අවම නියමයන්.*

12. (1) තෙල් නැව් හෝ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නැව්වල නැව් බඩු හෝ නැව් බඩු උපකරණවලට අදාළ විශේෂ කාර්ය සහ වගකීම් පවරනු ලැබූ නිලධරයන් සහ නිල නොලත් නැවියන් විසින් තෙල් නැව් සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නැව්වල නැව් බඩු මෙහෙයුම් සඳහා වන මූලික පුහුණුව පිළිබඳ සහතිකයක් දැරිය යුතුය.

(2) තෙල් නැව් සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නැව්වල නැව් බඩු මෙහෙයුම් සඳහා වන මූලික පුහුණුව පිළිබඳ සහතිකයක් සඳහා ඉල්ලුම්කරන සෑම නිලධරයකු සහ නිල නොලත් නැවියකු විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1 වගන්තියේ විධිවිධානවලට අනුකූලව මූලික පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර-

(අ) තෙල් නැව් හෝ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවල යටත් පිරිසෙයින් මාස 03ක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කළ යුතු අතර STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-1 වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය ; හෝ

(ආ) තෙල් නැව් සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවල නැව් බඩු මෙහෙයුම් පිළිබඳ අනුමත මූලික පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-1වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය.

(3) නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්, ප්‍රධාන උප නැව්පතිවරුන්, දෙවැනි ඉංජිනේරු නිලධරයන් සහ තෙල් නෞකාවක බඩු පැටවීම, බඩු බෑම, මාර්ගස්ථ ආරක්ෂාව, බඩු එහා මෙහා කිරීම, නෞකාව පිරිසිදු කිරීම සහ නැව් බඩු සම්බන්ධ වෙනත් මෙහෙයුම් පිළිබඳව ආසන්නතම වගකීම දරන වෙනත් යම් තැනැත්තන්ද විසින් තෙල් නෞකාවල නැව් බඩු මෙහෙයුම් පිළිබඳ උසස් පුහුණු සහතිකයක් දරනු ලැබිය යුතු ය.

(4) තෙල් නෞකා නැව් බඩු මෙහෙයුම් සඳහා වන උසස් පුහුණු සහතිකයක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) තෙල් නෞකා සහ රසායනික ද්‍රව්‍ය පටවන නෞකාවල නැව් බඩු මෙහෙයුම් සඳහා වන මූලික පුහුණු සහතිකයක් සඳහා වූ නියමයන් සපුරා තිබිය යුතුය ; සහ

(ආ) තෙල් නෞකා සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවල නැව් බඩු මෙහෙයුම් සඳහා මූලික පුහුණුව පිළිබඳ සහතික ලැබීමට සුදුසුකම් ලැබ-

(i) තෙල් නෞකාවල යටත් පිරිසෙයින් මාස 03ක අනුමත මුහුදු ගමන් සේවාවක් තිබිය යුතු ය ; හෝ

(ii) තෙල් නෞකාවල, යටත් පිරිසෙයින් එක් මාසයක අනුමත නෞකාස්ථ පුහුණුවක් අතිරේක තත්ත්වයෙන් තිබිය යුතු අතර එයට, යටත් පිරිසෙයින් බඩු පැටවීමේ මෙහෙයුම් තුනක් සහ බඩු බෑමේ මෙහෙයුම් තුනක් ඇතුළත් විය යුතුය. තවද එය STCW ව්‍යවස්ථා සංග්‍රහයේ B-V/1 වගන්තියේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කොට තිබිය යුතුය.

(ඇ) තෙල් නෞකා නැව් බඩු මෙහෙයුම් පිළිබඳ අනුමත උසස් පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-1 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරාලිය යුතුය.

(5) නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්, ප්‍රධාන උපනැව්පතිවරුන්, දෙවැනි ඉංජිනේරු නිලධරයන් සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවක බඩු පැටවීම, බඩු බෑම, මාර්ගස්ථ ආරක්ෂාව, බඩු එහා මෙහා කිරීම, නෞකාව පිරිසිදු කිරීම හෝ නැව් බඩු සම්බන්ධ මෙහෙයුම් පිළිබඳව ආසන්නතම වගකීම දරන යම් තැනැත්තකුද විසින් රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවල නැව් බඩු මෙහෙයුම් සඳහා උසස් පුහුණු සහතිකයක් දරනු ලැබිය යුතුය.

(6) රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවක නැව් බඩු මෙහෙයුම් පිළිබඳ උසස් පුහුණු සහතිකයක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(අ) තෙල් නෞකා සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් පිළිබඳ මූලික පුහුණු සහතිකයක් සඳහා වූ නියමයන් සපුරා තිබිය යුතුය ; සහ

(ආ) තෙල් නෞකා සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් පිළිබඳ මූලික පුහුණු සහතිකය සඳහා සුදුසුකම් ලැබ සිටිමින්-

(i) රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවක යටත් පිරිසෙයින් මාස 03ක අනුමත මුහුදු ගමන් සේවයක් තිබිය යුතුය ; හෝ

(ii) රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකාවල, යටතේ පිරිසෙයින් බඩු පැටවීමේ මෙහෙයුම් තුනක් සහ බඩු බෑමේ මෙහෙයුම් තුනක් ඇතුළත් වූ එක් මාසයක අනුමත නෞකාස්ථ පුහුණුවක් අතිරේක තත්ත්වයෙන් තිබිය යුතු අතර එය, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ B-V/1 වගන්තියේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කොට තිබිය යුතුය ; සහ

(ඇ) රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් සඳහා වූ අනුමත උසස් පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-1 වගන්තියේ 3 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය.

(7) තෙල් නෞකා සහ රසායනික ද්‍රව්‍ය පටවන ටැංකර නෞකා පුහුණුව පිළිබඳව පවත්නා නිපුණතා සහතික, එකී සහතික දරන්නන් විසින්, අදාළ තත්වයෙන්, අදාළ නෞකාවල නැවත වලංගු කිරීමේ දිනයට පෙරාතුව වූ අවුරුදු 05 තුළ, මාස 3 ක කාලයක් නෞකාස්ථ මුහුදු සේවයක් ඉටු කරනු ලැබ ඇත්නම් හෝ අදාළ උසස් ටැංකර නෞකා පුහුණුවක් ලබා ඇත්නම්, නැවත වලංගු කරනු ලැබේ.

*ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ නිල නොලත් නැවියන් පිළිබඳ පුහුණුව සහ සුදුසුකම් සඳහා වූ අනිවාර්ය අවම නියමයන්*

(8) ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල නැව්බඩු හෝ නැව්බඩු උපකරණවලට අදාළ විශේෂ කාර්ය සහ වගකීම් පවරනු ලැබ ඇති නිලධරයන් සහ නිල නොලත් නැවියන් විසින් ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව්බඩු මෙහෙයුම් සඳහා වූ මූලික පුහුණු සහතිකයක් දරනු ලැබිය යුතුය.

(9) ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවක නැව් බඩු මෙහෙයුම් සඳහා වූ මූලික පුහුණු සහතිකයක් සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V1/1 වගන්තියේ විධිවිධාන වලට අනුකූලව මූලික පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර -

(අ) ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල යටත් පිරිසෙයන් මාස තුනක අනුමත මුහුදු ගමන් සේවයක් සම්පූර්ණ කරනු ලැබ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-2 වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය ; හෝ

(ආ) ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් සඳහා වූ අනුමත මූලික පුහුණුවක් සම්පූර්ණ කරනු ලැබ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-2වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය.

(10) නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්, ප්‍රධාන උපනැව්පතිවරුන්, දෙවැනි ඉංජිනේරු නිලධරයන් සහ ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල බඩු පැටවීම, බඩු බෑම මාර්ගස්ථ ආරක්ෂාව, බඩු එහා මෙහා කිරීම, නෞකාව පිරිසිදු කිරීම හෝ නැව්බඩු සම්බන්ධ වෙනත් මෙහෙයුම් පිළිබඳව ආසන්නතම වගකීම දරන යම් තැනැත්තකු විසින් ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් සඳහා වූ උසස් පුහුණු සහතිකයක් දරනු ලැබිය යුතුය.

(11) ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් සඳහා වූ උසස් පුහුණු සහතිකයක් ඉල්ලුම්කරන සෑම අපේක්ෂකයකුම -

(අ) ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් පිළිබඳ මූලික පුහුණු සහතික සඳහා වූ නියමන් සපුරා තිබිය යුතුය ; සහ

(ආ) ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව්බඩු මෙහෙයුම් පිළිබඳ මූලික පුහුණු සහතිකය සඳහා සුදුසුකම් ලැබ සිටිමින් -

(i) ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවක යටත් පිරිසෙයින් මාස තුනක අනුමත මුහුදු ගමන් සේවයක් තිබිය යුතුය ; හෝ

(ii) ද්‍රවීකෘත වායු ටැංකර නෞකාවල යටත් පිරිසෙයින් බඩු පැටවීමේ මෙහෙයුම් 3ක් සහ බඩු බෑමේ මෙහෙයුම් තුනක් ඇතුළත් එක් මාසයක අනුමත නෞකාස්ථ පුහුණුවක් අතිරේක තත්ත්වයෙන් තිබිය යුතු අතර එය STCW ව්‍යවස්ථා සංග්‍රහයේ B-V/1 වගන්තියේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් අනුමත පුහුණු වාර්තා පොතක ලේඛනගත කොට තැබිය යුතුය ; සහ

(ඇ) ද්‍රවීකෘත වායු ටැංකර නෞකා නැව් බඩු මෙහෙයුම් සඳහා වූ අනුමත උසස් පුහුණුව සම්පූර්ණ කොට තිබිය යුතු අතර STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/1-2 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම් සපුරා තිබිය යුතුය.

(12) මුහුදු යාත්‍රාකරු විසින් පෙරාතුව වූ මාස 60 ඇතුළත මාස 3කට නොඅඩු කාලයක් සඳහා අදාළ තත්වයෙන් අදාළ නෞකාවල නෞකාස්ථව සේවය කොට ඇත්නම් හෝ අදාළ උසස් ටැංකර පුහුණුව හදාරා ඇත්නම් ටැංකර නෞකා පිළිබඳ පවත්නා නිපුණතා සහතික නැවත වලංගු කරනු ලැබිය යුතුය

*මඟී නෞකාවල නෞකාධිපතිවරුන්, නිලධරයන්, නිලනොලත් නැවියන් සහ වෙනත් සේවක පිරිස්වල පුහුණුව සහ සුදුසුකම් සඳහා වූ අනිවාර්ය අවම නියමයන්*

13. (1) මඟී නෞකාවක නෞකාස්ථ කාර්යන් පවරනු ලැබීමට පෙරාතුව, ජාත්‍යන්තර මුහුදු ගමන්වල නියුතු මඟී නෞකාවල නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් විසින්, පහත දක්වා ඇති (3) සිට (6) දක්වා වූ උප නියෝග වලින් නියම කරනු ලැබ ඇති පුහුණුව, ඔවුන්ගේ ශක්නුතාව, කාර්ය සහ වගකීම්වලට අනුකූලව සම්පූර්ණ කල යුතුය.

(2) මෙහි පහත (3), (5) සහ (6) වන උප නියෝග වලට අනුකූලව පුහුණුව ලැබීමට නියම කරනු ලැබූ මුහුදු යාත්‍රාකරුවන් විසින්, අවුරුදු 05ක් නොඉක්මවන කාල අන්තරවලදී උචිත සංස්කරණ පුහුණුවක් ලැබීමට භාරගත යුතුය. නැතහොත් පෙරාතුව වූ අවුරුදු 05 ඇතුළත, නියම කරනු ලැබූ ප්‍රවීණතා මට්ටම සපුරාගත් බවට සාක්ෂි සැපයීමට නියම කරනු ලැබිය යුතුය.

(3) මඟී නෞකාවල නෞකාස්ථව ඇති වන්නා වූ හදිසි අවස්ථාවලදී මඟීන්ට සහාය වීම පිණිස නම් කරනු ලැබූ නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ වෙනත් සේවක පිරිස් විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-V/2 වගන්තියේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් සමූහ කළමනාකරණය පිළිබඳව පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

(4) මඟී නෞකාවක නෞකාස්ථව, මඟී අවකාශ වල සිටින මඟීන්ට සෘජුව සේවය කරනු ලබන සේවක පිරිස් විසින් STCW සංග්‍රහයේ A-V/2 වගන්තියේ 2 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ආරක්ෂක පුහුණුව සම්පූර්ණ කොට තිබිය යුතුය.

(5) මඟී නෞකාවක නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනේරු නිලධරයන්, උප නැව්පතිවරුන්, දෙවැනි ඉංජිනේරු නිලධරයන් සහ එකී නෞකාවක නෞකාස්ථ වූ මඟීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් හදිසි අවස්ථාවකදී වගකීම දරන්නන් ලෙස පෙරෙට්ටු ලැයිස්තුව මඟින් නම් කරනු ලැබූ වෙනත් යම් තැනැත්තන්ද STCW සංග්‍රහයේ A-V/2 වගන්තියේ 3 වන ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි අර්බුදකාරි තත්ත්ව කළමනාකරණය සහ මනුෂ්‍ය හැසිරීම් පිළිබඳ අනුමත පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

(6) රෝ-රෝ මඟී නෞකාවක නෞකාස්ථ මඟීන් නැව් නැගීම සහ නැවෙන් බැසීම, නැව්බඩු පැටවීම, බෑම සහ සුරැකීම හෝ නැව් බඳ විවර වැසීම පිළිබඳ සෘජු වගකීම පවරනු ලැබ ඇති නෞකාධිපතිවරුන්, ප්‍රධාන ඉංජිනෙරු නිලධරයන්, උප නැව්පතිවරුන්, දෙවැනි ඉංජිනේරු නිලධරයන් සහ අන් සෑම තැනැත්තකුම STCW සංග්‍රහයේ A-V/2 වගන්තියේ 4 වන ඡේදයේ නිශ්චිතව සඳහන් කොට ඇති පරිදි වූ මඟී ආරක්ෂාව, නැව් බඩු ආරක්ෂාව සහ නැව් බඳේ සම්පූර්ණත්වය පිළිබඳ අනුමත පුහුණුව සම්පූර්ණ කොට තිබිය යුතුය.

(7 ) මුහුදු යාත්‍රාකරුවන් විසින්, මේ නියෝගවල විධිවිධාන පිළිපැද ඇති බවට ලේඛණගත සාක්ෂි තමන් සමග රැගෙන යනු ලැබිය යුතුය.

**විකල්ප සහතික**

*විකල්ප සහතික නිකුත් කිරීම.*

14. (1) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ ඇමුණුමේ, II සහ III වන පරිච්ඡේද වල දක්වා ඇති නියමයන්වල කුමක් සඳහන් වුවද, අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින්, එකී පරිච්ඡේදවල නියෝගවල සඳහන් වෙනත් සහතික නිකුත් කරනු ලැබිය හැකිය. එසේ වුවද,

(අ) සහතිකවල සහ පිටසන් කිරීම් වල සඳහන් කරනු ලැබිය යුතු ආශ්‍රිත කර්තව්‍ය සහ වගකීම් මට්ටම් STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-II-1, A-II-2, A-II-3, A-II-4, A-II-5 , A-III-1, A-III-2, A-III-3, A-III-4, A-III-5 සහ A-IV-2, යන වගන්තිවල පෙන්නුම් කරන කර්තව්‍ය සහ වගකීම් මට්ටම් වලින් තෝරාගනු ලැබූ හා ඒ හා සර්වසම වූ ඒවා විය යුතුය ;

(ආ) අපේක්ෂකයින් විසින් අනුමත අධ්‍යාපනය සහ පුහුණුව සම්පූර්ණ කරනු ලැබ තිබිය යුතු අතරම සහතිකවල සහ පිටසන් කිරීම්වල දැක්විය යුතු කර්තව්‍ය සහ මට්ටම් සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ අදාළ වගන්ති වල නියම කරනු ලැබ ඇති සහ එකී සංග්‍රහයේ A-VII-1 වගන්තියේ දක්වා ඇති පරිදි වූ ප්‍රවීනතා මට්ටම්, සපුරා තිබිය යුතුය.

(ඇ) අපේක්ෂකයින් විසින්, සහතිකවල දැක්විය යුතු කර්තව්‍ය සහ මට්ටම් ඉටු කිරීමට උචිත වන අනුමත මුහුදු ගමන් සේවා සම්පූර්ණ කොට තිබිය යුතුය. මුහුදු ගමන් සේවයේ අවම කාලය, STCW සංග්‍රහයේ ඇමුණුමේ II වන සහ III වන පරිච්ඡේදවල නියම කරනු ලැබ ඇති මුහුදු ගමන් සේවා කාලය හා සම විය යුතුය. කෙසේවුවද, මුහුදු ගමන් සේවයේ

අවම කාලය STCW සංග්‍රහයේ A-VII-2 වගන්තියෙන් ඒ සඳහා නියම කරනු ලැබ ඇති කාලයට වඩා අඩු නොවිය යුතුය.

(ඈ) මෙහෙයුම් මට්ටමේ යාත්‍රාකරණ කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු වූ සහතික අපේක්ෂා කරන අපේක්ෂකයින් විසින් රේඩියෝ නියෝගවලට අනුකූලව, නම් කරනු ලැබූ රේඩියෝ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන්, STCW සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ නියෝගවල අදාළ නියමයන් උචිත පරිදි සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

(ඉ) සහතික නිකුත් කිරීම, STCW සංග්‍රහයේ I/2 නියෝගයේ නියමයන්ට සහ VII පරිච්ඡේදයේ දක්වා ඇති විධිවිධාන වලට අනුකූලව කරනු ලැබිය යුතුය.

*මුහුදු යාත්‍රාකරුවන්හට සහතික ලබා දීම*

(2) STCW සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ A-II-1, A-II-2, A-II-3, A-II-4 හෝ A-II-5 යන වගුවල හෝ III වන පරිච්ඡේදයේ A-III-1, A-III-2, A-III-3, A-III-4 හෝ A-III-5 යන වගුවල හෝ IV වන පරිච්ඡේදයේ A-IV-2, වගුවේ නිශ්චිතව සඳහන් යම් කර්තව්‍යයක් හෝ කර්තව්‍ය සමූහයක් ඉටු කරනු ලබන සෑම මුහුදු යාත්‍රාකරුවකුම විසින් අදාළ පරිදි ප්‍රවීනතා සහතිකයක් හෝ නිපුනතා සහතිකයක් දැරිය යුතුය.

*විකල්ප සහතික නිකුත් කිරීම පාලනය කරනු ලබන මූලධර්ම.*

15. (1) අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් -

(අ) යම් විකල්ප සහතික දීමක් මගින් මුහුදේ දී යම් ප්‍රමාණයක සුරක්ෂිතභාවයක් සහතික කරන්නේ නම් සහ යටත් පිරිසෙයින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ අනිකුත් පරිච්ඡේද වලින් විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට හෝ දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් යම් බලපෑමක් තිබේනම් මිස කවර හෝ විකල්ප සහතික දීමේ ක්‍රමයක් ක්‍රියාත්මක නොකරන බවට ; සහ

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ VII පරිච්ඡේදය යටතේ විකල්ප සහතික දීම සඳහා වූ කවර හෝ සැලැස්මක් මගින් අනිකුත් පරිච්ඡේද යටතේ නිකුත් කරනු ලබන සහතික සමග අන්තර් හුවමාරුව සඳහා ඉඩ ප්‍රස්තා සලසන බවට සහතික විය යුතුය.

(2) ඉහත (1) වන උප නියෝගයෙහි සඳහන් අන්තර් හුවමාරුවේ මූලධර්ම මගින් :-

(අ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ II වන සහ/හෝ III වන පරිච්ඡේද වල වැඩපිළිවෙල යටතේ සහතික ලත් මුහුදු යාත්‍රාකරුවන් සහ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ VII වන පරිච්ඡේදය යටතේ සහතික ලත් මුහුදු යාත්‍රාකරුවන්ට ද සම්ප්‍රදායානුකූල වූ හෝ වෙනත් ආකාරයේ නෞකාස්ථ සංවිධාන (Shipboard Organizations) ඇති නෞකාවල සේවය කිරීමට හැකියාව ඇති බවට සහතික විය යුතුය ; සහ

(ආ) මුහුදු යාත්‍රාකරුවන්ට තම නිපුනතා වෙනත් ස්ථානකරා ගෙනයාම නොහැකි කරන්නා වූ ආකාරයට විශේෂිත නෞකාමය වැඩපිළිවෙල සඳහා මුහුදු යාත්‍රාකරුවන් පුහුණු නොකරන බවට සහතික විය යුතුය.

(3) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් සහතිකයක් නිකුත් කිරීමේ දී පහත දක්වා ඇති මූලධර්ම සැලකිල්ලට ගත යුතුය :-

(අ) විකල්ප සහතික නිකුත් කිරීම, හුදෙක් පහත දක්වා ඇති දේ සඳහා ; එනම් :-

(i) නෞකාවල නාවික පිරිස් සංඛ්‍යාව අඩු කිරීම ;

(ii) වෘත්තියේ යහපත්භාවය අඩු කිරීම හෝ මුහුදු යාත්‍රාකරුවන් නිපුනත්වයෙන් තොර වූවන් බවට පත් කිරීම ; සහ

(iii) යම් විශේෂ මුරකාවල අතරතුරදී, ඇංජින් කාමරයේ සහ නැව් තට්ටු මුරකාවල්හි නියුතු, නිලධරයන් එකතු කාර්ය, තනි සහතික දරන්නකුට පැවරීම ;

සඳහා භාවිත නොකළ යුතුය ; සහ

(ආ) අණ දෙන තැනැත්තා නෞකාධිපති ලෙස නමෝදිෂ්ඨ කරනු ලැබිය යුතුය ; තවද, විකල්ප සහතික දීම සඳහා වූ යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම මගින් නෞකාධිපතිවරයාගේ සහ අන් තැනැත්තන්ගේ අධිකාරයට බලපෑමක් නොවිය යුතුය.

*නිල නොලත් නැවියන්ට විකල්ප සහතික නිකුත් කිරීම*

16. (1) යාත්‍රාකරණයෙහි හෝ සමුද්‍ර ඉංජිනේරුමය කාර්යයන්හි ආධාරක මට්ටමේ සහතික අපේක්ෂා කරන අපේක්ෂකයන් විසින් අදාළ පුහුණුව සම්පූර්ණ කළ යුතු බවට නියම කරනු ලැබිය යුතු අතර STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II-4 හෝ A-III-4 යන වගු වලින් එක් වගුවක නියම කරනු ලැබ ඇති කර්තව්‍ය සම්බන්ධයෙන් ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය. එසේවුවද, අපේක්ෂකයා, උචිත පරිදි අමතර අදාළ පුහුණුව සම්පූර්ණ කොට අදාළ කර්තව්‍ය සම්බන්ධයෙන් ඉහත කී වගුවල නියම කරනු ලැබ ඇති ප්‍රවීනතා මට්ටම සපුරාලන්නේ නම්, අදාළ පරිදි STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III-4 හෝ A-II-4 වගුවේ නිශ්චිතව සඳහන් කර්තව්‍ය එකතු කරනු ලැබිය හැකිය.

(2) සමත් නැව් තට්ටු මුහුදු යාත්‍රාකරුවකු වශයෙන් (able Seafarer deck) ආධාරක මට්ටමින් සහතික අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකුම විසින් STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II-4 වගුවේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම පිළිපැදීමට අමතරව, අදාළ පුහුණුව ද සම්පූර්ණ කොට STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-II-5 වගුවේ නියම කරනු ලැබ ඇති සියලු කර්තව්‍ය සම්බන්ධයෙන් ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය. එසේවුවද, අපේක්ෂකයා විසින් උචිත පරිදි අමතර අදාළ පුහුණුව සම්පූර්ණ කොට, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ අදාළ වගුවේ හෝ වගුවල නියම කරනු ලැබ ඇති ප්‍රවීනතා මට්ටම සපුරා ලන්නේ නම් A-III-4 හෝ A-IV-5 වගුවේ නිශ්චිතව සඳහන් කර්තව්‍ය එකතු කරනු ලැබිය හැකිය.

(3) සමත්, ඇංජින් කාමර කාර්යයන්හි නියුතු නැවියන් ලෙස ආධාරක මට්ටමේ සහතික ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකුම විසින්, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-III-4 වගුවේ නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම පිළිපැදීමට අමතරව, අදාළ පුහුණුව සම්පූර්ණ කොට, A-III-5 වගුවේ නියම කරනු ලැබ ඇති සියලු කර්තව්‍ය සඳහා ප්‍රවීනතා මට්ටම් සපුරාලිය යුතුය. අපේක්ෂකයා විසින්, උචිත පරිදි අමතර අදාළ පුහුණුව සම්පූර්ණ කොට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ අදාළ වගුවේ හෝ වගුවල නියම කරනු ලැබ ඇති ප්‍රවීණතා මට්ටම සපුරාලන්නේ නම් A-II-4 හෝ A-II-5 හි නිශ්චිතව සඳහන් කර්තව්‍ය එකතු කරනු ලැබිය හැකිය.

(4) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-II-4 සහ A-III-4 වගුවල නිශ්චිතව සඳහන් කර්තව්‍ය සම්බන්ධයෙන් ආධාරක මට්ටමේ සහතික අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකු විසින් :-

(අ) (i) යාත්‍රාකරණ මුරසේවා කාර්ය හා සමග මාස 9 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; සහ

(ii) ඇංජින් කාමර කාර්ය හා සමග මාස 9 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම, යන ඒවායින් සංයුක්ත වූ මාස 18 කට නොඅඩු කාලයක පලපුරුද්ද ඇතුලත් වූ අනුමත මුහුදු ගමන් සේවයක් ; හෝ

(ආ) (i) යාත්‍රාකරණ මුරසේවා කාර්ය හා සමග මාස 3 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; සහ

(ii) ඇංජින් කාමර කාර්ය හා සමග, මාස 3 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම, යන ඒවායින් සමන්විත මාස 6 කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවා කාලයක් ඇතුළත් වූ පෙර මුහුදු හෝ නෞකාස්ථ විශේෂ පුහුණුවක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

(ඇ) ඉහත (අ) හෝ (ආ) ඡේද වලින් නියම කරනු ලබන මුහුදු ගමන් සේවා, පුහුණුව සහ පළපුරුද්ද, නිසි සුදුසුකම් ලත් නිලධරයකුගේ හෝ නිල නොලත් නැවියකුගේ සෘජු අධීක්ෂණය යටතේ ඉටු කරනු ලැබිය යුතුය.

(5) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ, A-II-5 සහ A-III-5 වගුවල නිශ්චිතව සඳහන් කර්තව්‍යයන්හි ආධාරක මට්ටමේ සහතික අපේක්ෂා කරන අපේක්ෂකයින්, යාත්‍රාකරණ මුරසේවා සහ ඇංජින් කාමර මුරසේවයේ කොටසක් ලෙස සේවය කිරීමට සුදුසුකම් ලැබීමට අමතරව STCW ව්‍යවස්ථා සංග්‍රහයෙහි A-II-5 සහ A-III-5 වගන්ති වල නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරා, පහත දක්වා ඇති දෑ, එනම් :-

(අ) (i) සමත් මුහුදු යාත්‍රා නැව් තට්ටු කාර්ය හා සම්බන්ධව, මාස 18 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; සහ

(ii) සමත් මුහුදු යාත්‍රාකරු - ඇංජින් කාර්ය හා සමග, (Able sea-farer Engine) මාස 12 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; යන ඒවායින් සමන්විත මාස 30 කට නොඅඩු කාලයක් ඇතුලුව අනුමත මුහුදු ගමන් සේවයක් ; හෝ

(ආ) (i) සමත් මුහුදු යාත්‍රා නැව් තට්ටු කාර්ය හා සමග, මාස 12 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; සහ

(ii) සමත් නාවික ඇංජින් යාත්‍රා කාර්ය හා සමග, මාස 9කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; යන ඒවායින් සංයුක්ත වූ අනුමත පුහුණු වැඩ සටහනක් සහ මාස 21කට නොඅඩු කාලයක අනුමත මුහුදු ගමන් සේවයක් ; හෝ

(ඇ) (i) සමත් මුහුදු යාත්‍රා කරු නැව් තට්ටු කාර්ය හා සමග මාස 6 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම ; සහ

(ii) සමත් මුහුදු යාත්‍රා කරු ඇන්ජින් කාර්ය හා සමග, මාස 6 කට නොඅඩු කාලයක් ආශ්‍රිතව කටයුතු කිරීම, යන ඒවායින් සමන්විත, ඒකාබද්ධ නැව් තට්ටු සහ ඇංජින් අංශයේ මාස 12 කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් ඇතුළත් අනුමත විශේෂ ඒකාබද්ධ, නැව් තට්ටු සහ ඇංජින් පුහුණු වැඩ සටහනක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

*මෙහෙයුම් තලයේ තැනැත්තන්ට විකල්ප සහතික නිකුත් කිරීම*

(6) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A - 11/1 සහ A - 111/1 වගුවල නිශ්චිතව සදහන් වූ කර්තව්‍ය සම්බන්ධයෙන්, එකී ව්‍යවස්ථා සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන යටතේ මෙහෙයුම් තලයේ සහතික සදහා ඉල්ලුම් කරන සියලු අපේක්ෂකයින්ට :-

(අ) සුදුසුකම් ලත් ඉංජිනේරු නිලධරයෙකුගේ අධීක්ෂණය යටතේ යටත් පිරිසෙයින් මාස හයක කාලයක් තුළ ඇංජින් කාමර කාර්යය ඉටු කිරීම ඇතුළුව, මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් සහ මුහුදු යාත්‍රා කරණ කර්තව්‍ය අවශ්‍ය කරනු ලබන අවස්ථාවන්හිදී, සුදුසුකම් ලත් පාලම් මුරකාවල් නිලධරයකුගේ අධීක්ෂණය යටතේ, යටත් පරිසෙයින් මාස හයක කාලයක් තුළ පාලම් මුරකාවල් සේවය ඉටු කොට තිබිය යුතුය ; සහ

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A - 11/1 සහ A - 111/1 වගන්තිවල නියමයන් සපුරාලන බවට අනුමත කළ නෞකාස්ථ පුහුණු වැඩසටහන්, තම සේවය ඇතුළත සම්පූර්ණ කොට තිබිය යුතු අතර අනුමත පුහුණු වාර්තා පොතක ලේඛණගත කොට තිබිය යුතුය.

*කළමනාකරණ තලයේ තැනැත්තන්ට විකල්ප සහතික නිකුත් කිරීම.*

(7) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A - 11/2 සහ A - 111/2 වගුවල නිශ්චිතව සිදහන් ඒකාබද්ධ කර්තව්‍ය සම්බන්ධයෙන්, කළමනාකරණ තලයේ සහතික සඳහා ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයෙකුටම, එකී සහතිකයේ පිටසන් කිරීමෙහි දැක්විය යුතු මෙහි පහත දක්වා ඇති කර්තව්‍ය වලට අදාළ අනුමත මුහුදු ගමන් සේවයක් තිබිය යුතුය ; එනම් :-

(අ) නෞකාවක යාන්ත්‍රික ප්‍රචලනය සම්බන්ධයෙන් අණ නිකුත් කිරීමේ බලතල හෝ වගකීම ඇති තැනැත්තන් නොවන තැනැත්තන් සඳහා උචිත පරිදි, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A - 111/2 සහ A - 111/3 නියෝගවලට අදාළ වූ මෙහෙයුම් තලයේ කාර්ය, මාස 12 ක කාලයක් ඉටු කිරීම සහ කළමනාකරණ තලයේ යාත්‍රාකරණය පිළිබඳ කාර්තව්‍ය අවශ්‍ය වන අවස්ථාවන්හිදි, යටත් පිරිසෙයින් මාස 12 ක කාලයක් තුළ මෙහෙයුම් තලයේ පාලම් මුරකාවල් සේවය ;

(ආ) නෞකාවක යාන්ත්‍රික ප්‍රචලනය සම්බන්ධයෙන් අණ නිකුත් කිරීමේ බලතල හෝ වගකීම ඇති තැනැත්තන් සඳහා, ඉහත (අ) ඡේදයේ විධිවිධාන ඇතුළුව සහතිකයේ පිටසන් කිරිමෙහි දැක්විය යුතු කර්තව්‍ය වලට අදාළ වූ කාර්ය, සහතික ලත් නිලධරයෙකු වශයෙන් ඉටුකිරීම අවශ්‍ය වන අතර එයින් මාස 24ක්, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A - 111/1 වගුවේ දක්වා ඇති කර්තව්‍ය ඉටුකරමින් සේවය කොට තිබිය යුතු අතරම, මාස 24ක්, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A - 111/1 සහ A - 111/2 වගුවල දක්වා ඇති කර්තව්‍ය ඉටුකරමින් සේවය කොට තිබිය යුතුය.

**මුහුදු සේවය ගණනය කිරීම**

*සියලු නිලධාරීන් සහ නිල නොලත් නැවියන්*

17. (1) යම් විශේෂ ප්‍රවීණතා සහතිකයක් හෝ පිටසනක් සඳහා නිලධරයන්ට සහ නිල නොලත් නැවියන් සඳහා දක්වා ඇති සුදුසුකම් ලැබීමේ මුහුදු සේවය, ප්‍රවීණතාව ඇගැයීම ආරම්භ වන දිනයට පූර්ව වූ දස අවුරුද්දක කාල පරිච්ඡේදය තුළ ඉටු කළ යුතු අතර, ප්‍රවීණතාව ඇගයීම ආරම්භවන දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහ ඇතුළත මාස 12ක මුහුදු සේවයක් ඊට ඇතුළත් විය යුතු ය.

(2) වාණිජ නොවන නෞකා, ටග් යාත්‍රා, ඩ්‍රෙජර් යාත්‍රා, පර්යේෂණ යාත්‍රා සුන්බුන් බේරා ගැනීමේ යාත්‍රා සහ නාවුක ආධාර ටෙන්ඩර් යාත්‍රා සහ ඊට සමාන කටයුතුවල යෙදී සිටින වෙනත් නෞකාවල කර ඇති සේවය, සම්පූර්ණයෙන් ගණන් ගත හැකි වන්නේ, නියම වශයෙන් මුහුදේ ගත කරන ලද කාලය, නැවේ ගත කළ මුළු කාලයෙන් තුනෙන් දෙකක් වන හෝ ඊට වැඩි කාලයක් වන විටය. නියම වශයෙන් මුහුදු සේවා කාලය මෙම ප්‍රමාණයට අඩු නම්, නියම වශයෙන් ඉටු කරන ලද මුහුදු සේවා කාලයෙන් එක හමාරක ගුණයක් සුදුසුකම් ලැබීමේ මුහුදු සේවා කාලය වශයෙන් ගණන් ගත හැකි යී සියලු අපේක්ෂකයන් විසින් සම්පූර්ණ කළ යුතුව ඇති මුහුදු සේවා කාලය සනාථ කිරීමේ සාක්ෂිවලට අතිරේකව, ඇත්ත වශයෙන්ම මුහුදු සේවයේ යෙදී සිටි කාල ප්‍රමාණය දක්වන නෞකාධිපතිගෙන් හෝ නැව් සමාගමෙන් හෝ ලබා ගත් ප්‍රකාශයක් හෝ සහතිකයක් ඉදිරිපත් කරන ලෙස අපේකෂකයන්ට නියම කරනු ලැබිය යුතු අතර, අධීක්ෂණය යටතේ යටත් පිරිසෙයින් මාස හයක මුර සේවයක් පිළිබඳව ද විශේෂයෙන් එහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) ඉහත සඳහන් සේවය ඉටු කර ඇත්තේ එක්තරා වර්ගවලට අයත් යාත්‍රාවල පමණක් නම්, ඔවුන්ගේ සහතික එවැනි යාත්‍රාවල සේවයට පමණක් සීමා කරනු ලැබිය හැකිය.

(4) සම්මුතියේ නියමයන්ට අනුකූලවෙමින්, කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචලන බලයකින් යුත්, මිනිස් සේවකයන් සහිත ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවල භාරව කටයුතු කරන නිලධරයන් ලෙස හෝ වාරික වශයෙන් මිනිස් සේවකයන් රහිතව ක්‍රියාකරන ඇංජින් කාමරයක නිලලත් කාර්යභාර ඉංජිනේරුවරයකු ලෙස, ප්‍රවීනතා සහතික දරන්නන් වීමට අපේක්ෂා කරන, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍රීය ඉංජිනේරු අංශයේ නිලධරයන්, අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කළයුතු බවට නියම කරනු ලැබිය යුතු ය. එකී අපේක්ෂකයා සතුව යම් පළපුරුද්ද, සුදුසුකම් සහ සහතික තිබේනම්, ඒවා, ප්‍රධාන ඉංජිනේරු පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ සුදුසුකම්ලත් මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම සඳහා පදනම විය යුතුය. ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවල නෞකාස්ථව කරනු ලබන මුහුදු සේවය, ප්‍රධාන ඉංජිනේරු පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයකින් යුත් නෞකාමත, මිනිස් සේවකයන් සහිත ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකුටි භාරව සිටින නිලධරයන් සඳහා හෝ වාරික වශයෙන් මිනිස් සේවකයන් රහිතව ක්‍රියාකරන ඇංජින් කාමරයක නිලලත් කාර්යභාර ඉංජිනේරුවරයකු සඳහා වන පරීක්ෂණ සඳහා, අනුමත මුහුදු සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) සම්මුතියේ නියමයන් සහ අනුකූලවෙමින් වෙරළාසන්න මුහුදු ගමන් සඳහා වූ ප්‍රවීනතා සහතික ලබාගැනීමට අදහස් කරනු ලබන, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍ර ඉංජිනේරු අංශයේ සුලු නිලධරයන් සහ ඇංජින් කාමර ශිල්පීන් විසින් අනුමත අදාළ අධ්‍යාපන, පුහුණු, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කළයුතු බවට නියම කරනු ලැබිය යුතු ය. එවැනි අපේක්ෂකයකුගේ දැනට පවත්නා පළපුරුද්ද සුදුසුකම් සහ සහතික තිබේනම් ඒවාද, ප්‍රධාන ඉංජිනේරු පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසු වෙළඳ නාවික මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම නිශ්චය කිරීමේ පදනම විය යුතු යී ප්‍රධාන ඉංජිනේරු පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ශ්‍රී ලංකා නාවික හමුදා නෞකාවල නෞකාස්ථව ඉටු කරනු ලබන මුහුද සේවය, කිලෝවොට් 750ක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයකින් යුත් නෞකාවල මිනිස් සේවයකයන් සහිත ඇංජින් කාමරයක ඉංජිනේරු මුරකාවල භාරව කටයුතු කරන නිලධරයන්ගේ හෝ වාරික වශයෙන් මිනිස් සේවකයන් රහිතව ක්‍රියාකරන ඇංජින් කාමරයක නිලලත් කාර්යභාර ඉංජිනේරුවරයන්ගේ පරීක්ෂණ සඳහා, අනුමත මුහුදු සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) සම්මුතියේ නියමයන්ට අනුකූල වෙමින් දළ ටොන් 500ක් හෝ ඊට වැඩි නෞකාවල මුහුදු යාත්‍රාකරණ මුරකාවල භාරව කටයුතු කරන නිලධරයකු ලෙස ප්‍රවීනතා සහතිකයක් ලබාගැනීමට අදහස් කරනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක අංශයේ නිලධරයන් විසින්, අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, විභාග සහ ඇගයීම් සම්පූර්ණ කරනු ලැබිය යුතුය. එවැනි අපේක්ෂකයකුගේ පළපුරුද්ද, සුදුසුකම්, සහ සහතික තිබේනම් එකී සහතික ද, අදාළ නෞකාධිපතිවරුන්ගේ සහ උප නැව්පති වරුන්ගේ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසුකම් ලබන වෙළඳනැව් මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම් නිශ්චය කිරීමේ පදනම විය යුතු ය. දළ ටොන් 500ක් හෝ ඊට වැඩි ප්‍රචාලන බලයෙන් යුත් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකාවක නෞකාස්ථව ඉටුකරන ප්‍රචාලන කාලය ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි අනුමත මුහුදු සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) සම්මුතියේ නියමයන්ට අනුකූලවෙමින් දළ ටොන් 3000ට අඩු ප්‍රචාලන බලයකින් යුත් වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල යාත්‍රාකරණ මුරසේවය භාර නිලධරයකු ලෙස ප්‍රවීනතා සහතික දරන තැනැත්තකුවීමට අදහස් කරන ශ්‍රී ලාංකික නාවික හමුදාවේ විධායක නිලධර අංශයේ නිලධරයන් විසින්, අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, පරීක්ෂණ සහ ඇගයීම් සම්පූර්ණ කළ යුතු බවට නියම කරනු ලැබිය යුතුය. එවැනි අපේක්ෂකයකුගේ පවත්නා පළපුරුද්ද, සුදුසුකම් සහ යම් සහතික තිබේනම් එකී සහතිකද අදාළ නෞකාධිපතිවරුන්ගේ සහ උප නැව්පතිවරුන්ගේ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සුදුසුකම් ලබන වෙළඳ නෞකා මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම් නිශ්චය කිරීමේ පදනම විය යුතුය. අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි දළ ටොන් 500ත් 3000ත් අතර වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකාවල නෞකාස්ථව වෙරළාසන්න මුහුදු ගමන් මගින් ඉටු කරනු ලබන ප්‍රචලන කාලයෘ අනුමත මුහුදු සේවය ලෙස සලකනු ලැබේ.

(8) සම්මුතියේ නියමයන්ට අනුකූලවෙමින් දළ ටොන් 500ට අඩු නෞකාවල යාත්‍රාකරණ මුරකාවල භාර නිලධරයකු ලෙස ප්‍රවීනතා සහතික ලබාගැනීමට අදහස් කරන ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක නිලධාරී අංශයේ සුලු නිලධරයන් විසින්, අනුමත අදාළ අධ්‍යාපනය, පුහුණුව, විභාග සහ ඇගැයීම් සම්පූර්ණ කළ යුතු බවට නියම කරනු ලැබිය යුතුය. එවැනි අපේක්ෂකයකුගේ පවත්නා පළපුරුද්ද, සුදුසුකම් සහ යම් සහතික ඇත්නම් එකී සහතික ද, නෞකාධිපතිගේ සහ උපනැව්පතිගේ අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින්

නිශ්චය කරනු ලබන පරිදි, සුදුසුකම් ලබන වෙළඳ නැව් මුහුදු ගමන් සේවය, පුහුණුව සහ ඇගයීම නිශ්චය කිරීමේ පදනම විය යුතු ය. අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ දළ ටොන් 500ට අඩු ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකාවල නෞකාස්ථව ඉටුකරනු ලබන ප්‍රචලන කාලය, අනුමත මුහුදු සේවය ලෙස සලකනු ලැබිය යුතුය.

*නැව් තට්ටු නිලධරයන් සහ නිල නොලත් නැවියන්*

18. (1) නැව් තට්ටු නිලධරයන් සහ නිල නොලත් නැවියන් සඳහා සුදුසුකම් ලැබීමේ මුහුදු සේවය යන්නෙන්, නැවේ සේවයට බඳවා ගන්නා ලද දින සිට ඒ සේවයෙන් මුදාහළ දිනය දක්වා නැව්වල ගත කළ කාලය අදහස් වේ.

(2) වරායේ හෝ නැව් තටාකයේ හෝ නවත්වා ඇති නෞකාවල හෝ ඉදිකිරීම් කටයුතු කරගෙන යන නෞකාවල හෝ නැංගුරම් ලා ඇති නෞකාවල හෝ නෞකාස්ථව කරනු ලබන සේවය, සුදුසුකම් ලැබීමේ මුහුදු සේවයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතුය. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම්, යමෙක් සේවය කළ නෞකාවල ඔහු ඉටු කළ සේවා මුහුදු සේවා ලෙස ගණන් ගනු ලැබීමට සුදුසු බව සහතික කරමින් ඒ නෞකාවල නෞකාධිපතිවරයන් විසින් අත්සන් කරන ලද ප්‍රකාශ මගින් සනාථ කරනු ලැබිය යුතු ය. මේ ශීර්ෂය යටතේ සුදුසුකම් ලැබීමේ මුහුදු සේවය මාස තුනකට වැඩි නොවිය හැකි ය.

(3) මුර වාර දෙකක් ඇති නෞකාවක ප්‍රවීණතා සහතිකයක් දරමින් උපරිමය මාස හයක කාලයක් ඉටු කළ මුර සේවය, සැබැවින්ම ඉටු කළ සේවා කාලය මෙන් එකයි පහෙන් එකක කාලයක සේවයක් ලෙස ගණන් ගනු ලැබිය හැකිය.

*සමුද්‍රීය ඉංජිනේරු නිලධරයන් සහ ඇංජින් කාමරවල නියුතු නිල නොලත් නැවියන්*

19. (1) වෙනත් ආකාරයකට ප්‍රකාශ කර ඇත්තේ නම් මිස, නාවුක ඉංජිනේරු නිලධරයන් සහ ඇන්ජින් කාමරවල නියුතු නිල නොලත් නැවියන් සඳහා වූ සුදුසුකම් ලැබීමේ මුහුදු සේවා යන්නෙන්, පහත (2) වන උප නියෝගයට යටත්ව ප්‍රචාලන යන්ත්‍රෝපකරණ සහිත නෞකාවල සහ/හෝ සහායක යන්ත්‍රෝපකරණ පූර්ණ වශයෙන් භාවිත කරන නැව්වල සේවයට බඳවා ගනු ලැබූ දින සිට ඔවුන් සේවයෙන් මුදා හරින ලද දිනය දක්වා නෞකාවල ගත කළ කාලය අදහස් වේ.

(2) සම්පූර්ණ සේවා කාලයම හෝ ඉන් කොටසක්, ප්‍රමාණවත් කාලයක් තුල යාත්‍රා කිරීමේ නොයෙදූ නැව්වල ඉටුකර ඇති අවස්ථාවලදී ඇත්ත වශයෙන්ම යාත්‍රා කිරීමට යොදවනු ලැබූ කාලය දින වශයෙන් සඳහන් කරමින් ඒ නැවේ නෞකාධිපති විසින් නිකුත් කරන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවල දී, යාත්‍රා කිරීම සඳහා ඇත්ත වශයෙන්ම යොදවා තිබුණ දින ගණන මෙන් එකහමාරක ගුණයක් සුදුසුකම් ලැබීමේ මුහුදු සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබිය හැකි අතර, කිසිම අවස්ථාවකදී අදාළ කාල පරිච්ඡේදය තුළ දී සැබවින්ම නැවේ ගත කළ කාලයට වඩා එය නොවැඩි විය යුතු ය.

(3) සම්ප්‍රදායානුකූල මුර සේවා ක්‍රමචර්යා නොවන කටයුතුවල යොදන ලද නෞකාවල වැඩ පරිචයන්හි නියුක්ත කරනු ලැබූ ඉංජිනේරු නිලධාරීන් විසින් ඉටු කරන ලද මුහුදු සේවය මගින් නියමිත පළපුරුද්දට සමාන පළපුරුද්දක් ලැබෙන බවට අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා සෑහීමට පත්වන්නේ නම්, එවැනි මුහුදු සේවයක් සුදුසුකම් ලැබීමේ මුහුදු සේවය ලෙස පිළිගනු ලැබිය හැකිය.

*පරීක්ෂණ*

20. (1) මේ නියෝග යටතේ ප්‍රවීණතා සහතිකයක් හෝ පිටසනක් හෝ අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකුම විසින්, ඒ සහතිකය හෝ පිටසන හෝ ප්‍රදානය කරනු ලැබීම සඳහා අවශ්‍ය ප්‍රවීණතාව තමා විසින් ලබා ගෙන ඇති බවට, ලිඛිත පරීක්ෂණයකදී හෝ වාචික පරීක්ෂණයකදී හෝ ලිඛිත හා වාචික යන දෙයාකාරයේම වූ පරීක්ෂණයක දී ප්‍රධාන පරීක්ෂකවරුන් සෑහීමට පත් කළ යුතු ය.

(2) ප්‍රවීණතා සහතික සහ පිටසන් සඳහා වූ විභාග සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත්, ඒවා සනාථ කිරීමේ ලේඛන සමග, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන්නාවූද කලින් කල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතිශෝධනය කරනු ලැබිය හැක්කා වූ ද වූ පරීක්ෂණ ගාස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට සෑම අපේක්ෂකයකුම විසින් ගෙවනු ලැබිය යුතුය. පරීක්ෂණ සඳහා සියලුම සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්නම් සුදුසුකම් ලබා ඇති බවට දැන්වීමක් නිකුත් කළ යුතු අතර, එවැනි දැන්වීමක් මගින් ඒ අපේක්ෂකයාට පරීක්ෂණයට පෙනී සිටීමට බලය දෙනු ලැබේ.

(3) පරීක්ෂණය පවත්වන දිනය සහ ස්ථානය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසුකම් ලත් එක් එක් අපේක්ෂකයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(4) පරීක්ෂණය සඳහා වූ විෂයයන් සහ විෂය නිර්දේශයන් කවරේදැයි ප්‍රධාන පරීක්ෂකවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අතර ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබූ ප්‍රමිති අනුගමනය කිරීමේ කාර්යය සඳහා ඒවා කලින්කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකිය.

(5) පරීක්ෂණ නිසියාකාරව පැවැත්වීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ සියලු ක්‍රියා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

(6) ප්‍රවීණතාව හෝ පිටසන හෝ සඳහා වූ ඇගැයීමෙන් අසමත් වන අපේක්ෂකයකු නැවත පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ගැනීමට පෙර මුහුදු සේවා කාල පරිච්ඡේදයක් සම්පූර්ණ කරන ලෙස කරනු ලබන නියමයක් ඇතුළත් වන කාල දණ්ඩනයක්, ප්‍රධාන පරීක්ෂකවරයාගේ අභිමතය පරිදි, ඒ අපේක්ෂකයා මත පනවනු ලැබිය හැකි ය.

*නිදහස් කිරීම්*

21. යම් නැවක විශාලත්වය, බල වේගය සහ එහි ගමන්වල තත්ත්වයන් කවර ස්වභාවයකද යත්, ඒ මගින් මේ නියෝගවල නියමයන් සම්පූර්ණයෙන් අදාළ කිරීම අයුක්ත සහගත වන්නේ යයි හෝ ප්‍රායෝගික නොවන්නේ යයි අදාළ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් සලකනු ලබන විටෙක, ඒ එක් එක් අවස්ථාවට අදාළ පරිවේෂණ සැලකිල්ලට ගෙන සහ එම මුහුදු ප්‍රදේශයේ යාත්‍රා කරන වෙනත් නෞකාවල ආරක්ෂාව කෙරෙහි සිත් යොමුකොට, එම ප්‍රධාන පරීක්ෂකවරයා විසින්, එවැනි නෞකාවක හෝ නැව් පන්තියක හෝ නෞකාධිපතිවරුන් හා නිලධරයන්, සම්මුතියේ එකී නියමයන්ගෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

*විශේෂ අවසර දීම*

22. අතිවිශේෂ අවශ්‍යතාවක් පැන නැගී ඇති අවස්ථාවක දී, යම් තත්ත්වයක් දැරීම සඳහා සුදුසු සහතිකයන් නොදරන්නාවූ ද විශේෂ අවසරයෙහි නම් කර ඇත්තා වූ ද මුහුදු යාත්‍රාකරුවකුට යම් නිශ්චිත නෞකාවක මාස හයකට නොවැඩි වන නිශ්චිත කාලයක් එම තත්ත්වය දරමින් සේවය කිරීම සඳහා විශේෂ අවසරයක් සම්මුතියේ VIII වන වගන්තියට අනුකූලව ප්‍රධාන පරීක්ෂකවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. තවද, එවැනි විශේෂ අවසරයක් නිකුත් කරනු ලබන තැනැත්තා ඒ පුරප්පාඩු වී ඇති තනතුර සතුටුදායක ලෙස පිරවීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් ලබා ගෙන ඇත්තේ නම් සහ ප්‍රධාන පරීක්ෂකවරයාගේ මතය අනුව, එමගින් පුද්ගලයන්ට, දේපළවලට හෝ පරිසරයට අනතුරක් නොසිදුවන්නේ නම් පමණක් එවැනි විශේෂ අවසරයක් නිකුත් කළ යුතු ය.

*නැවත වලංගු කිරීම*

23. (1) සම්මුතියේ VI වන පරිච්ඡේදය හැර වෙනත් කවර හෝ පරිච්ඡේදයන් යටතේ නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ සහතිකයක් දරන, මුහුදු සේවයේ නියුතු හෝ වෙරළ සේවයේ කලක් සේවයේ යෙදී සිට නැවත මුහුදු සේවයට අවතීර්ණ වීමට අදහස් කරනු ලබන සෑම නෞකාධිපතිවරයකු, නිලධරයකු හෝ ගුවන් විදුලි ක්‍රියාකරුවකු විසින් මුහුදු ගමන් සේවයේ යෙදී සිටීම දිගටම සුදුසුකම් ලැබීම සඳහා, අවුරුදු පහක් නොඉක්මන කාලාන්තරයන්හි දී-

(අ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ 1/9 නියෝගය මගින් නියම කරනු ලැබූ වෛද්‍ය යෝග්‍යතා මට්ටම සපුරාලිය යුතුය.

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/11 වගන්තියට අනුකූලව අඛණ්ඩ වෘත්තීය ප්‍රවීනතාව ස්ථාපිත කළ යුතුය.

(2) සෑම නෞකාධිපතිවරයකු, නිලධරයකු සහ ගුවන් විදුලි ක්‍රියාකරුවකු විසින්, විශේෂ පුහුණු නියමයන් ජාත්‍යන්තරව එකඟවනු ලැබ ඇත්තේ යම් නෞකා සම්බන්ධයෙන්ද, එකී නෞකාවල නෞකාස්ථ මුහුදු ගමන් සේවයේ අඛණ්ඩව නියැලීම සඳහා, අනුමත අදාළ පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කල යුතුය.

(3) සෑම නෞකාධිපතිවරයකුම සහ නිලධරයකුම විසින් ටැන්කරවල නෞකාස්ථ මුහුදු ගමන් සේවයෙහි අඛණ්ඩව නියැලීම සඳහා (1) වන උප නියෝගයෙහි අවශ්‍යතා සපුරාලිය යුතු අතර STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/11 වන වගන්තිය 3 වන ඡේදය හා අනුකූලව අවුරුදු පහක් නොඉක්මවන කාලාන්තරවලදී ටැංකර සඳහා අඛණ්ඩ වෘත්තීය ප්‍රවීනතාව ස්ථාපිත කළ යුතුය.

(4) GMDSS සාමාන්‍ය ක්‍රියාකරුවන්ගේ පිටසන අවුරුදු පහකට වරක් වශයෙන් වූ කාලාන්තර වලින් නැවත වලංගු කිරීම කළ යුතු අතර එසේ වුවද, යලි වලංගු කිරීමේ දිනයට පෙරාතුව වූ අවුරුදු පහ ඇතුළත ගුවන් විදුලි ක්‍රියාකරුට, අදාළ තත්ත්වයෙන් මාස දොළහක මුහුදු සේවයක් තිබිය යුතු ය.

(5) 1998 ජූලි 17 දින සහ අංක 1036/21 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1998 වෙළඳ නැව් (පුහුණු කිරීම්, සහතික දීම සහ මුරකාවලෙහි යෙදීම) නියෝග යටතේ නෞකාධිපතිවරුන්, නිළධරයන් සහ ගුවන් විදුලි ක්‍රියාකරුවන් ලෙස නිකුත් කරනු ලැබූ හෝ නැවත වලංගු කරනු ලැබූ ප්‍රවීනතා සහතික දරන සියලු තැනැත්තන් විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එක් එක් සිද්ධියේ අවස්ථානුගතයන් සැලකිල්ලට ගනිමින් නිශ්චය කරනු ලබන පරිදි වූ නිසි සංස්කරණ හෝ යථාවත් කිරීමේ පාඨමාලාවන් හැදෑරීම නියමිත වන අතර, එසේ කිරීම මගින් මේ නියෝගවල දක්වා ඇති පරිදි උචිත සහතික සඳහා නිශ්චිතව සඳහන් ප්‍රවීනතා මට්ටම සපුරා ඇතිබවට අධ්‍යක්ෂජනරාල්වරයා සෑහීමට පත්කල යුතුයි තවද සහතිකලත් තැනැත්තකුගේ තත්ත්වයෙන්, මුහුදු ගමන්හි නියුතු නෞකාවක නෞකාස්ථව සේවය කිරීමට

හැකිවීම දිගටම කරගෙන යාමට සහතිකය දරන්නා අදහස් කරන්නේ නම්, අදාළ සහතිකය හෝ පිටසන නැවත වලංගු කරගැනීම පිණිස 2016 දෙසැම්බර් 31 වන දින හෝ එදිනට පෙර ඉල්ලුම් කළ යුතු ය.

(6) සම්මුතියට අනුකූලව මේ නියෝග යටතේ නෞකාධිපතිවරුන්, නිලධරයන් හෝ ගුවන් විදුලි ක්‍රියාකරුවන් වශයෙන් නිකුත් කරනු ලැබූ හෝ නැවත වලංගු කරනු ලැබූ ප්‍රවීනතා සහතික හෝ පිටසන් කිරීම් වලංගුවන්නේ අවුරුදු පහකට පමණක් වන අතර, ඒවා දරන්නා මුහුදු ගමනේ යෙදෙන නෞකාවක නෞකාස්ථ සේවයේ යෙදීම දිගටම කරගෙන යන්නේ නම් නැවත වලංගු කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය. ප්‍රවීනතා සහතික, එය අවසන් වන දිනයට පෙරාතුවම වූ මාස හය ඇතුළත නැවත වලංගුකරගත හැකි වන අතර එවැනි විටෙක වලංගු කල දිනයේ හෝ වලංගු කිරීම දීර්ඝකරන ලද දිනයේ පස්වන සංවත්සරය තෙක් සහතිකය නැවත වලංගු කළ හැකිවේ.

(7) මේ නියෝග යටතේ නිකුත් කරනු ලැබූ නිපුනතා සහතික, සම්බන්ධයෙන් නියම කරනු ලැබූ ප්‍රවීනතා මට්ටම පවත්වාගෙන ගිය බවට සාක්ෂි එකී සහතික නිකුත් කළ දින සිට සෑම පස් අවුරුද්දකට වරක්, ඉදිරිපත් කල යුතුය.

(8) 1998 වෙළඳනැව් (පුහුණු කිරීම්, සහතික දීම් සහ මුරකාවලෙහි යෙදීම) නියෝග යටතේ නිකුත්කරන ලද සහතික සහ පිටසන් කිරීම් 2016 දෙසැම්බර් මස 31 වන දින තෙක් නැවත වලංගු කල යුතු ය.

*වෘත්තීය ප්‍රවීණතා*

24. (1) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ I/II නියෝගය යටතේ නියම කරනු ලැබ ඇති අඛණ්ඩ වෘත්තීය ප්‍රවීණතාව :-

(අ) (i) පෙරාතුව වූ අවුරුදු පහ තුළදී එකතුව මාස දොළහක්වන කාලයක් ; හෝ

(ii) නැවත වලංගු කිරීමට පෙරාතුවම වූ මාස හය ඇතුළතදී එකතුව මාස තුනක් වන කාලයක්,

දරනු ලබන සහතිකයට අනුරූපව අනුමත මුහුදු ගමන් සේවා හා ඉටුකරනු ලබන කර්තව්‍ය මගින් ; හෝ

(ආ) ඉහත (අ) (i) ඡේදයෙන් නියම කරනු ලබන මුහුදු ගමන් සේවයට සමාන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන කර්තව්‍ය ඉටුකරනු ලැබීමෙන් ; හෝ

(ඇ) අනුමත පරීක්ෂණයක් සමත් වීමෙන් ; හෝ

(ඈ) අනුමත පුහුණු පාඨමාලාවන් හෝ පාඨමාලා සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් ; හෝ

(ඉ) අනුමත මුහුදු ගමන් සේවය සම්පූර්ණ කිරීමෙන් පසු සේවකයකුගේ අතිරේක සේවකයෙකුගේ හෝ සහතිකය දරනු ලබන්නේ යම් නිලයකට අදාළවද, එකී නිලයට වඩා පහළ නිලයක් දරමින්, මාස තුනකට නොඅඩු කාලයක් සහතිකයට උචිත කර්තව්‍ය ඉටුකිරීමෙන්,

සනාථ කළ යුතු ය.

(2) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ I/11 නියෝග මගින් නියම කරනු ලැබූ සංස්කරණ සහ යාවත්කාල කිරීමේ පාඨමාලා අනුමත කරනු ලැබිය යුතු අතර, මුහුදු ජීවිතයේ සුරක්ෂිත භාවය, ආරක්ෂාව සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂාකිරීමටද අදාළවූ ජාතික සහ ජාත්‍යන්තර නියෝගවලට සිදුකොට ඇති වෙනස්කම් ද ඇතුළත් විය යුතුය. තවද, අදාළ ප්‍රවීණතා මට්ටම් යාවත්කාලීන කිරීම පිළිබඳවද සැලකිලිමත් විය යුතුය.

(3) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ 1/11 නියෝගය 3 වන ඡේදය යටතේ නියම කරනු ලැබ ඇති පරිදි වූ, ටැංකර නැව් සඳහා වන අඛණ්ඩ වෘත්තීය ප්‍රවීණතාව :-

(අ) පෙරාතුව වූ අවුරුදු පහක කාලය තුළ යටත් පිරිසෙයින් මාස තුනක එකතු කාලයක් සඳහා, අනුමත මුහුදු සේවය හෝ දරනු ලබන ටැංකර සහතිකය හෝ පිටසන් කිරීමට උචිත වූ කාර්ය ඉටුකිරීමෙන් ; හෝ

(ආ) යම් අනුමත අදාළ පුහුණු පාඨමාලාවක් හෝ පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් ; හෝ

මගින් සනාථ කළ යුතු ය.

*අනුකාරක භාවිතය*

25. STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/12 වගන්තියේ දක්වා ඇති කාර්ය ඉටු කිරීමේ ප්‍රමිති සහ වෙනත් විධිවිධාන සහ අදාළ සහතිකයක් සඳහා කවර හෝ සහතිකයකට අදාළව STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A කොටසේ නියම කරනු ලැබ ඇති වෙනත් නියමයන් ද :-

(අ) සියලු අනිවාර්ය අනුකාරක පදනම් වූ පුහුණු කිරීම්

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A කොටස මගින් නියම කරනු ලැබ ඇති, අනුකාරක මගින් කරගෙන යනු ලබන ප්‍රවීනතා ඇගයුම් ; සහ

(ඇ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A කොටස මගින් නියම කරනු ලැබ ඇති අඛණ්ඩ දක්ෂතා සඳහා අනුකාරක මගින් කරනු ලබන ප්‍රදර්ශන,

සම්බන්ධයෙන් පිළිපැදිය යුතු ය.

*සියලුම මුහුදු යාත්‍රාකරුවන් ආරක්ෂාව පිළිබඳ හුරුකරවීම, මූලික පුහුණුව හා උපදෙස් සම්බන්ධයෙන් අනිවාර්යෙන් සපුරාලිය යුතු අවම අවශ්‍යතා*

26. (1) නැවක නෞකාස්ථ රාජකාරි කටයුතු පැවරීමට පෙර, නැවේ මගීන් නොවන, සේවයේ යොදවන ලද හෝ කාර්ය පවරන ලද සියලු තැනැත්තන්ට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වන වගන්තියට අනුකූලව හුරුකරවීම සහ ආරක්ෂාව පිළිබඳ මූලික පුහුණුවක් හෝ උපදෙස් දෙනු ලැබිය යුතු අතර, එකී වගන්තියේ නිශ්චිතව සඳහන් යෝග්‍ය ප්‍රවීණතා මට්ටම් සපුරාලිය යුතු ය. හුරුපුරුදුව පිළිබඳ යෝග්‍ය මට්ටමේ දැනුමැති සහ මූලික ආරක්ෂක පුහුණුව ලබාගත් සියලු තැනැත්තන් පිළිබඳ වාර්තාවක් නෞකාවේ නෞකාධිපතිවරයා විසින් සහ සමාගම විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතුය.

(2) නෞකාස්ථ කටයුතුවලදී අනුපූරක කාර්ය වශයෙන් ආරක්ෂාව සැපයීමේ කාර්ය හෝ නෞකාව ක්‍රියාකරවීමේ දී පරිසර දූෂණය වළක්වාලීමේ කාර්යවල නිරතවීම සඳහා කවර හෝ තත්ත්වයකින් සේවයේ යොදවනු ලැබූ හෝ කාර්ය පවරනු ලැබූ හෝ මුහුදු යාත්‍රාකරුවන්ට නැවේ එවැනි කාර්යභාර පැවරීමට පෙර, පෞද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුව), ගිනි නිවාරණය හා ගිනි නිවීම (ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුව), මූලික ප්‍රථමාධාර (STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුව), සහ පෞද්ගලික ආරක්ෂාව හා සමාජයීය වගකීම් (STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුව) පිළිබඳ අනුමත කළ මූලික පුහුණුවක් ලබාදිය යුතු ය.

(3) පහත දක්වා ඇති 4 සිට 6 දක්වා වූ උපනියෝගවලට අනුකූලව සුදුසුකම්ලත් මුහුදු යාත්‍රාකරුවන්, සෑම අවුරුදු පහකට වරක්ම, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුවේ සහ A-VI/1-2 වගුවේ 1 වන තීරුවේ ලැයිස්තු ගතකොට ඇති වැඩ, කාර්ය සහ වගකීම් බාරගැනීම සඳහා නියමිත ප්‍රවීනතා මට්ටම් පවත්වාගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

*පෞද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(4) පෞද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ නිපුනතා සහතික ඉල්ලුම්කරන සෑම අපේක්ෂකයකුම :-

(i) පෞද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතුය; සහ

(ii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-1 වගුවේ දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය.

*ගිනි නිවාරණය සහ ගිනි නිවීම පිළිබඳ නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(5) ගිනි නිවාරණය සහ ගිනි නිවීම පිළිබඳ නිපුනතා සහතික අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකුම :-

(i) ගිනි නිවාරණය සහ ගිනි නිවීම පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතුය ; සහ

(ii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-2 වගුවේ දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය.

*මූලික ප්‍රථමාධාර පිළිබඳ නිපුනතා සහතික නිකුත් කිරිම සඳහා වූ අවම නියමයන්*

(6) මූලික ප්‍රථමාධාර පිළිබඳ නිපුණතා සහතික ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම :-

(i) මූලික ප්‍රථමාධාර පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතු ය ; සහ

(ii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-3 වගුවේ දක්වා ඇති ප්‍රවීනතා මට්ටම සපුරා තිබිය යුතුය.

*පෞද්ගලික ආරක්ෂාව සහ සමාජයීය වගකීම් පිළිබඳ නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(7) පෞද්ගලික ආරක්ෂාව හා සමාජයීය වගකීම් පිළිබඳ නිපුණතා සහතික ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයෙකුම :-

(i) පෞද්ගලික ආරක්ෂාව සහ සමාජයීය වගකීම් පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතුය ; සහ

(ii) STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1-4 වගුවේ දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය.

*ගැලවීමේ යාත්‍රා සහ වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු නොවන ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ, නිපුනතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(8) (අ) ගැලවීමේ යාත්‍රා සහ වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු නොවන ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතා සහතික ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම :-

(i) පාඨමාලාව අවසන්වන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු ය.

(ii) මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් හෝ අනුමත පූර්ව මුහුදු පුහුණු පාඨමාලාවන්ට සහභාගීවනු ලැබ, මාස හයකට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් හෝ තිබිය යුතුය.

(iii) ගැලවීම පිළිබඳ අනුමත නිපුණතා පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතුය.

(ආ) ගැලවීමේ යාත්‍රා සහ වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු නොවන ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතා සහතික දරන මුහුදු යාත්‍රාකරුවන්, සෑම අවුරුදු පහකට වරක්ම STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-1 වගුවේ I වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති වැඩ, කාර්ය, සහ වගකීම් බාරගැනීම සඳහා නියමිත ප්‍රවීණතා මට්ටම් පවත්වාගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

*වේගවත්, ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳව නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(9) (අ) වේගවත්, ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳව නිපුණතා සහතික ඉල්ලුම් කරන සෑම අපේකෂකයකුම:-

(i) ගැලවීමේ යාත්‍රා සහ වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු නොවන ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතා සහතිකයක් දරන්නකු විය යුතු ය ;

(ii) වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතුය ; සහ

(iii) වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතා සහතික සඳහා STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-2 වගුවේ 7 සිට 10 දක්වා වූ ඡේදවල දක්වා ඇති ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය.

(ආ) වේගවත් ජීවිතාරක්ෂක බෝට්ටු පිළිබඳ නිපුණතා සහතික දරන මුහුදු යාත්‍රාකරුවන් සෑම අවුරුදු පහකට වරක්ම STCWව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/2-2 වගුවේ 1 වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති වැඩ, කාර්ය, සහ වගකීම් බාරගැනීම සඳහා නියමිත ප්‍රවීණතා මට්ටම පවත්වාගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

*උසස් ගිනි නිවීමේ ක්‍රමෝපාය පිළිබඳ නිපුණත්ව සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(10) (අ) ගිනි නිවීමේ මෙහෙයුම් පාලනය කිරීම සඳහා නම් කරනු ලැබ සිටින්නාවූ මුහුදු යාත්‍රාකරුවන්, උසස් ගිනි නිවීමේ ක්‍රමෝපාය පිළිබඳ නිපුණත්ව සහතිකයක් දැරිය යුතු ය ;

(ආ) උසස් ගිනි නිවීමේ ක්‍රමෝපාය පිළිබඳ නිපුණත්ව සහතික ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම -

(i) උසස් ගිනි නිවීමේ ක්‍රමෝපාය සඳහා වූ අනුමත පාඨමාලාවකට සහභාගී විය යුතු ය ; සහ

(ii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගන්තියේ 1 සිට 4 දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතුය.

(ඇ) උසස් ගිනි නිවීමේ ක්‍රමෝපාය පිළිබඳ නිපුණතා සහතික දරන මුහුදු යාත්‍රාකරුවන් සෑම අවුරුදු පහකට වරක්ම STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/3 වගුවේ I වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති වැඩ, කාර්ය, සහ වගකීම් බාරගැනීම සඳහා නියමිත ප්‍රවීණතා මට්ටම පවත්වාගෙන ගිය බවට, සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

*වෛද්‍ය ප්‍රථමාධාර පිළිබඳ නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(11) (අ) නෞකාස්ථ වෛද්‍ය ප්‍රථමාධාර සැපයීම සඳහා නම්කරනු ලැබූ නැවියන් විසින් වෛද්‍ය ප්‍රථමාධාර පිළිබඳව නිපුණත්ව සහතිකයක් දැරිය යුතු ය ;

(ආ) වෛද්‍ය ප්‍රථමාධාර පිළිබඳ නිපුණතා සහතිකයක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකුම :-

(i) වෛද්‍ය ප්‍රථමාධාර පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතු ය ; සහ

(ii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/4 වගන්තියේ, 1 සිට 3 දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් කොට ඇති ප්‍රවීණතා මට්ටම් සපුරා තිබිය යුතුය.

*වෛද්‍යාධාර සැපයීම පිළිබඳ නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(12) (අ) නෞකාස්ථ වෛද්‍ය ප්‍රථමාධාර සැපයීම සඳහා නම්කරනු ලැබූ මුහුදු යාත්‍රාකරුවන් වෛද්‍ය ප්‍රථමාධාර පිළිබඳව නිපුනත්ව සහතිකයක් දැරිය යුතු ය.

(ආ) වෛද්‍ය ප්‍රථමාධාර සැපයීම පිළිබඳ නිපුණත්ව සහතිකයක් අපේක්ෂා කරන සෑම අපේක්ෂකයකුම :-

(i) වෛද්‍ය ප්‍රථමාධාර සැපයීම පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතු ය ;

(ii) STCW සංග්‍රහයේ A-VI/4 වගන්තියේ, 4 සිට 6 වන ඡේදවල නිශ්චිතව සඳහන් කොට ඇති නිපුණතා මට්ටම් සපුරා තිබිය යුතුය.

*නැව් ආරක්ෂක නිලධරයන් ලෙස නිපුණතා සහතික නිකුත් කිරීම සඳහා නියමිත අවම අවශ්‍යතා*

(13) (අ) නැව් ආරක්ෂක නිලධරයන් ලෙස නම් කරනු ලැබූ මුහුදු යාත්‍රාකරුවන්, නැව් ආරක්ෂක නිලධරයන් සඳහා වූ නිපුණතා සහතිකයක් දැරිය යුතු ය ;

(ආ) නැව් ආරක්ෂක නිලධරයන් සඳහා වූ නිපුනතා සහතිකයක් ඉල්ලුම් කරන සෑම අපේක්ෂකයකු හට :-

(i) මාස 12කට නොඅඩු අනුමත මුහුදු ගමන් සේවයක් හෝ උචිත මුහුදු ගමන් සේවයක් සහ නැව් මෙහෙයවීම පිළිබඳව දැනුම තිබිය යුතුය ;

(ii) නෞකා ආරක්ෂාව පිළිබඳ අනුමත පුහුණු පාඨමාලාවකට සහභාගී විය යුතුය ; සහ

(iii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/5 වගන්තියේ 1 සිට 4 දක්වා වූ ඡේදවල නිශ්චිතව සඳහන් ප්‍රවීණතා මට්ටම සපුරා තිබිය යුතු ය.

*සියලු මුහුදු යාත්‍රා කරුවන් සඳහා වන ආරක්ෂාවට අදාළ පුහුණුව සහ උපදේශන සඳහා නියමිත අවම අවශ්‍යතා ආරක්ෂාවට අදාළ හුරුපුරුදු වීමේ පුහුණුව සඳහා වූ ප්‍රවීණතා මට්ටම*

(14) (අ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන පිළිපැදිය යුතු බවට නියම කරනු ලැබ ඇති මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල සිටින මගීන් හැර, එකී නෞකාවල සේවයේ යොදවන ලද හෝ කාර්ය පවරන ලද සියලු තැනැත්තන් විසින් නෞකාස්ථ කාර්ය පවරනු ලැබීමට පෙර,

(i) මුහුදු කොල්ලයක්, සන්නද්ධ මංකොල්ලයක් සිදුවන බවට තර්ජනයක් හෝ පහරදීමක් ඇතුළුව ආරක්ෂාවට අදාළ යම් සිද්ධියක් වාර්තා කිරීමට ;

(ii) ආරක්ෂාවට වූ තර්ජනයක් හඳුනාගත් විට අනුගමනය කළ යුතු පටිපාටිය දැනගැනීමට ; සහ

(iii) ආරක්ෂාවට අදාළ හදිසි සහ අභ්‍යාස පටිපාටිවලට සහභාගීවීමට, හැකිවන පරිදි STCW ව්‍යවස්ථා සංග්‍රහයේ B කොටසේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, ආරක්ෂාවට අදාළ හුරුපුරුදු වීමේ අනුමත පුහුණුවක් ලබා තිබිය යුතුය.

(ආ) මුහුදු ගමනේ යෙදී සිටින නෞකාවක නම් කරන ලද ආරක්ෂණ කාර්ය පවරනු ලැබූ සේවයේ යොදවන ලද හෝ කාර්ය පවරන ලද, මුහුදු යාත්‍රාකරුවන්, එකී කාර්යයන් පවරනු ලැබීමට පෙර, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ B කොටසේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් ඔවුන්ට පවරනු ලැබ ඇති කාර්ය සහ වගකීම් සම්බන්ධයෙන් ආරක්ෂාවට අදාළ හුරුපුරුදුවීමේ පුහුණුවක් ලැබිය යුතු ය.

(ඇ) ආරක්ෂාවට අදාළ හුරුපුරුදුවීමේ පුහුණුව මෙහෙයවීම නැවේ ආරක්ෂක නිලධරයා හෝ සමාන සුදුසුකම් සහිත වෙනත් තැනැත්තකු හෝ විසින් කරනු ලැබිය යුතු ය.

*ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය පිළිබඳ පුහුණුව සඳහා ප්‍රවීණතා මට්ටම*

(ඈ) නෞකාවේ කටයුතු සම්බන්ධයෙන් ISPS සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට නියම කරනු ලැබ ඇති නෞකාවක නම් කරන ලද ආරක්ෂක කාර්ය නොමැතිව එකී නෞකාවේ සේවක පිරිසේ කොටසක් ලෙස කවර හෝ තත්ත්වයකින් සේවයේ නියුක්තව, නෞකාස්ථව සිටින්නාවූ මුහුදු යාත්‍රාකරුවන් යම් නෞකාස්ථ කාර්යක් පවරනු ලැබීමට පෙර,

(i) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුවේ දක්වා ඇති පරිදි ආරක්ෂාව පිළිබඳ දැනුවත්වීම සම්බන්ධයෙන් උචිත අනුමත පුහුණුව හෝ උපදේශන ලැබිය යුතුය ; සහ

(ii) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුවේ 1 වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති වැඩ, කාර්ය, සහ වගකීම් බාරගැනීම සඳහා අවශ්‍ය ප්‍රවීණතා මට්ටම සපුරා ඇති බවට ;

(අ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුවේ 3 සහ 4 වන තීරුවල ලැයිස්තුගත කොට ඇති ප්‍රවීණතාව ඇගයීම සඳහා වූ ක්‍රම සහ උපමාන වලට අනුකූලව ප්‍රවීනතාව ප්‍රදර්ශනය කිරීම මගින් ; සහ

(ආ) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-1 වගුවේ 2 වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති විෂයයන් සම්බන්ධයෙන් වූ අනුමත පුහුණු වැඩසටහනක කොටසක් ලෙස පරීක්ෂණ මගින් හෝ අඛණ්ඩ ඇගැයීම් මගින්, සාක්ෂි සැපයීමට නියම කරනු ලැබිය යුතු ය.

*නම්කළ ආරක්ෂක කාර්ය සහිත මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ ප්‍රවීණතා මට්ටම්*

(ඉ) මුහුදු කොල්ලයට සහ සන්නද්ධ මංකොල්ලය වැළැක්වීම ඇතුළුව ආරක්ෂක කාර්ය ඉටු කිරීම සඳහා නම්කරනු ලැබූ සෑම මුහුදු යාත්‍රාකරුවකුම STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුවේ 1 වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති වැඩ, කාර්ය සහ වගකීම් බාරගැනීම සඳහා ඇති ප්‍රවීණතා ප්‍රදර්ශනය කළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය ;

(ඊ) මුහුදු කොල්ලයට සහ සන්නද්ධ මංකොල්ලය වැළැක්වීම ඇතුළුව ආරක්ෂක කාර්ය නෞකාස්ථව ඉටුකිරීමට සෑම අපේක්ෂකයකුටම හැකි කරවීමට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුවේ 2 වන තීරුවේ ඇතුළත් විෂය පිළිබඳ ඇති දැනුම් මට්ටම ප්‍රමාණවත් විය යුතු ය ;

(උ) සහතික ඉල්ලුම් කරනු ලබන සෑම අපේක්ෂකයකුටම ඃ-

(i) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/6-2 වගුවේ 3 සහ 4 තීරුවල වගුගත කොට ඇති, ප්‍රවීණතා අගය කිරීමේ හැකියාව සහ උපමාන ප්‍රදර්ශනය කළ යුතු ක්‍රමවලට අනුකූලව, ඉහතකී වගුවේ 1 වන තීරුවේ ලැයිස්තුගත කොට ඇති වැඩ, කාර්ය සහ වගකීම් භාරගැනීමට ඇති හැකියාව ප්‍රදර්ශණය කිරීම තුළින් ; සහ

(ii) A-VI/6-2 වගුවේ 2 වගුවේ 2 වන තීරුවේ දක්වා ඇති දේ ආවරණය කරනු ලබන අනුමත පුහුණු වැඩසටහනේ කොටසක් වශයෙන් පරීක්ෂණ මගින් හෝ අඛණ්ඩ ඇගැයීම තුළින්, නියම කරනු ලැබූ ප්‍රවීණතා මට්ටම සපුරා ඇති බවට සාක්ෂි සැපයිය යුතු ය.

*වෙනත් රටවල් විසින් නිකුත් කරනු ලබන සහතික පිළිගැනීම*

27. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) සහතික කිරීම සම්බන්ධයෙන් අදාළ රටේ අනුගමනය කරනු ලබන ක්‍රම වේදය සහ පටිපාටි සම්මුතියට අනුකූල බවට ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් විධිමත් ලෙස පිළිගනු ලැබ ඇත්නම්.

(ආ) ප්‍රවීණතා මට්ටම්, සහතික නිකුත් කිරීම් සහ පිටසන් කිරීම්, සහ වාර්තා තැබීම්වලට අදාළව සපුරාලිය යුතු අවශ්‍යතා සම්මුතියට සම්පූර්ණ වශයෙන් අනුකූල බව, පහසුකම් සහ ක්‍රියා පටිපාටි පරීක්ෂා කිරීමද ඇතුලත් විය හැකි අවශ්‍ය පියවර හරහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සනාථ කරනු ලැබ ඇත්නම් ; සහ

(ඇ) සම්මුතියට අනුකූලව සහතිකවල, පිටසන් කිරීම්වල, පුහුණු වැඩසටහන්වල සහ සහතික කිරීම්වල වත්මන් තත්ත්වයේ වැදගත් වෙනස්කම් සිදුව ඇත්නම් ඒ පිළිබඳව වහා දැනුම් දෙන බවට අදාළ රට සමග එකිගතාවයකට පැමිණ ඇත්නම්,

STCW ව්‍යවස්ථා සංග්‍රහයේ II/2, III/2 හෝ III/3 යන නියෝගවල විධිවිධාන යටතේ හෝ එකී ව්‍යවස්ථා සංග්‍රහයේ නිර්වචනය කොට ඇති පරිදි කළමනාකරණ මට්ටමින් VII/1 නියෝග යටතේ වෙනත් පාර්ශවයන් විසින් නිකුත් කරන ලද සහතික ශ්‍රී ලංකා නැව්වල සමාන මට්ටමේ සේවය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රවීණතා සහතික හෝ පිටසන් කිරීම්වලට සමාන බවට පිළිගනු ලැබිය හැකිය.

(2) නියෝගවල ආ උපලේඛනයේ දක්වා ඇති පරිදි කළමනාකරණ මට්ටමේ ප්‍රවීණතා සහතික සහ පිටසන් දරන්නන් විසින්, තමන්ට ඉටුකිරීම සඳහා අවසර දී ඇති කර්තව්‍යවලට අදාළව ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ව්‍යවස්ථා පිළිබඳ සුදුසු දැනුම තමාට ඇති බවට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතිකයක් පිළිගැනීම සඳහා පිටසන් කිරීමට පෙර, ඇගැයීමක් සාර්ථකව සම්පූර්ණ කිරීම තුළින් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් කළ යුතුය.

(3) 1 වන උපනියෝගවල කුමක් සඳහන් වුවද, අවස්ථානුකූල කරුණු අනුව අවශ්‍යවේ නම්, වෙනත් රටක නෞකාවක නෞකාස්ථව භාවිත කිරීම සඳහා ඒ රට විසින් නිකුත් කොට පිටසන් යෙදූ, එහෙත් ශ්‍රී ලංකා ධජය ප්‍රදර්ශනය කිරීමට හිමිකම ඇති නෞකාවක නෞකාස්ථ සේවය සඳහා සුදුසු විය හැකි ලෙස ඒ වන විටත් පිටසන් කොට නොමැති, සුදුසු සහ වලංගු සහතිකයක් දරන මුහුදු යාත්‍රාකරුවෙකුට, ශ්‍රී ලංකා ධජය ප්‍රදර්ශනය කිරීමට හිමිකම ඇති නෞකාවක රේඩියෝ නියෝගවලින් සලසා ඇති පරිදි මිස ගුවන් විදුලි ක්‍රියාකරු තත්ත්වයෙන් නොවන වෙනත් තත්ත්වයකින් මාස තුනක් නොඉක්මවන කාලයක් සේවය කිරීමට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉඩදෙනු ලැබිය හැකිය. කෙසේ වුවද, පිටසන් කිරීම සඳහා අයදුම්පතක් ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කොට ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

*පුහුණු කිරීමේ ආයතන සතු කාර්ය භාරය*

28. (1) පහත දැක්වෙන දේ ගැන, එනම් -

(ආ) මේ නියෝග යටතේ සහතික නිකුත් කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුවන්ට දෙනු ලබන සියලු පුහුණු කිරීම් සහ ඇගැයීම් ඒ නියෝගවල විධිවිධානවලට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ වෙනත් නියමයන්ට අනුකූලව පවත්වන ලද බවට,

(ආ) පුහුණුකිරීම් සහ ඇගැයීම් අතර ස්වාධීනත්වයක් පවත්වා ගෙන යනු ලබන බවට,

(ඇ) එක් එක් ආයතනය මගින් පුහුණු කරන ලද තැනැත්තන් පිළිබඳව වාර්තාවක් පවත්වා ගෙන යනු ලබන බවට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, පරීක්ෂකවරයාට සහ සමාගම්වලට ඒ තොරතුරු ඉල්ලා සිටි විට ලබා දෙනු ලබන බවට ;

(ඈ) අනුමත පුහුණු වැඩසටහන් පිළියෙල කිරීමේදී, සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ආදර්ශ පාඨමාලා භාවිතා කරනු ලබන බවට ; සහ

(ඉ) කර්මාන්තය හා බැඳුනු යාවත්කාලීන කිරීම් සහ ප්‍රවණතා ද ඇතුලුව STCW ව්‍යවස්ථා සංග්‍රහයට සහ වෙනත් අදාළ සාධන පත්‍රවලට කරනු ලබන සංශෝධන සමග එකඟවන පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා පාඨමාලා විෂය නිර්දේශ යාවත්කාලීන කරනු ලබන බවට ;

පුහුණු කිරීමේ ආයතන වග බලා ගත යුතු ය.

(2) රාජ්‍ය නොවන ආයතන විසින් ලබා දෙනු ලබන සියලු පුහුණු කිරීම්, ප්‍රවීණතා ඇගැයීම්, සහතික කිරීම්, පිටසන් කිරීම් සහ නැවත වලංගු කිරීමේ කටයුතු, පුහුණුකරුවන්ගේ සහ ඇගැයීම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද ද ඇතුළුව, අදාළ පරමාර්ථ ඉටු කැරෙන බවට සහතිකවීම සඳහා උසස් ප්‍රමිති ක්‍රමයක් මගින් අඛණ්ඩව සමීක්ෂණය කරනු ලැබිය යුතු ය.

(3) පුහුණු කිරීමේ, ප්‍රවීණතාව ඇගැයීමේ, සහතික කිරීමේ, පිටසන් කිරීමේ සහ නැවත වලංගු කිරීමේ කටයුතු රාජ්‍ය ආයතන විසින් කරගෙන යනු ලබන විට, උසස් ප්‍රමිති ක්‍රමයක් තිබිය යුතු ය.

(4) අනුමත කළ ආයතන විසින් කරගෙන යනු ලබන පුහුණු කිරීමේ, ප්‍රවීණතා ඇගැයීමේ, සහතික කිරීමේ, පිටසන් කිරීමේ සහ වලංගු කිරීමේ සියලු කටයුතු තත්කාර්ය සඳහා පත් කරනු ලැබූ ස්වාධීන මණ්ඩලයක් විසින් අවුරුදු පහකට නොවැඩි කාලාන්තරවලදී STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඇගැයීමට පාත්‍ර කළ යුතුය. එවැනි ඇගැයීම් පිළිබඳ වාර්තා, අන්තර් ජාතික සමුද්‍රීය සංවිධානයේ මහ ලේකම් වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතුය.

*පුහුණු කිරීමේ ආයතන සඳහා නියමයන්*

(5) සියලු පුහුණු කිරීමේ ආයතන, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි මෙවලම් සහ පහසුකම්වලට අදාළ නියමයන් පිළිපැදිය යුතු ය.

(6) සියලු අනුමත පුහුණු කිරීමේ ආයතන විසින්, අනුමත පුහුණු කිරීමේ ආයතනයන් ලෙස කටයුතු කිරීම සඳහා වාර්ෂික බලපත්‍රයක් ලබාගත යුතු ය. කෙසේ වුවද, නිදහස් අධ්‍යාපනය සලසන පුහුණු කිරීමේ ආයතන, බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් නිදහස් කළ යුතු ය.

(7) පුහුණු කිරීමේ ආයතන සම්මුතියට සහ අදාළ නියෝග සහ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කරන බව සත්‍යාපනය කරගැනීමේ කාර්ය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන විගණකවරු කණ්ඩායමක් මගින් විගණනය කරනු ලැබිය යුතු ය.

(8) පුහුණු කිරීමේ වැඩසටහන්වල පහසුකම්, සම්පත් සහ වැඩසටහන්/වැඩසටහනක පුහුණු කිරීමේ කාර්ය, සම්මුතියට අදාළ වන්නාවූ නියෝගවලට සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතිවලට අනුකූල නොවන බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට තහවුරුවන්නේ නම් ඔහු විසින්, යම් පාඨමාලාවකට හෝ පාඨමාලා කීපයකට ප්‍රදානය කරනු ලැබූ අනුමතය තාවකාලිකව හෝ ස්ථිරව ඉල්ලා අස් කරගනු ලැබිය හැකිය.

(9) සියලු අනුමත සමුද්‍රීය පුහුණුකිරීමේ ආයතනවලට, තමන් විසින් නිකුත් කරනු ලබන දක්ෂතා සහතික අන්තර්ජාලය හරහා සත්‍යාපනය කරගැනීමේ ක්‍රම පද්ධතියක් තිබිය යුතු ය.

*සමාගමේ වගකීම* ;

29. (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ නැව් මුහුදු සේවයේ යොදවන හෝ, මේ නියෝගවලට අනුකූලව නැව්වල සේවය සඳහා මුහුදු යාත්‍රාකරුවන් සැපයීම සම්බන්ධයෙන් වගකීම දරන සෑම සමාගමක් විසින් :-

(අ) ස්වකීය නැව්වල සේවයේ යොදවන එක් එක් මුහුදු යාත්‍රාකරුවා, මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂජනරාල්වරයා විසින් නිකුත් කරන ලද හෝ පිටසන් කරන ලද සුදුසු සහතිකයක් දරන බවට ;

(ආ) 2013 වෙළඳ නැව් (ආරක්ෂා සහිතව නැව හැසිරවීමේ) නියෝගවල සඳහන් නියමයන්ට අනුකූලව ස්වකීය නැව් හසුරුවන බවට ;

(ඇ) ප්‍රලේඛණවලට සහ දත්තවලට පමණක් සීමා නොකොට ස්වකීය නැව්වල සේවයේ යොදවා ඇති මුහුදු යාත්‍රාකරුවන්ගේ පළපුරුද්ද, පුහුණුව, සෞඛ්‍ය සම්පන්න භාවය සහ ඔවුන්ට පැවරෙන කාර්ය සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රවීණතාව ද ඇතුළුව ඒ නැව්වල සේවයේ යොදවා ඇති සියලු මුහුදු යාත්‍රාකරුවන් පිළිබඳ ප්‍රලේඛන සහ දත්ත, පවත්වාගෙන යනු ලබන බවට සහ ඒවා නිරීක්ෂණය කිරීමට නිතරම සූදානම් කර ඇති බවට ;

(ඈ) මුහුදු යාත්‍රාකරුවන්ට තමන්ගේ යම් නෞකාවක කාර්ය පැවරීමේදී එසේ පවරනු ලබන නිශ්චිත කාර්ය පිළිබඳව සහ නැව පිළියෙල කර ඇති ආකාරය, එහි ඇති උපකරණ ආදිය ස්ථානගත කර ඇති ආකාරය, කාර්ය පටිපාටි සහ තමන්ගේ එදිනෙදා කාර්යවලට හෝ හදිසි කාර්යවලට හෝ අදාළ නැවේ ගති ලක්ෂණ පිළිබඳව දැනුමක් ඇති බවට

(ඉ) අලුතින් සේවයේ නියුක්ත කරනු ලබන එක් එක් මුහුදු යාත්‍රාකරුට -

(i) එකී මුහුදු යාත්‍රාකරු විසින් භාවිත කරනු ලබන හෝ මෙහෙයවනු ලබන නිශ්චිත මෙවලම් ; සහ

(ii) එකී මුහුදු යාත්‍රාකරුට පවරනු ලබන කාර්ය නිසි ලෙස ඉටුකිරීම සඳහා ඔහු විසින් දැනගත යුතු නෞකාවලට විශේෂවූ මුරකාවල් සේවා, සුරක්ෂිතභාවය, පාරිසරික ආරක්ෂාව, රැකවරණය සහ හදිසි අවස්ථා පටිපාට සහ සැලසුම් පිළිබඳ කරුණු, පිළිබඳව හඳුනාගැනීම සඳහා, සාධාරණ කාල වේලාවක් ලබා දෙන බවට ;

(ඊ) ගුවන් විදුලි ක්‍රියාකරුවකු, එවැන්නකු ලෙස රාජකාරි භාර ගැනීමට පෙර නැවේ ගුවන් විදුලි මෙවලම් පිළිබඳව හුරුපුරුදු වන බවට ;

(උ) නැවෙහි අතිරේක සේවක පිරිස විසින්, හදිසි අවස්ථාවන්හිදී සහ ආරක්ෂාව, සුරක්ෂිතබව තහවුරු කිරීමේ හෝ දූෂණය වළැක්වීම හෝ අවම කිරීම හෝ සම්බන්ධයෙන් තම ක්‍රියාකාරකම් ඵලදායී ලෙස සම්බන්ධීකරණය කරන බවට ;

(ඌ) නියමිත කර්තව්‍ය ඉටු කිරීමට තම භාවිත සේවක මඩුල්ලේ සාමාජිකයන්ට ඇති සුදුසුකම් දක්වමින්, සම්මුතිය ප්‍රකාර නිකුත් කරනු ලැබූ සියලුම සහතික සහ ඒවාට අදාළ ලේඛනවල මුල් පිටපත් සෑම වේලාවකදීම නැවෙහි පවත්නා බව නැව්පතිවරයා විසින් සහතික කරනු ලබන බවට ;

(එ) සංශෝධිත පරිදි වූ 1971 අංක 52 දරන ශ්‍රී ලංකා වෙළඳ නැව් පනතේ, ජාත්‍යන්තර සාධන පත්‍රවල සහ බලාත්මක කිරීමේ නියෝගවල පාඨ ග්‍රන්ථ නැවෙහි තබා ඇති බවට ; සහ

(ඒ) සංශෝධිත, 1974 (SOLAS) මුහුදු ජීවිතයේ සුරක්ෂිතභාවය සඳහා වන ජාත්‍යන්තර සම්මුතියේ V වන පරිච්ඡේදයේ, 14 වන නියෝගයේ 3 සහ 4 ඡේදවලට අනුකූලව තමන්ගේ නෞකාවල නෞකාස්ථාව සිටි මුළු කාලය තුළ ඵලදාය. වාචික සන්නිවේදනයන් පවත්වාගෙන යන බවට ;

සහතික වීම පිළිබඳව එකී සමාගම් වගකිව යුතු බවට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/14 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

(2) නෞකාස්ථ කාර්ය පැවරීමට පෙර, ඒ නැවේ මගීන් හැර, සේවයේ යොදවන ලද හා කාර්ය පවරන ලද සියලු තැනැත්තන්ට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/I-1 වන වගන්තියට අනුකූලව හුරුපුරුදුවීම් සහ මූලික ආරක්ෂාව පිළිබඳ පුහුණුවක් හෝ උපදෙස් දෙනු ලැබිය යුතුය. හුරුපුරුදුවීම සහ මූලික ආරක්ෂාව පිළිබඳ පුහුණුව සම්බන්ධයෙන් උචිත ප්‍රමිති සපුරාලූ සියලු තැනැත්තන් පිළිබඳ වාර්තාවක් ඒ නැවේ නෞකාධිපතිවරයා සහ සමාගම විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතුය.

(3) මුහුදු යාත්‍රාකරුවන්ට කර්මාන්තය පිළිබඳ යාවත්කාලීන කිරීම් හා ඒ හා බැඳුනු ප්‍රවනතා ද ඇතුලුව STCW ව්‍යවස්ථා සංග්‍රහයට සහ වෙනත් අදාළ සාධන පත්‍රවලට ද කරන ලද වෙනස්කම්වලට අනුකූලව තම දැනුම යාවත්කාලීන කර ගැනීමට ඉඩ සැලසීම පිණිස ඔවුන්ට යාවත්කාලීන කිරීමේ හෝ සංස්කරණ පුහුණුවක් හෝ ලබාදීමට සමාගම සහතික විය යුතු ය.

*රාජකාරිය සඳහා යෝග්‍යතාව සහ මුරකාවල් සේවා ප්‍රමිති*

30. (1) සමාගම විසින්, මුරකාවල් සේවය භාරව සිටින නිලධරයා හෝ මුරකාවල් සේවයේ කොටසක් සමන්විත වන්නාවූ නිලනොලත් නැවියකු හෝ වශයෙන් කාර්ය භාරව සිටින සියලු තැනැත්තන් සහ නිරුපද්‍රිතතාව, දූෂණය වැළැක්වීම සහ ආරක්ෂක කාර්යයන් පිළිබඳ කාර්ය හා සම්බන්ධිත රාජකාරිවල නියුතු සියලු තැනැත්තන්ට, විඩාව වැළැක්වීම සඳහා :-

(අ) යම් පැය 24ක කාලයක් ඇතුලත අවම වශයෙන් පැය 10ක විවේකයක් ; සහ

(ආ) යම් දින 7ක කාලයක් ඇතුළත පැය 77ක විවේකයක්, මේ නියෝගවලට අනුකූලව ලබාදීම පිළිබඳව සහතික විය යුතුය

(2) යම් පැය 24ක කාලයක් ඇතුළත විවේක පැය ගණන කාල පරිච්ඡේද දෙකකට වඩා නොබෙදිය යුතු අතර එක් කාල පරිච්ඡේදයක් යටත් පිරිසෙයින් පැය 6ක් වත් දීර්ඝ විය යුතු අතරම අනුක්‍රමික විවේක කාල අතර කාල අන්තරය පැය 14ක් නොඉක්මවිය යුතු ය.

(3) යම් හදිසි අවස්ථාවකදී හෝ වැඩි ප්‍රමුඛතාවක් දියයුතු වෙනත් මෙහෙයුම් තත්ත්වයන්හිදී, ඉහත (1) හා (2) උප නියෝගවල සඳහන් විවේක කාල නියම පිළිපැදීම අවශ්‍ය නොවේ. පෙරට්ටු, ගිනිනිවාරණය කිරීමේ සහ ගිනි වැළැක්වීමේ සහ ජීවිතාරක්ෂක බෝට්ටු භාවිතයට අදාළ සරඹ පුහුණු සහ, ජාතික නීති සහ නියෝගද ජාත්‍යන්තර සාධන පත්‍රද මගින් නියම කරනු ලැබූ සරඹ පුහුණු ද විවේක කාල පරිච්ඡේද වලට බාධා පැමිණවීම අවම වන ආකාරයට සහ වෙහෙසට පත් නොවන ආකාරයට පැවැත්විය යුතු ය.

(4) සමාගම් සහ නෞකාධිපතිවරුන් විසින් මුරකාවල්සේවා කාර්ය සටහන්, ඒවාට පහසුවෙන් ප්‍රවේශය ලබාගත හැකි ස්ථානවල ප්‍රදර්ශණය කිරීම පිළිබඳව, සහතික විය යුතු ය. කාර්ය සටහන් නෞකාවේ රාජකාරී ඉටුකරන භාෂාව හෝ භාෂාවලින් හා ඉංග්‍රීසි භාෂාවෙන් හා නියමිත ආකෘතියෙන් සකස් කළ යුතු ය.

(5) මුහුදු යාත්‍රාකරු (රාජකාරිය සඳහා) සූදානමින් සිටින වේලාවක එනම් යන්ත්‍රාගාරයේ කටයුතු සඳහා කිසිවකු නොමැති විටෙක රාජකාරිය සඳහා කෙරෙන කැඳවීම් හේතුවෙන් සාමාන්‍ය විවේක කාලවේලාවට බාධා වූයේ නම් එකී යාත්‍රාකරුට ප්‍රමාණවත් හානිපූරක විවේක කාලවේලාවක් තිබිය යුතු ය.

(6) මේ නියෝගවලට අනුකූලව කටයුතු කරන බවට සහ අධීක්ෂණය කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුවන්ගේ දිනපතා විවේක පැය ගණන පිළිබඳ වාර්තා නියමිත ආකෘතියක් අනුව, නෞකාවෙහි රාජකාරි ඉටුකරන භාෂාවෙන් හෝ භාෂාවලින් සහ ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වාගෙන යා යුතුය. නෞකාධිපති හෝ නෞකාධිපති විසින් බලය දෙන ලද අන් තැනැත්තකු හෝ විසින් සහ මුහුදු යාත්‍රාකරු විසින් පිටසන් කළ යුතු, මුහුදු යාත්‍රාකරුවන්ට අදාළ ඉහතකී වාර්තාවේ පිටපතක් ඔවුන්ට ලැබිය යුතු ය.

(7) නෞකාවේ හෝ නෞකාස්ථ පුද්ගලයන්ගේ හෝ නැව් භාණ්ඩවල හෝ හදිසි ආරක්ෂාව සඳහා, නැතහොත්, මුහුදේදී විපතට පත් අන් නැවකට හෝ පුද්ගලයන්ට ආධාර දීම සඳහා අවශ්‍ය විය හැකි යම් පැය ගණනක රාජකාරියක් ඉටුකිරීම සඳහා යාත්‍රාකරන්නන්ට නියම කිරීමට නෞකාධිපතිවරයකුට ඇති අයිතියට මේ නියෝගවල සඳහන් කිසිවක් මගින් හානියක් සිදුවන බවට නොසලකනු නොලැබිය යුතුය. ඒ අනුව නෞකාධිපතිවරයා විසින් කාලසටහන් ගත කල විවේක පැය ගණන අත්හිටුවා එකී අවස්ථාව ප්‍රකෘති තත්ත්වයට පත්වන තෙක්, අවශ්‍ය වනු ලබන පැය ගණන කටයුතු ඉටු කිරීමට මුහුදු යාත්‍රාකරුට නියම කරනු ලැබිය හැකිය. තත්ත්වය ප්‍රකෘති තත්ත්වයට පත්වූ පසු ප්‍රායෝගිකව හැකි වහාම, කාලසටහන්ගත කළ විවේක කාල වේලාව තුළ වැඩකළ යම් නැවියකුට ප්‍රමාණවත් විවේක කාලයක් සලසන බවට, නෞකාධිපතිවරයා සහතික විය යුතු ය.

(8) ඉහත උපනියෝග (1) (අ) සහ උප නියෝග (2) හි නිශ්චිතව සඳහන් නියමිත විවේක පැය ගණනින් බැහැර විය හැක්කේ යම් දින 7ක කාල පරිච්ඡේදයක් තුළ විවේක කාල වේලාව පැය 70 ට නොඅඩු වන්නේ නම් පමණි. උප නියෝග (1) (ආ) මගින් සලසා ඇති

සතියක් සඳහා වූ විවේක කාල පරිච්ඡේදයන් බැහැරවීමට අනුක්‍රමික සති දෙකක් ඉක්මවා ඉඩ නොදිය යුතු ය. නෞකාස්ථ ව්‍යතිරේකී කාල පරිච්ඡේද දෙකක් අතර කාල අන්තරය, ව්‍යතිරේකී කාල පරිච්ඡේදයේ කාලසීමාවේ දෙගුණයට නොඅඩුවිය යුතු ය.

උප නියෝග (1) (අ) මගින් සලසා ඇති විවේක පැය ගණන, කාල පරිච්ඡේද තුනක් නොඉක්මවා බෙදිය හැකි අතර මෙයින් එක් කාල පරිච්ඡේදයක් යටත් පිරිසෙයින් පැය හයක් දීර්ඝ විය යුතු අතර අන් කාල පරිච්ඡෙද වලින් එකක් හෝ, දිගින් පැය එකකට වඩා අඩු නොවිය යුතුය. අනුක්‍රමික විවේක කාල පරිච්ඡේද අතර කාල අන්තරය පැය 14 නොඉක්මවිය යුතු ය. ව්‍යතිරේකී කාලවේලාවන් දින 7ක කාල පරිච්ඡේදයකදී පැය 24ක කාල පරිච්ඡේද දෙකක් නොඉක්මවිය යුතු ය.

ව්‍යතිරේක, හැකිතාක් දුරට STCW ව්‍යවස්ථා සංග්‍රහයේ B-VIII/1 වගන්තියේ වීඩාව වැළැක්වීම පිළිබඳ වූ මාර්ගෝපදේශ සැලකිල්ලට ගත යුතු ය.

(9) නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ වෙනත් මුහුදු යාත්‍රාකරුවන්, ඔවුන්ට පවරනු ලැබ ඇති නිරුපද්‍රිතාව, ආරක්ෂක සහ සමුද්‍රීය පාරිසරික කාර්ය ඉටු කරන අතරතුරුදී මද්‍යසාර අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීමේ කාර්ය සඳහා 0.05% ප්‍රතිශතයක් නොඉක්මවන රුධිර මද්‍යසාර සීමාවන් (BAC) හෝ ආශ්වාස ප්‍රශ්වාසයෙහි, ලි/මිග්‍රෑ 0.25 නොඉක්මවන සීමාවන් හෝ එවැනි මද්‍යසාර සාන්ද්‍රතාවන් කරා යොමුවන මද්‍යසාර ප්‍රමාණයන් පවත්වාගෙන නොයාම පිළිබඳව සමාගම් සහ නෞකාධිපතිවරුන් විසින් සහතික විය යුතුය. මත් ඖෂධ භාවිතය තහනම් වේ.

*ජාතික විධිවිධාන ;*

31. (1) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නැවකට හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේදී විදේශීය නැවකට යම් ගොඩ ඇණීමක්, එහි ගින්නක්, ජීවිත හානියක් හෝ නැව් බඩුවලට හානියක් හෝ වැනි හදිසි අනතුරක් හෝ අහඹුවක් හෝ වෙනත් යම් අසාමාන්‍ය සිදුවීමක් හෝ නෞකාස්ථව සිදු වුවහොත්, ඒ සිද්ධිය සිදු වී පැය විසිහතරක් තුළ දී නැවේ නෞකාධිපතිවරයා, අයිතිකරු හෝ දේශීය නියෝජිතයා විසින් ඒ සිද්ධිය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු ය.

(2) ඉහත සඳහන් කවර වුවද අවස්ථාවකදී, ඒ සිදුවීම්වල බරපතලකම අනුව හෝ මහජන සුභ සිද්ධිය සඳහා අවශ්‍ය වන්නේනම් හෝ ඒ සිදුවීම් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

(3) එවැනි පරීක්ෂණයක් පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන නිලධරයා හෝ නිලධරයන් විසින්, සාක්ෂිකරුවන්ට පෞද්ගලිකවම පැමිණ සිටීමට සහ පරීක්ෂණය හමුවේ සාක්ෂි දීමට නියම කරනු ලැබිය හැකිය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් ප්‍රවීණතා සහතිකයක් හෝ පිටසනක් හෝ ලේඛනයක්, එකී පරීක්ෂණ නිලධරයන්ගේ වාර්තාව පදනම් කර ගෙන, අත්හිටුවීම හෝ ආපසු කැඳවීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකිය. එසේ වුව ද, තම මතය ආරක්ෂා කර ගැනීම සඳහා සාධාරණ අවස්ථාවක් වගඋත්තරකරුට නොදී එවැනි ක්‍රියා මාර්ගයක් නොගත යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කිසිදු සහතිකයක් හෝ පිටසනක් නිකුත් නොකරන ලද මුහුදු යාත්‍රාකරුවකුගේ අකාර්යක්ෂමතාවක් හෝ විෂමාචාරයක් ගැන පරීක්ෂණ වාර්තාවෙන් යෝජනා කර ඇත්නම් එකී තැනැත්තා කිසිදු අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරයට අවතීර්ණ වීමෙන් තහනම් කරනු ලැබිය හැකි අතර, ඉහත ඡේදයේ සඳහන් ලේඛනය නිකුත් කළ රාජ්‍යයට, සුදුසු පරිදි කටයුතු කිරීමට දැනුම් දිය යුතු ය.

(6) පරිපාලනමය, ව්‍යවස්ථාමය සහ කාර්ය පරිපාටි පාලනයේ අඩුපාඩුවක් තිබුණු බව ඉහත සඳහන් පරීක්ෂණයක දී එළිදරවු වුව හොත්, අදාළ පරිපාලන බලධාරීත්වය සමග සහයෝගයෙන් එකී කාරණයට ප්‍රතිකර්ම යෙදීමට සුදුසු පියවර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලැබිය යුතු ය.

(7) මේ නියෝගවලින් නියම කොට ඇති පරිදි වූ සහතිකයක් සන්තකයේ ඇති යම් තැනැත්තකු එකී සහතිකය අන්‍යයකු ලෙස පෙනී සිටීමේ අදහසින් සාදාගත් කූට ලේඛනයක් බව හෝ වංචනික මාර්ගයකින් ලබා ගන්නා ලද්දක් බව හෝ අනාවරණය වූ විටක, එකී තැනැත්තා වරදකට වරදකරු වන අතර, යම් නෛතික අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී තැනැත්තා අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා මුහුදු කාර්යයෙහි නියළීම අත්හිටවනු ලැබිය හැකිය.

(8) මේ නියෝග යටතේ නිකුත් කරන ලද සහතිකයක් දරන යම් තැනැත්තකු, නැවක කළමනාකරණය හෝ නැවක් ක්‍රියාකරවීම හෝ ආරක්ෂාව සහිතව යාත්‍රා කරවීම හෝ සම්බන්ධයෙන් වූ විෂමාචාරයකට වරදකරු වන බව යම් නෛතික අධිකරණයක්

විසින් තීරණය කරනු ලැබුව හොත්, ඔහු එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(9) මේ නියෝගවලින් නියම කොට ඇති සහතිකයක් නොදරන නාවික සේවක මඩුල්ලේ යම් සාමාජිකයකු සේවයේ යොදවන නෞකාධිපතිවරයකු හෝ, එවැන්නක් සඳහා එම නෞකාධිපතිවරයාට ආධාර හා උපකාර කරන යම් තැනැත්තකු, වරදකට වරදකරු වන අතර, යම් නෛතික අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(10) නියමිත සහතිකයක් දරන තැනැත්තකු විසින් කවර වුව ද නිල තත්වයකින් ඉටු කළ යුතු යයි මේ නියෝග වලින් නියම කර ඇති යම් කාර්යයක් හෝ සේවයක් ඉටු කිරීමට, එවැනි සහතිකයක් හෝ වලංගු විශේෂ අවසරයක් හෝ නොදරන සහ අධීක්ෂණය යටතේ ලබන පුහුණුව හැර මේ නියෝගවලින් නියම කර ඇති ලේඛනගත සාක්ෂි හෝ අනුපාතික බලපෑම් අවස්ථා හෝ නොමැතිව සහ යට කී අන්දමේ සහතිකයක් හෝ වලංගු විශේෂ අවසරයක් හෝ නොදරන තැනැත්තකුට ඉඩ දුන් නෞකාධිපතිවරයකු හෝ එවැන්නක් සඳහා නෞකාධිපතිවරයකුට ආධාර සහ අනුබල දෙන යම් තැනැත්තකු හෝ වරදකට වරදකරු වන අතර, අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය

(11) මේ නියෝග යටතේ සහතිකයක් දරන යම් තැනැත්තකු නැවක කළමනාකරණය හෝ නැවක් ක්‍රියා කරවීම හෝ ආරක්ෂාකාරී ලෙස යාත්‍රා කරවීම හෝ සම්බන්ධයෙන් අකාරයක්ෂම බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී ගිය හොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ කරනු ලැබිය හැකිය

(12) මේ නියෝග යටතේ සහතිකයක් දරන තැනැත්තකු ඒ සහතිකයට උචිත රාජකාරි කටයුතු ඉටු කිරීමට අපොහොසත්වුවහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සහතිකය අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ කරනු ලැබිය හැකිය.

*වරාය තත්ත්ව පාලනය* ;

32.(1) සම්මුතියේ X වන ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති ආකාරයට යථා පරිදි බලය දෙනු ලැබූ පාලක නිලධරයකු විසින් ඉටු කරනු ලැබිය යුතු වරාය තත්ත්ව පාලනය, පහත දැක්වෙන කර්තව්‍යවලට සීමා විය යුතුයඃ-

(අ) නැවක සේවය කරන හා සම්මුතියට අනුකූලව සහතික ලබා ගැනීමට නියමිත සියලු මුහුදු යාත්‍රාකරුවන් සුදුසු සහතිකයක් හෝ වලංගු විශේෂ අවසරයක් හෝ දරන්නේ ද නැතහොත් සම්මුතියේ 5 වන ඡේදයේ 1/10 වන නියෝගයට අනුකූලව පිටසනක් සඳහා අයදුම්පතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර ඇති බවට ලේඛනගත සාක්ෂි ඔවුන් සතුව තිබේ ද යන්න පිළිබඳව සම්මුතියේ X(1) වන වගන්තියට අනුකූලව සත්‍යාපනය කිරීම

(ආ) නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් සංඛ්‍යාව සහ ඔවුන් දරන සහතික, නැවේ ධජය අයත් රටේ පරිපාලනය විසින් නියම කර ඇති, ආරක්ෂා සහිතව නැව හැසිරවීමේ නියමයන්ට අනුකූල වේ දැයි, සත්‍යාපනය කිරීම

(ඇ) සම්මුතියෙන් නියම කර ඇති මුරකාවල් සේවා ප්‍රමිති පවත්වාගෙන ගොස් නොමැති බව පහත දැක්වෙන කවර වුව ද සිදුවීමක් නිසා විශ්වාස කිරීමට පැහැදිලි හේතු තිබේ නම්, සම්මුතියෙන් නියම කර ඇති මුරකාවල් සේවා ප්‍රමිති පවත්වාගෙන යාමට ඒ නැවේ මුහුදු යාත්‍රාකරුවන්ට ඇති හැකියාව, සම්මුතියේ A-1/4 වන වගන්තියට අනුකූලව අගැයීම ; එනම් :-

(i) සට්ටනයකට, ගොඩඇණීමකට හෝ අතරමංවීමකට නැව පාත්‍රවීම ;

(ii) නැව යාත්‍රා කරමින් තිබිය දී හෝ නැංගුරම් ලා තිබියදී හෝ නවතා තිබිය දී යම් ද්‍රව්‍ය නැවෙන් ඉවතලීම යම් ජාත්‍යන්තර සම්මුතියක් යටතේ නීති විරෝධී වේ ද එබඳු ද්‍රව්‍ය එසේ නැවෙන් ඉවතලා තිබීම ;

(iii) නැව අක්‍රමවත් හෝ අනාරක්ෂිත ආකාරයට හැසිරවීම සහ ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් පිළිගනු ලැබ ඇති සාමාන්‍ය ක්‍රමචර්යා හෝ ආරක්ෂාකාරී යාත්‍රාකරණ පරිචයක් සහ කාර්ය පටිපාටි එමගින් අනුගමනය කර නොතිබීම ; හෝ

(iv) පුද්ගලයන්, දේපළ හෝ පරිසරයට අන්තරායක් උද්ගත විය හැකි ආකාරයෙන් හෝ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ආකාරයෙන් නැව අන්‍යාකාරයෙන් මෙහෙයවීම.

(2) පහත දැක්වෙන අඩුපාඩුකම් කිසිවක් නිවැරදි කිරීම පැහැර හැරීම හේතුවෙන් පුද්ගලයන්ට, දේපළට හෝ පරිසරයට අන්තරාදායක තත්ත්වයක් උදා වී ඇතැයි තීරණය කර ඇති විටෙක, යථා පරිදි බලය දෙන ලද පාලක නිලධරයකු විසින් සම්මුතියේ X වන ව්‍යවස්ථාව යටතේ, නැවක්, රඳවා තබා ගනු ලැබිය හැකිය ; එනම් :-

(අ) මුහුදු යාත්‍රාකරුවන් විසින් සහතිකයක් දැරීමට, සුදුසු සහතිකයක් ලබා ගැනීමට හෝ වලංගු විශේෂ අවසරයක් ලබා ගැනීමට අපොහොසත් වීම හෝ, පිටසනක් ලබා ගැනීම සඳහා අයදුම්පතක් සම්මුතියේ 5 වන ඡේදයේ 1/10 වන නියෝගයට අනුකූලව ධජය අයත් රාජ්‍යයේ පරිපාලනය වෙත ඉදිරිපත් කර ඇති බවට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීම පැහැර හැර තිබීම.

(ආ) ධජය අයත් රාජ්‍යයේ පරිපාලනය විසින් නියම කර ඇති, ආරක්ෂාකාරී ලෙස නැව හැසිරවීමේ නියමයන්ට අනුකූලවීම පැහැර හැර තිබීම

(ඇ) යාත්‍රා කිරීම හෝ ඉංජිනේරු මුර සේවා කටයුතු පිළියෙල කිරීම ධජය අයත් රාජ්‍යයේ පරිපාලනය විසින් නිශ්චිතව සඳහන් කොට ඇති, නියමයන්ට අනුකූලව සිදුකිරීම පැහැර හැර තිබීම

(ඈ) ආරක්ෂාකාරීව යාත්‍රා කිරීමට, ආරක්ෂාකාරී ගුවන්විදුලි සන්නිවේදනයට හෝ සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා අත්‍යවශ්‍ය උපකරණ ක්‍රියා කරවීමට සුදුසුකම් ලත් තැනැත්තකු මුරකාවල් සේවයේ නොසිටීම; සහ

(ඉ) මුහුදු ගමනක ආරම්භයේ දී පළමු මුරකාවල් සේවය සඳහා සහ තදනන්තර මුරකාවල් සේවා සඳහා, ප්‍රමාණවත් ලෙස විවේක ගත්තා වූ ද රාජකාරී කටයුතුවලට යෝග්‍ය තත්ත්වයක සිටින්නා වූ ද තැනැත්තන් යෙදීමට නොහැකිවීම.

*වාර්තා සහ තත්ත්ව ප්‍රමිති පවත්වාගෙන යාම ;*

33. (1) සහතික, පිටසන් හෝ යම් ලේඛනයක් නිකුත් කරනු ලැබ ඇති මුහුදු යාත්‍රාකරුවන් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය. එකී වාර්තාවලට, ඔවුන්ගේ අනන්‍යතාව, පළපුරුද්ද, පුහුණුව, සෞඛ්‍ය සම්පන්න බව සහ ප්‍රවීණතාව පිළිබඳ ප්‍රලේඛණ හා දත්ත ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

(2) පුහුණු කිරීමේ ආයතන, පරීක්ෂණ සහ ඇගයීම් සහ වෛද්‍ය වෘත්තිකයන් අනුමත කිරීමේ ක්‍රියා පරිපාටි ඇතුළුව, සම්මුතියට අනුකූලව මේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලේඛණගත කාර්ය පරිපාටි අනුගමනය කරනු ලැබිය හැකිය.

(3) සහතික නිකුත් කිරීමේ ක්‍රමය පිළිබඳ ඇගයීම් අවුරුදු පහක් නොඉක්මවන කාලාන්තර තුළ කලින් කළ සිදු කිරීමට අමාත්‍යාංශයේ වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලය තුළ සේවය නොකරන සුදුසුකම් ලත් විගණකවරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය. එවැනි අගැයීම්වල වාර්තා, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ ලේකම් ජනරාල්වරයා වෙත අමාත්‍යවරයා විසින් යවනු ලැබිය යුතු ය.

*වෛද්‍ය ප්‍රමිති ;*

34. නිලධර සහතිකයක්, මුහුදු යාත්‍රාකරුවන්ගේ අඛණ්ඩ මුදා හැරීමේ සහතිකයක් (සීඩීසී) හෝ විශේෂ සුදුසුකම් සහතික කිරීම සඳහා හෝ අයදුම් කරන සියලු අයදුම්කරුවන්ට, පිළිගත් වෛද්‍යවරයකු විසින් සම්පූර්ණ කරනු ලැබූ ශාරීරික පරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ වෛද්‍ය වාර්තා ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කළ යුතුයයි නියම කරනු ලැබිය යුතුය. එසේ සම්පූර්ණ කරන ලද වෛද්‍ය වාර්තා ආකෘති පත්‍රය, නිලධර සහතික සඳහා හෝ මුහුදු යාත්‍රාකරුගේ හඳුනාගැනීමේ ලේඛනය සඳහා හෝ විශේෂ සුදුසුකම් සහතික කිරීම සඳහා හෝ ඉල්ලුම් කරන අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. නිලධර සහතිකයක් සඳහා හෝ විශේෂ සුදුසුකම් සහතික කිරීමක් සඳහා හෝ සීඩීසී සහතිකයක් සඳහා හෝ ඉල්ලුම් කළ දිනට පෙර මාස 12කට නොවැඩි කාලයක් තුළදී ඉහත සඳහන් ශාරීරික පරීක්ෂණය සිදු කොට තිබිය යුතුය. භාර ගන්නා ලද නිශ්චිත කාර්ය පැවරුම ඉටු කිරීමට සුදුසු සතුටුදායක ශාරීරික තත්ත්වයක් අයදුම්කරුට ඇති බවත් නාවුක වෘත්තියේ අවශ්‍යතා සපුරාලීම සඳහා සාමාන්‍යයෙන් අවශ්‍ය සියලුම ශාරීරික ඉන්ද්‍රිය

ශක්තිය අයදුම්කරුට ඇති බවත් ඒ පරීක්ෂණයෙන් තහවුරු විය යුතුය. ඉහත සඳහන් කරුණුවලට අමතරව පහත දැක්වෙන අවශ්‍යතා අයදුම්කරු විසින් සපුරාලිය යුතු ය :-

(අ) මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන වෛද්‍ය යෝග්‍යතාවද, වෛද්‍ය සහතික නිකුත් කිරීමේ කාර්ය පටිපාටිය ද STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/9 වගන්තියට අනුකූලව විය යුතු ය ;

(ආ) මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ වෛද්‍ය පරීක්ෂණවල කාර්ය සඳහා, අනුමත වෛද්‍ය වෘත්තිකයකු විසින්, මුහුදු යාත්‍රාකරුවන්ගේ වෛද්‍ය සහ ශාරීරික යෝග්‍යතාව මේ නියෝගයේ විධිවිධාන සහ STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-1/9 වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඇගැයීම් කළ යුතුය ;

(ඇ) සම්මුතියේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන සහ මුහුදු සේවයේ යෙදී සිටින සෑම මුහුදු යාත්‍රාකරුවෙකුම මේ නියෝගයේ විධිවිධාන සහ STCW සංග්‍රහයේ A-1/9 වගන්තියේ විධිවිධාන වලට අනුකූලව නිකුත් කරනු ලැබූ වලංගු වෛද්‍ය සහතිකයක් දැරිය යුතු ය ;

(ඈ) මුහුදු යාත්‍රාකරුවන් :-

(i) STCW ව්‍යවස්ථා සංග්‍රහයේ A-I/9 වගන්තියේ 5 වන ඡේදය සැලකිල්ලට ගනිමින්, එකී ව්‍යවස්ථා සංග්‍රහයේ A-VI/1 වගන්තියේ 2 වන ඡේදයේ නියම කරනු ලැබ ඇති පරිදි මූලික පුහුණුවේ සියලු අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා ශාරීරික ශක්නුතාවයෙන් යුක්ත බවට.

(ii) ඵලදායී අයුරින් සන්නිවේදනය කරගැනීමට සහ ශ්‍රවණය කළ හැකි අනතුරු ඇඟවීමේ සංඥා හඳුනාගැනීමට හැකිවන පරිදි, ප්‍රමාණවත් වූ කන් ඇසීමේ සහ කථාකිරීමේ හැකියාව ප්‍රදර්ශණය කරන බවට.

(iii) වෛද්‍ය සහතිකයේ වලංගු කාල පරිච්ඡේදය ඇතුළත තම එදිනෙදා රාජකාරි කටයුතු ද, නෞකාස්ථ හදිසි කාර්යද ඵලදායී ලෙස ඉටු කිරීම වලක්වන අන්දමේ වෛද්‍යමය තත්ත්වයක්, අක්‍රමවත් භාවයක්, හෝ අබලතාවක් නොමැති බවට.

(iv) මුහුදේ සේවය හේතුවෙන් උග්‍ර විය හැකි වූ හෝ නැවියා එවැනි සේවයක් සඳහා නුසුදුසු කරන්නා වූ හෝ නෞකාස්ථ වෙනත් තැනැත්තන්ගේ සෞඛ්‍යය හා නිරුපද්‍රිතතාව අනතුරට හෙලන්නාවූ යම් වෛද්‍යමය තත්ත්වයකින් නොපෙළෙන බවට ; සහ

(v) නැවියාගේ එදිනෙදා රාජකාරී හෝ හදිසි නෞකාස්ථ කාර්ය ඵලදායි අයුරින් සහ ආරක්ෂාකාරී අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය තීන්දු ගැනිමේ හැකියාව සහ සමබරතාව හෝ වෙනත් යම් අවශ්‍ය කාරණා දුබල කරන අතුරු ප්‍රතිඵල ගෙන දෙන්නාවූ යම් ඖෂධ නොගන්නා බවට, ශාරීරික සහ වෛද්‍ය යෝග්‍යතාවේ ප්‍රමිති මගින් සහතික විය යුතු ය.

*වෛද්‍ය සහතිකයේ වලංගුතාව ;*

(ඉ) වෛද්‍ය සහතිකය උපරිම අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා වලංගුව පවතින අතර නැවියාගේ වයස අවුරුදු 18ට අඩු හෝ අවුරුදු 55ට වැඩිනම් වෛද්‍ය සහතිකයේ උපරිම වලංගුභාවය අවුරුදු එකක් විය යුතුයඃ

එසේ වුවද, වෛද්‍ය සහතිකයක වලංගු කාල පරිච්ඡේදය යම් යාත්‍රාකරණයක් අතරතුරදී අවසන් වුවහොත්, නෞකාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගත් වෛද්‍ය වෘත්තිකයකු සිටින ඊළඟ වරායට සේන්දුවන තෙක්, මාස 3ක කාලපරිච්ඡේදයකට යටත්ව එකී සහතිකය දිගටම වලංගුව පැවතිය යුතුය : තවද එසේ වුවදඃ

(i) තත් අවසරයේ කාලය මාස තුනක් නොඉක්මවීම ; සහ

(ii) මෑත දාතමක් සහිත, කාලය ඉකුත්වූ වෛද්‍ය සහතිකයක් මුහුදු යාත්‍රාකරු සතුව තිබීම, යන කාරණා වලට යටත්ව, නෞකාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගත් වෛද්‍ය වෘත්තිකයකු සිටින ඊලග වරායට සේන්දුවන තෙක් වලංගු වෛද්‍ය සහතිකයක් නොමැතිව වැඩෙහි යෙදීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා එවැනි මුහුදු යාත්‍රාකරුවෙකුට අවසර දෙනු ලැබිය හැකිය.

අ-1/9

**මුහුදු යාත්‍රාකරුවන් සඳහා අවම සේවාස්ථ පෙනීමේ ප්‍රමිති**

| STCW සම්මුති නියෝගය | මුහුදු යාත්‍රාකරුවන්ගේ වර්ගය | දුර පෙනීම | | සමීප/ආසන්නතම පෙනීම | වර්ණ 3 පෙනීම | දෘෂ්ඨි ක්ෂේත්‍ර | රාත්‍රි අන්ධතාව 4 | ඩිප්ලෝපියා (ද්විත්ව පෙනීම) |
|---|---|---|---|---|---|---|---|---|
| | | ආධාර සහිත එක් ඇසක් | අනික් ඇස | දෙඇසම එක්වර ආධාර සහිතව හෝ රහිතව | | | | |
| I/II<br>II/I<br>II/2<br>II/3<br>II/4<br>II/5<br>VII/2 | නිරීක්ෂණ කාර්ය භාර ගැනීමට නියම කරනු ලැබූ නැව්පතියන්, නැව් තට්ටු නිලධරයන් සහ නිල නොලත් නැවියන් | 0.5[2] | 0.5 | නැව් යාත්‍රාකරවීම සම්බන්ධයෙන් අවශ්‍ය පෙනීම (උදා: චාට් සහ නාවුක ප්‍රකාශන යොමුව පාලම් සවිකිරීමේ මෙවලම් සහ උපකරණ භාවිතය සහ, යාත්‍රාකරණය සඳහා අවශ්‍ය ආධාරක හඳුනා ගැනීම) | 6 වන සටහන බලන්න | සාමාන්‍ය දෘෂ්ඨි ක්ෂේත්‍ර | සැකයකින් තොරව අන්ධකාරයේදී අවශ්‍ය සියලු කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය පෙනීම | වැදගත් තත්ත්වයක් ප්‍රකට නොවේ |
| I/II<br>III/I<br>III/2<br>III/3<br>III/4<br>III/5<br>III/6<br>III/7<br>VII/2 | ඉංජිනේරු නිලධරයන් විද්‍යුත් කාර්මික නිලධරයන් සහ විද්‍යුත් කාර්මික නැවියන් සහ ඇංජින් කාමර මුර සේවයේ කොටසක් වන නිල නොලත් නැවියන් | 0.4[5] | 0.5 (5 වන සටහන බලන්න) | සමීප ආසන්න තාවයක සිට උපකරණ හඳුනා ගැනිමටද මෙවලම් ක්‍රියාත්මක කිරීමට සහ පද්ධති/උපාංග අවශ්‍ය වන පරිදි හඳුනා ගැනීමටද අවශ්‍ය පෙනීම | 7 වන සටහන බලන්න | ප්‍රමාණවත් දෘෂ්‍ය ක්ෂේත්‍ර | සැකයකින් තොරව අන්ධකාරයේදී අවශ්‍ය සියලු කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය පෙනීම | වැදගත් තත්ත්වයක් ප්‍රකට නොවේ |
| I/II<br>IV/2 | CMDSS ගුවන් විදුලි ක්‍රියාකරුවන් | 0.4 | 0.4 | සමීප ආසන්නතාවයක සිට උපකරණ හඳුනා ගැනීමටද මෙවලම් ක්‍රියාත්මක කිරීමට සහ පද්ධති/උපාංග අවශ්‍යවන පරිදි හඳුනාගැනීමට අවශ්‍ය පෙනීම | 7 වන සටහන බලන්න | ප්‍රමාණවත් දෘෂ්ඨි ක්ෂේත්‍ර | සැකයකින් තොරව අන්ධකාරයේදී අවශ්‍ය සියලු කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය පෙනීම | වැදගත් තත්ත්වයක් ප්‍රකට නොවේ |

සටහන් ඃ

1. ස්නෙලන්දශම අංකනය තුළින් අගය ලබා දී තිබේ.

2. හඳුනා නොගත්, හේතු කාරක අක්ෂි රෝගවල අවදානම අඩුකිරීම සඳහා එක් ඇසක් සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් 0.7 අගයක් නිර්දේශ කරනු ලැබේ.

3. Commission International De L' Eclairage (CIE-143-2001, පසු සංස්කරණ ඇතුලුව)විසින් පළ කරනු ලැබූ, ප්‍රවාහනය සඳහා වූ වර්ණ දෘෂ්ඨී නියමයන් පිළිබඳ ජාත්‍යන්තර නිර්දේශවල නිර්වචනය කොට ඇති පරිදි

4. මූලික පරීක්ෂණවල සොයාගැනීම් මගින් පෙන්නුම් කරනු ලබන අවස්ථාවන්හිදී, සායනික දෘෂ්ඨ විශේෂඥවරයකු විසින් කරනු ලබන ඇගැයීමකට යටත්ව

5. ඇංජින් අංශ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට යටත් පිරිසෙයින් 0.4ක එකතු ඇස් පෙනීමේ දෘෂ්ඨියක් තිබිය යුතුය.

6. CIE වර්ණ දෘෂ්ඨී ප්‍රමිති 1 හෝ 2

7. CIE වර්ණ දෘෂ්ඨී ප්‍රමිති 1, 2 හෝ 3

ආ-1-9 වගුව

**මුහුදු යාත්‍රාකරුවන් සඳහා වූ අවම සේවාස්ථ ශාරීරික හැකියාව ඇගයීම** [3]

| නෞකාස්ථ කාර්ය, කර්තව්‍ය, සිද්ධිය හෝ තත්ත්වය [3] | අදාළ ශාරීරික හැකියාව | අපේක්ෂකයා සම්බන්ධයෙන් පහත දක්වා ඇති දේ පිළිබඳව වෛද්‍ය පරීක්ෂකවරයා සෑහීමට පත් විය යුතුය |
| --- | --- | --- |
| නෞකාව වටා චර්යා රටාව ඃ-<br>සසල වන නැව් තට්ටුව වටා<br>-තල අතර<br>-කුටි අතර<br><br>මේ පේළියට 1 වන සටහන අදාළ වේ. | සමබරතාව පවත්වා ගනිමින් කඩිසර ලෙස ගමන් කිරීම.<br><br>සිරස් හිනිමංවල සහ තරප්පු පේළියෙහි ඉහළට සහ පහළට ගමන් කිරීම ගැටිවලට ඉහළින් අඩිය තැබීම. (උදා ඃ මි. මි. 600 උසැති)<br><br>දිය ඇවුරුං දොරවල් විවෘත කිරීම සහ වැසීම. | සමබරතා සංවේදීතාව පිළිබඳව බාධා නොමැති අදාළ සංචලන සහ ශාරීරික ක්‍රියාකාරකම් වළක්වන ශාරීරික දුබලතාවක් හෝ රෝගයක් නොමැති සහායක් නොමැතිව ඃ1[5]<br><br>-සිරස් හිනිමං හෝ තරප්පු පේළි නැගීමට හැකිද?<br><br>-දොරවල් වැසීමේ පද්ධති ක්‍රියාකරවීමට හැකිද?<br><br>-උස් පඩිවලට ඉහළින් අඩිය තැබීමට හැකිද? |
| නෞකාස්ථ චර්යා රටාවට අදාළ කාර්ය ඃ-<br>-අත් මෙවලම් භාවිතය.<br>-නැවේ ගබඩා එහා මෙහා කිරීම<br>-ඉහළ (තට්ටුවේ) ඇති වැඩ කිරීම.<br>-කපාට (වැල්ව) ක්‍රියාකරවීම.<br>-පැය හතරක මුර සේවය දැරීම.<br>-සීමිත අවකාශවල වැඩ කිරීම.<br>-හදිසි සංඥා, අනතුරු ඇඟවීම් සහ උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීම.<br>-වාචික සන්නිවේදනය. | යාන්ත්‍රික උපක්‍රම ක්‍රියා කරවීමට අවශ්‍ය ශක්තිය, බුහුටි භාවය සහ දරාගැනීමේ හැකියාව. බරක් ඉස්සීම, තල්ලු කිරීම සහ රැගෙන යාම. (උදාඃ කි. ග්‍රෑ. 18)<br><br>දීර්ඝ කරන ලද කාල වේලාවක් සඳහා ඉහළට ළගාවීම, සිටගෙන සිටීම, ඇවිදීම සහ අවධානයෙන් සිටීම.<br><br>ඇවුරු සීමිත අවකාශ තුළ වැඩ කිරීම සහ සීමිත විවර තුළින් | නෞකාව නිරුපද්‍රිතව මෙහෙයවීම සඳහා අවශ්‍ය වූ චර්යා රටා දුබල කරන පැහැදිලි දුබලතාවක් හෝ විනිශ්චය කරනු ලැබූ වෛද්‍යමය තත්ත්වයන් හෝ නොමැත.<br><br>පහත දක්වා ඇති දේ කිරීමේ හැකියාව තිබේ ඃ<br><br>-අත් ඔසවාගෙන සිටිමින් වැඩ කිරීමේ හැකියාව<br><br>-දීර්ඝ කරනු ලබන කාලයක් තුළ සිටගෙන සිටීම හා ඇවිදීම |

| | | |
|---|---|---|
| මේ පේළියට 1 වන සටහන අදාළ වේ. | එහා මෙහා යාම (මි. මි. 600xමි. මි. 600),<br><br>දෘෂ්ටි උපයෝගී කොට වස්තූන්, හැඩතල සහ සංඥා වෙන්කොට හඳුනාගැනීම.<br><br>අනතුරු ඇඟවීම් සහ උපදෙස් ශ්‍රවණය කිරීම් පැහැදිලි වාචික විස්තර සැපයීම. | -ඇවුරු අවකාශයන්ට ඇතුළු වීම<br><br>-ඇස් පෙනීමේ මට්ටම සපුරාලීම (A-1/9 වගුව)<br><br>-නිසි බලධරයා විසින් දක්වනු ලබන ශ්‍රවණ මට්ටම සපුරාලීම හෝ ජාත්‍යන්තර මාර්ගෝපදේශ සැලකිල්ලට ගැනීම<br><br>-සාමාන්‍ය කතා බහ පවත්වා ගෙන යාමේ හැකියාව |
| නෞකස්ථ හදිසි කාර්ය [6]<br>- පළා යාම<br>- ගිනි නිවාරණය<br>- හිස් කිරීම<br><br>මේ පේළියට 2 වන සටහන අදාළ වේ. | ජීවිතාරක්ෂක ජැකෙට්ටුවක් හෝ ඉමර්ෂන් ඇඳුම් කට්ටලයක් පැළිදීම.<br><br>දුම්පිරුණු අවකාශ වලින් පළා යාම.<br><br>ගිනි නිවාරණ කාර්ය වලට සහභාගිවීම (ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ විශේෂ උපකරණ භාවිතය ඇතුළුව)<br><br>නෞකාව හිස් කිරීමට සහභාගී වීම. | නෞකාව නිරුපද්‍රිතව මෙහෙයවීම සඳහා අත්‍යාවශ්‍ය වූ හදිසි කාර්ය ඉටු කිරීමේ හැකියාව අඩු කරන පැහැදිලි දුබලතාවක් හෝ විනිශ්චය කරනු ලැබූ වෛද්‍යමය තත්වයක් හෝ නොමැත.<br><br>පහත දැක්වෙන දේ කිරීමේ හැකියව තිබේ :<br>-ජීවිතාරක්ෂක ජැකෙට්ටුවක් හෝ ඉමර්ෂන් ඇඳුම් කට්ටිලයක් පැළඳීම.<br>-බඩ ගෑම.<br>-උෂ්ණත්වයේ වෙනස්කම් දැනීම<br>-ගිනිනිවාරණ උපකරණ භාවිත කිරීම.<br>-ආශ්වාස ප්‍රශ්වාස කිරිමේ විශේෂ උපකරණ හැඳගැනීම.<br>(රාජකාරියේ කොටසක් වශයෙන් අවශ්‍ය වූ විට). |

සටහන් :

1. ඉහත වගුවේ දක්වා ඇති 1 වන සහ 2 වන පේළි -

    (අ) සාමාන්‍ය නෞකාස්ථ කාර්ය, කර්තව්‍ය, සිද්ධි සහ තත්ත්වයන් ද,

    (ආ) මුහුදු යාත්‍රාකරුවකුගේ, වෙනත් නාවික සේවක මඩුලු සාමාජිකයන්ගේ සහ නෞකාවේ නිරුපද්‍රිතතාව සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය හැකි අනුරූපී ශාරීරික හැකියා ; සහ

    (ඇ) මුහුදු යාත්‍රාකරුවන්ගේ විවිධ කාර්ය ද, ඔවුන් සේවයේ නියුක්ත කරනු ලන්නේ යම් නෞකාස්ථ වැඩ සඳහා ද එකී වැඩ වල ස්වභාවය ද සිත්හි තබාගෙන, වෛද්‍යමය යෝග්‍යතාව ඇගයීමට පාත්‍ර කරන අනුමත වෛද්‍ය වෘත්තිකයන් විසින් භාවිත කරනු ලබන උසස් මට්ටමේ උපමාන විස්තර කරයි.

2. ඉහත වගුවේ දක්වා ඇති 3 වන පේළිය -

    (අ) සාමාන්‍ය නෞකාස්ථ කාර්ය, කර්තව්‍ය, සිද්ධි සහ තත්ත්වයන් ද,

(ආ) මුහුදු යාත්‍රාකරුවකුගේ, වෙනත් නාවික සේවක මඩුලු සාමාජිකයන්ගේ සහ නෞකාවේ නිරුපද්‍රිතතාව සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අනුරූපී ශාරීරික හැකියා ; සහ

(ඇ) මුහුදු යාත්‍රාකරුවන්ගේ විවිධ කාර්ය ද, ඔවුන් සේවයේ නියුක්ත කරනු ලබන්නේ යම් නෞකාස්ථ වැඩ සඳහා ද එකී වැඩ වල ස්වභාවය ද සිත්හි තබාගෙන වෛද්‍යමය යෝග්‍යතාව ඇගයීමට පාත්‍ර කරන අනුමත වෛද්‍ය වෘත්තිකයන් විසින් භාවිත කරනු ලබන උසස් මට්ටමේ උපමාන විස්තර කරයි.

3. මේ වගුව මගින් ඇති විය හැකි සියලු නෞකාස්ථ තත්ත්වයන් හෝ විභව්‍ය වශයෙන් නුසුදුසු කරවන වෛද්‍යමය තත්ත්වයන් හෝ ගැන යොමු වීමට අදහස් නොකෙරේ. මුහුදු යාත්‍රාකරුවන්ගේ කාණ්ඩ, (නැව් තට්ටු නිලධරයන් සහ ඇන්ජින් කාමර සේවයේ නියුතු නිල නොලත් නැවියන් වැනි)වලට අදාළ ශාරීරික හැකියාවන් සම්බන්ධයෙන්, අනුමත වෛද්‍ය වෘත්තිකයන් තම වෘත්තීමය විචාර බුද්ධිය භාවිතා කළ යුතුය.

4. සැකයක් ඇති වූ විට වෛද්‍ය වෘත්තිකයා විසින් යම් අදාළ දුබලතාවයේ ප්‍රමාණය හෝ බරපතලකම යම් පවත්නා උචිත පරීක්ෂණ මගින් හෝ අපේක්ෂකයා වැඩි දුර ඇගැයීමට යොමු කිරීම මගින් ප්‍රමාණ කළ යුතුය.

5. "සහාය" යන පදයෙන් කාර්ය ඉටු කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු භාවිත කිරීම අදහස්වේ.

6. "හදිසි කාර්ය" යන පදය, නැව අතහැර යාම හෝ ගිනි නිවාරණයෙහි නිරත වීම වැනි සම්මත හදිසි ප්‍රතිචාර අවස්ථා මෙන්ම තම පුද්ගලික බේරීම සාක්ෂාත් කර ගැනීම පිණිස එක් එක් මුහුදු යාත්‍රාකරු විසින් අනුගමනය කළ යුතු පටිපාටිද ආවරණය කිරීම සඳහා භාවිත කරනු ලැබේ.

එල්.ඩී.බී 3/2013-II.

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 වන සහ 321 වන වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

වර්ෂ 2013 ක් වූ ජූලි මස 1 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2013 වෙළඳ නැව් (ආරක්ෂක පිරිස් යෙදවීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජූලි මස 01 වන දින සිට බලාත්මක විය යුතුය.

2. (i) 1998 ජූලි මස 17 වන දින අංක 1036/21 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1998 වෙළඳ නැව් (ආරක්ෂක පිරිස් යෙදවීමේ) නියෝග, 2013 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

(ii) ඉහත විධිවිධානවල කුමක් සඳහන් වුවද 1998 වෙළඳ නැව් (ආරක්ෂක පිරිස් යෙදවීමේ) නියෝග යටතේ නිකුත් කරනු ලැබූ ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛන මේ නියෝගවල විධිවිධානවලට යටත්ව 2016 දෙසැම්බර් 31 දින තෙක් වලංගුව පැවතිය යුතුය.

අර්ථ කථන :

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නියෝගවල ;

**'පනත'** යන්නෙන් 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත අදහස් වේ

**'ප්‍රවීනතා සහතිකය'** යන්නෙන්, 2013 වෙළඳ නැව් පුහුණුව, සහතික කිරීමේ සහ මුරකාවල් යෙදීමේ නියෝග යටතේ ප්‍රදානය කරන ලද අධිකාරි පත්‍රයක් අදහස් වේ

**'ප්‍රධාන ඉංජිනේරු නිලධාරියා'** යන්නෙන්, නෞකාවේ යාන්ත්‍රික ප්‍රචලනය සහ එහි යාන්ත්‍රික හා විදුලි සවි කිරීම් ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම පිළිබඳව වගකිව යුතු ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධරයා අදහස් වේ

**'ප්‍රධාන උප නැව්පති '** යන්නෙන්, නිලයෙන් නෞකාධිපතිවරයාට සමීපතම පහළ නිලය දරන්නා වූද නෞකාධිපතිවරයාගේ අශක්නුතාවයකදී නෞකාවේ අණ දීම, පාලනය සහ එහි කාර්ය භාරය පැවරෙන්නා වූද නැව් තට්ටු නිලධරයා අදහස් වේ

**'සමාගම'** යන්නෙන්, නෞකාවේ අයිතිකරු හෝ, අයිතිකරුගෙන් නෞකාව මෙහෙයවීමේ වගකීම පවරාගනු ලැබුවා වූ ද, එසේ වගකීම පවරා ගැනීමෙන් පසුව මේ නියෝග මගින් සමාගම වෙත නියම කරනු ලැබ ඇති සියලු කාර්යය සහ වගකීම් භාරගැනීමට එකඟ වී ඇත්තා වූද, කළමනාකරුවකු හෝ ආවරණ රහිත බෝට්ටු කුලියට දෙන තැනැත්තකු හෝ වැනි වෙනත් සංවිධානයක් නැතහොත් තැනැත්තෙක් අදහස් වේ

**'නැව් තට්ටු නිලධරයා'** යන්නෙන්, 2010 වර්ෂයේ සංශෝධනය කර ඇති පරිදි වූ, STCW ව්‍යවස්ථා සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව සුදුසුකම් ලද යාත්‍රාකරණ නිලධරයකු අදහස් වේ

**'අධ්‍යක්‍ෂ ජනරාල්වරයා'** යන්නෙන් වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ

**'ඉංජිනේරු නිලධරයා'** යන්නෙන්, 2010 වර්ෂයේ සංශෝධනය කර ඇති STCW ව්‍යවස්ථා සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව සුදුසුකම් ලද නිලධරයකු අදහස් වේ

**'EWKO'** යන්නෙන්, ඉංජිනේරු මුරකාවල්හි නියුතු නිලධරයන් අදහස් වේ

**'GT '** යන්නෙන්, දළ ටොන් ප්‍රමාණය අදහස් වේ

**'නෞකාධිපති '** යන්නෙන්, නෞකාවක අණ දීම සහ පාලනය භාරව සිටින තැනැත්තා අදහස් වේ;

**'වෙරළාසන්න මුහුදු ගමන් '** (NCV) යන්නෙන්, පරිපාලනය විසින් තීරණය කරනු ලබන පරිදි මුහුදු ගමන් වලදී ආරක්ෂිත නැව් තොටවල සමීපත්වය සම්බන්ධයෙන් විශේෂිතව සඳහන් කොට දැක්වීමට යටත්ව බංගලාදේශය, ඉන්දියාව, මාලදිවයින, මියන්මාර් සහ ශ්‍රී ලංකාව යන රටවල යම් වරායක හෝ ස්ථානයක සිට එකී රටවල වෙනත් යම් වරායකට හෝ ස්ථානයකට මුහුදුබඩ වෙළඳාමේ යෙදී සිටින නෞකාවල මුහුදු ගමන් අදහස් වේ ;

**'NWKO'** යන්නෙන්, යාත්‍රා කරන මුරකාවලෙහි නියුතු නිලධරයන් අදහස් වේ;

**'නිලධරයා'** යන්නෙන්, ජාතික නීතිය හෝ නියෝග මගින් නම් කරනු ලබන්නා වූ ද එසේ නම්කර නොමැති අවස්ථාවක දී සාමූහික එකඟත්වය හෝ සිරිත් අනුව නම් කරනු ලබන්නාවූද, නෞකාධිපති හැර, නාවික පිරිසේ සාමාජිකයෙකු අදහස් වේ ;

**'ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරු'** යන්නෙන්, ගුවන් විදුලි නියෝගවල විධිවිධාන යටතේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලබන උචිත සහතිකයක් දරන නාවික පිරිසේ සාමාජිකයෙකු අදහස් වේ.

**'නිල නොලත් නාවිකයකු '** යන්නෙන්, නෞකාධිපති හෝ නිලධරයකු හෝ නොවන, නෞකාවේ නාවික පිරිසේ යම් සාමාජිකයෙකු අදහස් වේ

**'ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනය'** යන්නෙන්, ශ්‍රී ලංකා නෞකාවක් සම්බන්ධයෙන් වූ විට වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ විස්තර කරනු ලැබූ හා නිකුත් කරනු ලැබුවා වූ ද, වෙනත් යම් නෞකාවක් සම්බන්ධයෙන් වූ විට එකී නෞකාවෙහි ප්‍රදර්ශනය කරනු ලැබීමට අයිතිය ඇත්තේ කවර ධජයක් ද එකී ධජය අයත් රාජ්‍යයේ ආණ්ඩුව විසින් හෝ ඒ වෙනුවෙන් විස්තර කරනු ලැබූ හා නිකුත් කරනු ලැබුවා වූද ලේඛනයක් අදහස් වේ

**'මුහුදු ගමන් නෞකාව'** යන්නෙන්, රට අභ්‍යන්තර ජලාශයන්ට සීමාවී හෝ ආරක්ෂිත ජලාශ හෝ වරාය නියෝග අදාළවන ප්‍රදේශ ඇතුළත හෝ ඒවාට තදාසන්නවූ ජලාශවලට සීමාවී යාත්‍රාකරණයේ යෙදෙන නෞකා නොවන්නා වූ වෙනත් වාණිජ නෞකා අදහස් වේ

**'දෙවන ඉංජිනේරු නිලධරයා'** යන්නෙන්, නිලයෙන් ප්‍රධාන ඉංජිනේරු නිලධරයාට ආසන්නතම පහළ නිලය දරන සහ ප්‍රධාන ඉංජිනේරු නිලධරයාගේ යම් අශක්නුතාවයක දී නෞකාවේ යාන්ත්‍රික ප්‍රචලනය සහ යාන්ත්‍රික සහ විදුලි සවි කිරීම පිළිබඳ ක්‍රියාකාරිත්වය හා නඩත්තුව සම්බන්ධයෙන් වගකීම පැවරෙන ඉංජිනේරු නිලධරයා අදහස් වේ.

*අදාළ කිරීම ;*

4. කවර තැනෙක හෝ ඇත්තා වූ ශ්‍රී ලංකා ධජය යටතේ ලියාපදිංචි කරන ලද මුහුදේ යාත්‍රාකරන නෞකා සියල්ල සම්බන්ධයෙන් ද ධීවර යාත්‍රා සහ වෙළඳාමේ නොයෙදෙන විනෝද යාත්‍රා හැර, ශ්‍රී ලංකා ජලාශ මත ඇති මුහුදේ යාත්‍රාකරන වෙනත් යාත්‍රා සම්බන්ධයෙන් ද මේ නියෝග අදාළ විය යුතුය.

*ආරක්ෂිත පිරිස් යෙදවීමේ ලේඛනය*

5. සෑම නෞකාවක් සම්බන්ධයෙන්ම -

(අ) නෞකාවට හා එහි පිරිස් යෙදවීමට අදාළ වූ ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයක් බලාත්මකව පවතින බවටද ;

(අ) යටත් පිරිසෙයින් නියමිත මට්ටම් වලට සියළු අවස්ථාවන්හි දීම නියමිත පිරිස් යෙදවීමට ; සහ

(ඇ) ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනය සියළු අවස්ථාවන්හි නෞකාවෙහි තබා ගැනීමට සහ එය බලය ලත් අයකු විසින් පරීක්ෂා කොට බැලීමට හැකි අයුරින් තැබීමට ද වග බලා ගැනීම සමාගමේ කාර්ය වන්නේය.

6. මේ නියෝග අදාළ වන්නා වූ යම් නෞකාවක නෞකාධිපතිවරයා විසින්, නැවෙහි වලංගු ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයත් නෞකාස්ථව ඇත්නම් මිස සහ අදාළ පිරිස් යෙදවීම ලේඛනයට අනුකූලව පිරිස් යොදවා ඇත්නම් ද මිස එය සයුරේ දියත් නොකරන බවට වග බලා ගත යුතුය.

7. ශ්‍රී ලාංකික නෞකාවක් සම්බන්ධයෙන් ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයක් සඳහා ඉල්ලුම් කරන සමාගමක් විසින් පහත දක්වා ඇති දේ සැලකිල්ලට ගනිමින් යෝජනාවක්, වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය -

(අ) මේ නියෝගවල I වන සහ II වන උපලේඛන වල දක්වා ඇති පිරිස් යෙදවීමේ පරිමාණ ;

(ආ) වෙළඳ කටයුත්ත සහ කවර වර්ගයක මෙහෙයුමක් අවශ්‍යද යන බව ඇතුළත්, එහෙත් ඊට සීමා නොවූ, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ නිර්දේශ ;

(ඇ) මෙහෙයුම් ස්වභාවය ;

(ඈ) නෞකාවේ වර්ගය හා විශාලත්වය ඇතුළත් තාක්ෂණික ලක්ෂණ.

(ඉ) නාවික පිරිසේ සමස්ත කාර්ය භාරයේ ප්‍රමාණය සහ සිදුවිය හැකි හදිසි අවස්ථා තත්ත්වයන්.

8. ආරක්ෂක පිරස් යෙදවීමේ ලේඛනය නිකුත් කිරීමට පෙර වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයාට වැඩිමනත් තොරතුරු අවශ්‍ය කරනු ලැබිය හැකි අතර, එකී තොරතුරු සලකා බැලීමෙන් අනතුරුව, ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනය නිකුත් කිරීමට ඔහු විසින් කටයුතු සලස්වනු ලැබිය හැකිය.

9. ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනය නිකුත් කිරීමෙන් පසුව, දැනුම් දෙන ලද යම් වැදගත් තොරතුරක් වෙනස් වූ විට හා එමගින් පිරිස් යෙදවීමේ පරිමාණයට යම් බලපෑමක් වේ නම්, වහාම ඒ පිළිබඳව වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දීම සමාගමේ කාර්යය වන්නේය. එවැනි අවස්ථාවලදී ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයක වලංගුතාවය නොකඩවා පවත්වා ගැනීම සඳහා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අළුත් යෝජනාවක් ඉල්ලා සිටිය හැකිය.

10. ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයක සඳහන් පිරිස් යෙදවීමේ පරිමාණය අවශ්‍ය මුරකාවල් යෙදීමේ ප්‍රමිති පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කරන අවම ප්‍රමාණය විය යුතුය. තවද, සේවක පිරිසට, 2013 වෙළඳ නැව් (පුහුණුව, සහතික කිරීම හා මුරකාවල් යෙදීමේ) නියෝගවල සඳහන් අනිවාර්ය අවම විවේකී පැය ගණන ලබා ගැනීමට හැකි විය යුතුය.

11. ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයක සඳහන් පිරිස් යෙදවීමේ පරිමාණ, සමාගමක වාණිජ අවශ්‍යතාවලදී හෝ අධික පැවරුම් වැඩවලදී සැලකිල්ලට නොගත යුතුය.

12. නෞකාවලට ආරක්ෂාකාරී ලෙස, ප්‍රමාණවත් ලෙස සහ කාර්යක්ෂම ලෙස පිරිස් යෙදවීමේ වගකීම සමාගම වෙත පැවරෙන්නේය.

13. අදාළආරක්ෂාකාරී ලෙස පිරිස් යෙදවීමේ ලේඛන වලට අනුකූලව, නෞකාවලට විධිමත් ලෙස සහතිකලත් නෞකාධිපතිවරුන්, නිලධරයන් සහ නිල නොලත් නැවියන් යොදවන බවට, සමාගම වග බලා ගත යුතුය.

*නිදහස් කිරීම*

14. වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, තමන් විසින් නිශ්චය කරනු ලබන යම් නියමයන් මත, ඒ ඒ විෂයය පදනම් කොට ගෙන, මේ නියෝග වල සියළු විධිවිධාන වලින් හෝ යම් විධිවිධානයකින් නිදහස් වීම ප්‍රදානය කරනු ලැබිය හැකිය.

*දණ්ඩන*

15. (1) මේ නියෝග අදාළ වන නෞකාවක, මේ නියෝගවල විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කරන යම් අයිතිකරුවකු සහ/හෝ කළමනාකරුවකු වරදකට වරදකරු වන අතර නෛතික අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු 2 කට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

(2) මේ නියෝග අදාළ වන නෞකාවක, මේ නියෝගවල විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කරන යම් නෞකාධිපතිවරයෙකු වරදකට වරදකරු වන අතර, නෛතික අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු 1 කට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

*රඳවා ගැනීමේ බලතල*

16. (අ) ශ්‍රී ලාංකික නෞකාවකට අදාළව, මේ නියෝග වල යම් කඩ කිරීමක් සිදු කරනු ලැබුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලාංකික නෞකාවක් නොවන නෞකාවකට අදාළව, 4 වන නියෝගයේ යම් කඩ කිරීමක් සිදු කරනු ලැබුවහොත්

ඒ නෞකාව රඳවා ගනු ලැබිය හැකි අතර 1971 අංක 52 දරණ වෙළඳ නැව් පනතේ 207 සහ 208 වන වගන්ති ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

I වැනි උපලේඛනය

***පිරිස් යෙදවීමේ පරිමාණ - නැව් තට්ටු නිලධරයන්***

*වෙළඳ ප්‍රදේශය හා නෞකා විස්තරය*

| | සීමාරහිත * දළ ටොන් ප්‍රමාණය 3000 හෝ ඊට වැඩි | සීමාරහිත * දළ ටොන් ප්‍රමාණය 500-3000 හෝ්ඊට වැඩි | සීමාරහිත * දළ ටොන් ප්‍රමාණය 500 අඩු | එන්. සී. වී. දළ ටොන් ප්‍රමාණය 3000 හෝ ඊට වැඩි | එන්. සී. ටී. දළ ටොන් ප්‍රමාණය 500-3000 දක්වා | එන්. සී. ටී. දළ ටොන් ප්‍රමාණය 500ට අඩු |
|---|---|---|---|---|---|---|
| නෞකාධිපති | 1 | 1 | 1 | 1 | - | - |
| ප්‍රධාන උප නෞකාධිපති | 1 | 1 | - | 1 | - | - |
| එන්. ඩබ්. කේ. ඕ. | 2 | 1 | 2 | 1 | - | - |
| නෞකාධිපති දළ ටොන් 3000 ට අඩු එන්. සී. වී. | - | - | - | - | 1 | - |
| ප්‍රධාන උප නෞකාධිපති දළ ටොන් 3000 ට අඩු එන්. සී. වී | - | - | - | - | 1 | - |
| එන්. ඩබ්. කේ. ඕ දළ ටොන් 3000ට අඩු එන්. සී. වී. | - | - | - | - | 1 | - |
| නෞකාධිපති දළ ටොන් 500ට අඩු එන්. සී. වී | - | - | - | - | - | 1 |
| එන්. ඩබ්. කේ. ඕ. දළ ටොන් 500ට අඩු එන්. සී. වී. | - | - | - | - | - | 1 |

*සීමාරහිත යන්නෙන් සීමාරහිත වෙළඳ ප්‍රදේශ අදහස් වේ.

II වැනි උපලේඛනය

***පිරිස් යෙදවීමේ පරිමාණ - ඉංජිනේරු නිලධරයන්***

*වෙළඳ ප්‍රදේශය හා නෞකා විස්තරය*

| | සීමාරහිත * කේ. ඩබ්. 3000 හෝ ඊට වැඩි | සීමාරහිත * කේ. ඩබ්. 750-3000 දක්වා | සීමාරහිත * කේ. ඩබ්. 250-750 දක්වා | එන්. සී. වී. කේ. ඩබ්. 3000 හෝ ඊට වැඩි | එන්. සී. ටී. කේ. ඩබ්. 750-3000 දක්වා | එන්. සී. ටී. කේ. ඩබ්. 250-750 දක්වා |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු නිලධරයා | 1 | 1 | - | 1 | - | - |
| දෙවැනි ඉංජිනේරු නිලධරයා | 1 | 1 | 1 | 1 | - | - |
| ඉංජිනේරු මුරකාවල් නිලධරයා | 2 | 1 | 1 | 1 | - | - |
| ප්‍රධාන ඉංජිනේරු නිලධරයා එන්. සී. වී. | - | - | - | - | 1 | - |
| දෙවැනි ඉංජිනේරු නිලධරයා එන්. සී. වී | - | - | - | - | 1 | 1 |
| ඉංජිනේරු මුරකාවල් නිලධරයා | - | - | - | - | 1 | 1 |

*සීමාරහිත යන්නෙන් සීමාරහිත වෙළඳ ප්‍රදේශ අදහස් වේ.

08-39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.